

# 2012
# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
ஊழியர் நம்பிக்கை பொறுப்பு நிதியச் சபை
**EMPLOYEES' TRUST FUND BOARD**

# වාර්ෂික වාර්තාව
# 2012

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය**
පළමු මහල, කම්කරු මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 807, කොළඹ 5.

# ඇතුළත පිටු


| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලය | 05 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | 07 |
| අපගේ දැක්ම, මෙහෙවර සහ සාරධර්ම | 09 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව | 13 |
| විගණන වාර්තාව 2012 | 23 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 27 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය | 29 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 30 |
| ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය | 31 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා සටහන් | 32 |
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා සටහන් | 37 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 44 |
| විගණකාධිපති වාර්තාව | 59 |
| විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මණ්ඩලයේ පැහැදිලි කිරීම් | 72 |
| සංඛ්‍යාණමය ඇමුණුම් | 72 |



# අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්

## 2012 දෙසැම්බර් මස 31 දිනට

2012 වසර අවසානයේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

**කේ. එම්. ඒ. ගොඩවත්ත මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි
ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කළ නියෝජිත

**ජී. තිස්සකුට්ටිආරච්චි මහතා**
ක්‍රියාකාරි අධ්‍යක්ෂ
ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කළ නියෝජිත

**පී. ඒ. එස්. පණ්ඩිතරත්න මහතා**
අධ්‍යක්ෂ
ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කළ නියෝජිත

**යූ. එස්. අබේරත්න මහතා**
අධ්‍යක්ෂ
ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කළ නියෝජිත

**පී. ඒ. අබේසේකර මහතා**
අධ්‍යක්ෂ
මහා භාණ්ඩාගාර නියෝජිත

**ජී. එල්. ඩී. දහනායක මිය**
අධ්‍යක්ෂ
ගරු වෙළෙඳ අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත

**සී. එල්. කේ. පී. ජයසූරිය මහතා**
අධ්‍යක්ෂ
ලංකා හාම්පුතුන්ගේ සංගමය විසින් පත්කල නියෝජිත

**රංජිත් හෙට්ටිආරච්චි මහතා**
අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

**දීපා වීරසූරිය  මහත්මිය**
මණ්ඩලීය ලේකම්



# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

## 2012 දෙසැම්බර් මස 31 දිනට

2012 වර්ෂය අවසානයේදී මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය පහත සඳහන් පරිදි විය.

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරි**
කේ. එම්. ඒ. ගොඩවත්ත මහතා

**ක්‍රියාකාරි අධ්‍යක්ෂ**
ජී. තිස්සකුට්ටිආරච්චි මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරි**
එම්. සී. එච්. ගුණරත්න මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්**

| | |
|---|---|
| ආර්. එන් ඥානසේකර මිය | (ආයෝජන) |
| ජේ. එම්. එස්. බී. උඩුගම මහතා | (දායක මුදල් රැස්කිරීම් හා සේවා යෝජක සබඳතා) |
| ඩබ්ලිව්. එස්. දිසානායක මහතා | (සාමාජික සේවා) |
| එල්. එච් නිහාල් මහතා | (පරිපාලන හා මානව සම්පත්) |
| කේ. එස්. වැලිවිට මහතා | (අභ්‍යන්තර විගණන) |
| එන්. ඩබ්ලිව්. විමලවීර මහතා | (මුදල්) |

**සහකාර සාමාන්‍යාධිකාරිවරුන්**

| | |
|---|---|
| සී. මල්ලිකාරච්චි මහතා | (සාමාජික ගිණුම්) |
| එච්. එම්. සෙනෙවිරත්න මහතා | (සාමාජික සේවා) |
| ඩබ්ලිව්. සූරියආරච්චි මහතා | (ක්‍රියාත්මක කිරීමේ I කලාපය) |
| ඒ.ජේ.එම්.එස්. ජයසුන්දර මහතා | (ක්‍රියාත්මක කිරීමේ II කලාපය) |
| එම්. එස්. දිසානායක මහතා | (ක්‍රියාත්මක කිරීම්/ස්වයංරැකියා) |

## අපගේ දැක්ම

ආයතනික විශිෂ්ඨත්වය තුළින්
සමස්ථ පාර්ශවකරුවන් සඳහා වූ ක්‍රියාශීලි හා
ස්ථාවර ප්‍රමුඛ භාරයක් බවට පත්වීම.

## අපගේ මෙහෙවර

සාමාජිකයන් සඳහා පුළුල් පරාසයක වූ මූල්‍ය ප්‍රතිලාභ හා
විශිෂ්ඨ සේවාවක් සලසන සුහදශීලි හා
විචක්ෂණශීලී භාරයක් වීම.

## අපගේ සාරධර්ම

- ☑ විශ්වාසය
- ☑ අවංකභාවය සහ සම්පූර්ණත්වය
- ☑ වගකීම
- ☑ තිළිණ සහ පිළිගැනීම්
- ☑ කණ්ඩායම් හැඟීම
- ☑ සංග්‍රහශීලි බව
- ☑ ඇප කැප වීම
- ☑ ප්‍රතිචාර්යතාව
- ☑ නිර්මාණශීලීභාවය සහ නව්‍යකරණය

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව 2012

# 2012 වර්ෂයේ
# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2012 වාර්ෂික වාර්තාව සහ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ස්වකීය සාමාජිකයින් වෙත මෙසේ සතුටින් ඉදිරිපත් කර සිටී.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයක් වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ ස්ථාපිත කරන ලද අතර, එහි මෙහෙයුම් කටයුතු 1981 මාර්තු මස 01 වන දින ආරම්භ කරන ලදී. මෙම ආයතනය එහි 32 වන සේවා වසර ද සම්පූර්ණ කර ඇති බව සාමාජිකයන්ට මෙන්ම සේවායෝජකයන් වෙත ද දන්වා සිටින්නේ ඉමහත් සාඩම්බරයෙනි.

## වසර තුළ ලබාගත් විශිෂ්ට ප්‍රගතිය

2012 වසර තුළ මණ්ඩලය විසින් ක්ෂේත්‍ර ගණනාවකින් අත්පත්කර ගන්නා ලද විශිෂ්ඨ ප්‍රගතිය අතුරින් කිහිපයක් පහත දැක්වේ.

1. සේවා යෝජකයින්ගෙන් රැස්කර ගත් දායක මුදල රුපියල් බිලියන 12.75 ක්වූ අතර, එය 2011 වසරට වඩා රුපියල් බිලියන 1.66 ක වර්ධනයකි.

2. මණ්ඩලය විසින් 2011 වසරේ දී උපයන ලද ආයෝජන ආදායම වන රුපියල් බිලියන 12.3 ට සාපේක්‍ෂව මෙම වසරේ දී රුපියල් බිලියන 13.2 ක ආදායමක් ඉපයූ අතර, එය රුපියල් බිලියන 0.9 ක වැඩිවීමක් වූ අතර, වසර අවසානයේදී මුළු ආයෝජනවල වටිනාකම රුපියල් බිලියන 134 සිට රුපියල් බිලියන 150 ක් දක්වා වර්ධනය විය. වසර තුළ ස්ථාවර පොළී අනුපාතයන්ගේ අඩුවීම ආයෝජන ආදායම ආන්තික වශයෙන් වැඩිවීමට හේතුවිය.

3. පසුගිය වසරේ උපයන ලද ශුද්ධ ලාභය වන රුපියල් බිලියන 11.3 ට සාපේක්‍ෂව මෙම වසරේදී රුපියල් බිලියන 12.1 ක ශුද්ධ ලාභයක් උපයා ගැනීමට හැකිවූ අතර, වසර අවසානයේදී ලාභාංශ හා පොළී වශයෙන් රුපියල් බිලියන 13.9 ක් සාමාජිකයන් අතරේ බෙදා හැරීමට හැකිවිය.

4. වසර අවසානය වනවිට අරමුදලේ මුළු ශුද්ධ වත්කම් වටිනාකම රුපියල් බිලියන 158 ඉක්මවිය.

5. වසර මුළුල්ලේ අඛණ්ඩව පැවති කොටස් වෙළඳ පොළ අවපාතයන් හමුවේ 2011 වසරේදී ඉපයූ රුපියල් මිලියන 719 ක්වූ ස්කන්ධ මත ආදායම 2012 වසරේ දී රුපියල් මිලියන 333 ක් දක්වා පහත වැටිනි.

6. 2012 වසරේදී පොළී අනුපාතවල පහළ බැසීමක් පැවතියද, සාමාජිකයන් වෙත පොළී සහ ලාභාංශ වශයෙන් 10% ක් ප්‍රකාශ කිරීමට හැකිවිය. (ප්‍රස්ථාර අංක 01 සහ 02). මෙය බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන විසින් තම තැන්පත්කරුවන්ට ලබාදුන් පොළී අනුපාත වලට සාපේක්‍ෂව ආකර්ෂණීය අනුපාතයකි. එනෙකුදු වුවද, ලාභාංශ තුලන සංචිත අරමුදලෙහි රුපියල් බිලියන 01 ක මුදලක් ද ඉතිරි කරගත හැකි වුණි.

7. මෙහෙයුම් වියදම් එනම් සේවක වැටුප්, ඉන්ධන, විදුලිය, ජලය, තැපැල් ගාස්තු ආදියෙහි ඒකාකාරී වැඩිවීම හමුවේ සමස්ථ ආදායමේ ප්‍රතිශතයක් ලෙස 2011 වසරේ දී 5.6 ක්වූ මෙහෙයුම් වියදම් ප්‍රතිශතය මෙම වසරේදී 5.7 දක්වා වැඩිවිය. (ප්‍රස්ථාර අංක 03).

8. මෙම වසරේදී ශාඛා කාර්යාල ජාලය සාර්ථකව ක්‍රියාත්මක වූ අතර, හිඟ දායක මුදල් සහ අධිභාර අයකර ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමු කරන ලදී. ගම්පහ, නුවර සහ මාතර ශාඛා කාර්යාලවලට විමධ්‍යගත කරන ලද ප්‍රතිලාභ ගෙවීමේ වැඩ පිළිවෙළ ඉතා සාර්ථකව ක්‍රියාත්මක විය.

9. මෙයට අමතරව 2012 වසරේදී කුරුණෑගල කාර්යාලයෙහි ප්‍රතිලාභ ගෙවීමේ වැඩ පිළිවෙළ ආරම්භ කරන ලද අතර, 2013 වසරේදී රත්නපුර, බදුල්ල හා අනුරාධපුර කාර්යාලයන්හි මෙම වැඩ පිළිවෙළ ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

10. 2010 නොවැම්බර් මස යාපනය නගරයේ ස්ථාපිත කරන ලද නව ප්‍රාදේශීය කාර්යාලය 2012 වසර තුළ ඉතා උද්යෝගිමත් ප්‍රගතියක් පෙන්නුම් කරන ලද අතර, ඒ තුළින් සේවායෝජකයන්ගේ වර්ධනයක් සහ ප්‍රතිලාභ යෝජනාක්‍රම පිළිබඳව සාමාජිකයන්ගේ ඉහළ දැනුවත් වීමක් ද සිදු විය.

11. ඒකරාශි වී ඇති සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය මෙම වසරේදීද ඉතා සාර්ථකව ක්‍රියාත්මක වු අතර, එයින් 96%ක් පමණ නිම කිරීමට හැකිවිය. ව්‍යාකුල මට්ටමක පැවති ඉතිරි සාමාජික ගිණුම් ප්‍රමාණය ද මේ වන විට නිරවුල් කරමින් පවතී. එමෙන්ම 2011 වසර අවසානයේ සිටි සියළු සක්‍රීය සාමාජිකයිනට අදාළ වාර්ෂික ගිණුම් ශේෂ දන්වා යැවීමට කටයුතු සකසා ඇත.

12. මෙම වසරේදී ස්වයං රැකියාලාභින් සාමාජිකයන් වශයෙන් බඳවා ගැනීමේ වැඩ පිළිවෙලට ප්‍රමුඛතාවයක් දී කටයුතු කරන ලදී. ඒ අනුව, සමෘද්ධි බැංකු මගින් ණය පහසුකම් ලබාගෙන සුළු පරිමාණ ව්‍යාපාර ආරම්භ කළ ස්වයං රැකියා ලාභින් 30,000 ක් පමණ සාමාජිකයන් ලෙස බඳවා ගැනීමට හැකිවිය. සමෘද්ධි සාමාජිකයන්ට අමතරව කිරි ගොවීන්, ප්‍රාථමික පාසල් ගුරුවරියන්, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තාක්ෂණ ශිල්පීන්, කාර්මිකයන්, කලාකරුවන්, ත්‍රීරෝද රථ රියදුරන් ආදී ස්වයං රැකියා ලාභීන් 28,000 ක් පමණ සාමාජිකයන් ලෙස බඳවා ගැනීම සඳහා තවදුරටත් කටයුතු කරමින් සිටී.

13. මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රමුඛතාවයක් දී කටයුතු කල අතර, ඒ සඳහා පුහුණු වැඩ සටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය පවත්වා සේවක මණ්ඩලයේ නිපුණතා, ආකල්ප සහ දැනුම වර්ධනය කිරීමට කටයුතු කරන ලදී. එමෙන්ම වෘත්තීය සමිති සාමාජිකයන්ට ද අදාළ ක්ෂේත්‍ර වල විවිධ පුහුණු වැඩ සටහන් සඳහා අවස්ථාව සලසා දුනි.

14. කළමනාකාරිත්වය හා වෘත්තීය සමිති අතර කාර්මික සබඳතාව මෙම වසර තුළදීද අඛණ්ඩව සුහද මට්ටමකින් පවත්වා ගැනීමට හැකිවු අතර, මණ්ඩලීය ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්හි ලබාගත් විශිෂ්ඨ ප්‍රගතිය සඳහා එය ද පිටුවහලක් විය.

2012 වසර තුළ මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් පහත අයුරින් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබිණි.

## ප්‍රධාන කාර්යයන්

### දායක මුදල් රැස්කිරීම සහ සාමාජික ගිණුම් පවත්වාගෙන යෑම

සේවායෝජකයන්ගෙන් දායක මුදල් රැස්කිරීම සහ එම මුදල් කලට වේලාවට බැංකුගත කිරීම ආදායම් අංශයේ කාර්යභාරය වන අතර, සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම සහ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම සාමාජික ගිණුම් අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

සාමාජිකයන් සඳහා වඩාත් ඵලදායි සහ කඩිනම් සේවාවක් සැලසීමේ අභිලාෂයෙන් මණ්ඩලයට දායක මුදල් ගෙවනු ලබන සේවායෝජකයින් කාණ්ඩ 02 කට වර්ග කර ඇත. ඒ අනුව, සේවකයින් 15 කට අඩු සේවායෝජකයින් කුඩා කාණ්ඩය වශයෙන් ද, සේවකයින් 15 ට වැඩි සේවායෝජකයින් විශාල කාණ්ඩය වශයෙන් ද, වර්ගීකරණය කර ඇත.

2012 වසර තුළ නව සේවායෝජකයින් 3,951 දෙනෙක් අරමුදලට දායක මුදල් ගෙවීම ආරම්භ කල අතර, වසර අවසානය වන විට මුළු සේවායෝජකයින්ගේ සංඛ්‍යාව 70,194 ක් දක්වා වර්ධනය විය. ඒ අනුව 2011 වසරේදී ලැබුණු මුළු දායක මුදල වන රුපියල් බිලියන 11.09 ට සාපේක්ෂව 2012 වසරේදී ඔවුන්ගේ සේවකයින් වෙනුවෙන් ලැබු දායක මුදල රුපියල් බිලියන 12.75 කි. (ප්‍රස්ථාර අංක 04) මේ අතර, වසර ආරම්භයේදී රුපියල් බිලියන 135.5 ක්වු සාමාජික අරමුදල වසර අවසානයේදී රුපියල් බිලියන 153.6 ක් දක්වා වර්ධනය විය. (ප්‍රස්ථාර අංක 05)

## සාමාජික ප්‍රතිලාභ සහ සුභසාධන ප්‍රතිලාභ

සාමාජිකයින්ගේ දායක මුදල් ආපසු ලබාගැනීමේ අයදුම්පත් සහ ප්‍රතිලාභ අයදුම්පත් භාර ගැනීම, ඒවා කඩිනමින් නිම කිරීම සහ ගෙවීම් කිරීම ප්‍රතිලාභ අංශයේ කාර්යභාරය වේ.

එයට අමතරව සාමාජිකයන් වෙනුවෙන් දායක මුදල් නියමිත දිනයන්හි ප්‍රේෂණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සේවායෝජකයින් දැනුවත් කිරීම, අනිකුත් ප්‍රතිලාභ යෝජනා ක්‍රම සහ සාමාජික අයිතිවාසිකම් සම්බන්ධයෙන් සාමාජිකයින් සහ සේවායෝජකයින් දැනුවත් කිරීම සාමාජික සේවා කොට්ඨාශයේ කාර්යභාරය යටතට ගැනේ. විවිධ ආයතනවල වෘත්තීය සමිති, වෘත්තිකයන්ගේ සංවිධාන සහ මහජනතාවගේ ඉල්ලීම් මත එම කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩ සටහන් නිරතුරුව ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

2011 වර්ෂයේ ප්‍රතිලාභ අයදුම්කරුවන් 145,788 ක් වෙනුවෙන් ගෙවන ලද රුපියල් බිලියන 7.8 ට සාපේක්ෂව 2012 වසරේදී අයදුම්කරුවන් 146,876 ක් වෙනුවෙන් රුපියල් බිලියන 8.6 ක් ගෙවන ලදී. ප්‍රතිලාභ අයදුම් පතක් සඳහා ගෙවන ලද සාමාන්‍යය පසුගිය වසරට සාපේක්ෂව රු. 53,327 සිට රු. 58,320 දක්වා වර්ධනය විය. (ප්‍රස්ථාර අංක 06) වසර තුළ ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාවෙහි ආන්තික වර්ධනයක් දක්නට ලැබුණි. 2011 වසර තුළ සුභසාධන ප්‍රතිලාභ ගෙවීම් අයදුම්කරුවන් 4,153 ක් වෙනුවෙන් ගෙවන ලද රුපියල් මිලියන 138 ට සාපේක්ෂව 2012 වසරේදී අයදුම්කරුවන් 3,962 ක් සඳහා රුපියල් මිලියන 134 ක් ගෙවන ලදී. 05 වසර ශිෂ්‍යත්වය සමත් ශිෂ්‍යත්ව ලාභින් 5,000 ක් වෙනුවෙන් රුපියල් මිලියන 75 ක් මහජන බැංකුවෙහි තැන්පත් කරන ලදී. (ප්‍රස්ථාර අංක 07). එමෙන්ම 2011 වසරේදී අ. පො. ස. (උසස් පෙළ) විභාගය සමත් සාමාජිකයන්ගේ දරුවන් දෙදහක් (2,000) වෙනුවෙන් ඔවුන්ගේ උසස් අධ්‍යාපනය සඳහා සහය දීමක් වශයෙන් 2012 වසරේදී රුපියල් මිලියන 24 ක් ගෙවන ලදී. අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිල ප්‍රතිඵල නිකුත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් 2012 වසරේ අ.පො. ස. (උසස් පෙළ) විභාගය සමත් සාමාජිකයන්ගේ දරුවන් වෙනුවෙන් වසර තුළ මෙම මුදල් ගෙවීම කළ නොහැකි විය. මෙම ප්‍රතිපාදිත මුදල් හැකි කඩිනමින් 2013 වසරේ ගෙවා අවසන් කිරීමට කටයුතු සැකසෙමින් පවතී.

2012 වසරේදී "වියන" නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ සාමාජිකයන් 54 දෙනෙක් වෙනුවෙන් රුපියල් මිලියන 69 ක් NDB බැංකුව වෙත නිදහස් කරන ලදී.

සක්‍රීය සාමාජිකයන් වෙනුවෙන් මණ්ඩලය විසින් දැනට ක්‍රියාත්මක කෙරෙන ප්‍රතිලාභ යෝජනා ක්‍රම 10 පහත දැක්වේ.

1. මරණ ප්‍රතිලාභ රක්ෂණ යෝජනා ක්‍රමයඃ උපරිමය රු. 50,000 කි.
2. හදවත් සැත්කම් සඳහා මූල්‍යාධාර : උපරිමය රු. 150,000 කි.
3. වකුගඩු බද්ධ කිරීම සඳහා මූල්‍යාධාර : උපරිමය රු. 150,000 කි.
4. නිත්‍ය දුබලතා යෝජනා ක්‍රමය : උපරිමය රු. 200,000 කි.
5. ඇස් දෙකම සඳහා අභ්‍යන්තර අක්ෂිකාච බද්ධ කිරීමේ වියදම් ප්‍රතිපූරණයඃ රු. 18,000 කි.
6. සේ.නි.භා.අ. සාමාජිකයන්ගේ දරුවන් සඳහාවූ 05 වසර ශිෂ්‍යත්ව ආධාර (රු. 15,000 බැගින් ශිෂ්‍යත්ව 7,000 ක් වාර්ෂිකව).
7. ශ්‍රම සුව රැකවරණ රෝහල්ගත වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය (වසරකට රුපියල් 25,000 බැගින් මුළු සේවා කාලය තුළදී උපරිමය රු. 50,000 කි).
8. NDB බැංකුව සමඟ ක්‍රියාත්මක කෙරෙන "වියන" අඩු පොළී නිවාස ණය යෝජනා ක්‍රමය.
9. සේවා කාලය තුළදී දුබලතාවයට පත් අරමුදලේ සාමාජිකයින්ගේ 05 වසර සමත් දරුවන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය.

10. අ.පො.ස (උසස්පෙළ) සමත් අරමුදලේ සාමාජිකයින්ගේ දරුවන් 5,000 කට රුපියල් 12,000 බැගින් වාර්ෂිකව පිරිනැමෙන මුල්‍යාධාර.

කඩිනමින් මුදල් ලබා ගැනීමේ අවශ්‍යතාවය සහිත සාමාජිකයන්ගේ පහසුව තකා 2012 දෙසැම්බර් මස සිට විශේෂ කඩිනම් ප්‍රතිලාභ ගෙවීමේ ඒකකයක් ප්‍රතිලාභ අංශයේ ස්ථාපිත කර ඇති අතර, පෙරවරුවේ භාර දෙනු ලබන ප්‍රතිලාභ අයදුම්පත් සඳහා වූ චෙක්පත් එදිනම නිකුත් කිරීමට කටයුතු යොදා ඇත.

## සාමාජික ගිණුම් පවත්වාගැනීම

කේවල සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම සහ සක්‍රීය සාමාජිකයන් වෙත වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම සාමාජික ගිණුම් අංශයේ කාර්යභාරය වේ. වසර අවසානය වන විට අරමුදලේ සක්‍රීය සහ අක්‍රීය සාමාජික ගිණුම් සංඛ්‍යාව ආසන්න වශයෙන් මිලියන 10 ක් විය. අරමුදල විසින් මෙම සියළු සක්‍රීය සහ අක්‍රීය සාමාජිකයින් වෙනුවෙන් සාමාජික ගිණුම් පවත්වා ගෙන යනු ලබයි.

2012.12.31 වන විට 2011 වසර දක්වා වූ සාමාජික ගිණුම් 9,666,352 ක් යාවත්කාලීන කළ අතර, එය සමස්ථ සාමාජික ඇස්තමේන්තුවෙන් 96% ක් පමණ විය. මෙම සංඛ්‍යාවෙන් 7,641,356 ක් අක්‍රීය සාමාජික ගිණුම් වූ අතර 2,024,996 ක් සක්‍රීය සාමාජික ගිණුම් විය. මෙම සක්‍රීය සාමාජික ගිණුම් ශේෂ සඳහා වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන අදාළ සේවායෝජකයින් වෙත වර්ෂය තුළදී නිකුත් කළ හැකිවිය.

## ආයෝජන

රුපියල් බිලියන 134 ක්වූ ආයෝජන සංයුතිය 2012 වසරේදී රුපියල් බිලියන 150 ක් දක්වා වර්ධනය වු අතර, එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව 11.94% ක වැඩිවීමකි.

2012 වසර තුළදී ආයතනයේ ආයෝජන ප්‍රතිපත්ති ඉතාමත් වගකීමකින් යුතුව අනුගමනය කළ අතර, මේ තුළින් ආයෝජිත ප්‍රාග්ධනය සුරක්ෂිත කර ගනිමින් සාධාරණ ප්‍රතිලාභයක් උපයා ගැනීමට හැකිවිය.

මුළු ආයෝජන සංයුතිය තුළ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය රුපියල් බිලියන 134 (90%) ක්ද, රජයේ අනිකුත් සුරක්ෂිත ස්ථාවර ආයෝජන සුරැකුම්පත්වල රුපියල් බිලියන 2.99 (2%) ක් සහ කොටස් වෙළඳපල ආයෝජනය රුපියල් බිලියන 7.3 (4.9%) ක් ද විය. (ප්‍රස්ථාර අංක 08).

මෙම කොටස් වෙළඳපොල ගනුදෙනු තුළින් ලාභාංශ සහ ප්‍රාග්ධන ලාභ වශයෙන් පසුගිය වසරේදී උපයා ගන්නා ලද ලාභය වන රුපියල් මිලියන 703 ට සාපේක්ෂව උපයා ගත හැකිවූ ලාභය රුපියල් මිලියන 324 ක් විය. 2012 වසරේ පැවති කොටස් වෙළඳපොල අවපාත තත්ත්වයන් මෙම අඩුවීමට ඉවහල් විය.

පෙර සඳහන් කළ පරිදි 2011 වසරේදී අරමුදල විසින් උපයන ලද ආයෝජන ආදායම වන රුපියල් බිලියන 12.3 ට සාපේක්ෂව 2012 වසරේදී රුපියල් බිලියන 13.2 ක් උපයාගැනීමට හැකිවු අතර, එය බිලියන 0.9 ක වැඩිවීමකි.

විකල්ප ක්‍රියාමාර්ගයක් වශයෙන් මණ්ඩලය මගින් ශ්‍රේණිගත වාණිජ පත්‍ර සහ ණයකරයන්හි ආයෝජනය කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, එමගින් ආදායම් ඉලක්ක සපුරා ගැනීමට මෙන්ම 2013 වර්ෂාවසානයේදී සාමාජිකයන්ට සාධාරණ ලාභාංශයක් ගෙවීමට හැකිවේ යයි අපේක්ෂා කෙරේ. එමෙන්ම වඩාත් ආකර්ශණීය ප්‍රතිලාභ ලැබීම සඳහා ද්විතීය වෙළඳ පොළ තුළ ණයකර ආයෝජන අවස්ථා පිළිබඳව අවධානය යොමුකර ඇත.

සුරැකුම්පත් විනිමය කොමිෂන් සභාව (SEC) / කොළඹ කොටස් වෙළඳපොළ (CSE) මගින් පවත්වාගෙන යනු ලබන ආයෝජන පිළිබඳ අදාළ පාඨමාලාවන් කෙරෙහි තරුණ උපාධිධාරීන් යොමු කිරීමෙන් ආයෝජන විශ්ලේෂණ සහ පර්යේෂණ පිළිබඳව ඔවුන් පුහුණු කිරීම කෙරෙහි මණ්ඩලයේ අවධානය යොමුවී ඇත.

2012 ඔක්තෝබර් මස පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) වෙත කැඳවන ලදුව මණ්ඩලයේ සමස්ථ කාර්යයන් පිළිබඳව විමර්ෂණයට ලක් කරන ලදී. එහිදී මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්ති සහ ආයෝජන මෙහෙයුම් පිළිබඳව එම කමිටු සාමාජිකයන්ගේ පැහැදීමක් දක්නට ලැබුණි.

ආයෝජන කමිටු ප්‍රධානී ලෙස කටයුතු කරන මහා භාණ්ඩාගාර නියෝජිත අධ්‍යක්ෂවරයා නිරන්තරයෙන් රැස්වී ආයෝජන යෝජනා සහ විකල්පයන් අගය කොට ඒ පිළිබඳ නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## රැස්කිරීම සහ සේවා යෝජක සබඳතා

දායක මුදල් සහ අධිභාර රැස්කිරීම්, නීති සහ ක්‍රියාත්මක කිරීමේ කටයුතු සහ ප්‍රාදේශිය ශාඛා කාර්යාල ජාලය පරිපාලනය සහ අධීක්ෂනය කිරීම මෙම කොට්ඨාශයේ ප්‍රධාන කාර්යභාරය වේ. සේවායෝජකයන් විසින් මාසිකව ගෙවිය යුතු දායක මුදල් හා අධිභාර ප්‍රමාණය වර්ධනය කර ගැනීමටත්, විශේෂයෙන් දුර බැහැර ප්‍රදේශවල සිටින සාමාජිකයන් හට වැඩි සේවයක් සැලසීමටත්, සමාලෝචිත වසර තුළ විවිධ ක්‍රියාමාර්ගයන් ගන්නා ලදී.

පෙර සඳහන් කළ පරිදි උතුරු ප්‍රදේශයේ සේවායෝජකයින්ගේ සහ සාමාජිකයින්ගේ පහසුව සඳහා 2010 වසරේදී යාපනය නගරයේ විවෘත කරන ලද නව ප්‍රාදේශීය කාර්යාලය දැනට වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක වේ. මේ සමඟම මුළු ප්‍රාදේශිය කාර්යාල සංඛ්‍යාව 17 දක්වා වැඩිවිය. මෙම කාර්යාල සඳහා දක්‍ෂ උපාධිධාරීන් පුහුණු කර බඳවා ගැනීමට පියවර ගැනීම තුළින් එම කාර්යාලයන්හි ක්‍රියාත්මක කිරීම් කටයුතු තව දුරටත් ශක්තිමත් කිරීමට කළමනාකරණය විසින් අඛණ්ඩව පියවර ගන්නා ලදී.

ලංකා බැංකුව සහ කොමර්ෂල් බැංකුව සමඟ එක්වී විද්‍යුත් මාධ්‍ය උපයෝගි කර ගනිමින් සේවායෝජකයින්ට මාසික දායක මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් 2009 වසරේදී හඳුන්වා දෙන ලදී. මෙය ලිපි ලේඛණ භාවිතයෙන් තොරවූ ඉතා පහසුදායි ක්‍රමවේදයක් වූයෙන් සේවායෝජකයින් වැඩි සංඛ්‍යාවක් 2012 වසරේදීද දායක මුදල් ගෙවීම සඳහා මෙම ක්‍රමය යොදාගත් බැව් දක්නා ලදී. තවදුරටත් මෙම ක්‍රමය උපයෝගී කර ගැනීම පිළිබඳව සේවායෝජකයින් දිරිගැන්වීම පිණිස විවිධ දැනුවත් කිරීමේ වැඩමුළු මගින් මණ්ඩලය විසින් අඛණ්ඩ ප්‍රයත්නයන් දරන ලද අතර, අන්තර්ජාලය හරහා දැනට දායක මුදල් ගෙවන සේවායෝජකයින් සංඛ්‍යාව 350 කි. තවද, සම්පත් බැංකුව හා මහජන බැංකුව හරහා 2013 වසරේ සිට මෙම ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ සාකච්ඡා අවසන් අදියරට පැමිණ ඇත.

මෙම කොට්ඨාශයේ කාර්ය සාධනය මෙම වසර තුළදී ඉතාමත් දිරිගන්වන සුළු මට්ටමක පැවති අතර, එම ප්‍රතිඵල පහත සඳහන් වගුවේ දක්වා ඇත.

| | | 2012 | 2011 |
|---|---|---|---|
| පරීක්ෂා කරන ලද ආයතන සංඛ්‍යාව | | 34,182 | 29,526 |
| අනාවරණය කරගත් ගෙවීම් පැහැර හරින්නන් සංඛ්‍යාව | | 22,788 | 19,692 |
| පවරන ලද නඩු සංඛ්‍යාව | | 2,196 | 1,991 |
| ක්‍රියාත්මක කිරීම් මගින් අයකරගත් දායක මුදල | රු. මිලියන | 445 | 500 |
| අයකරගත් අධිභාර මුදල | රු. මිලියන | 206 | 184.9 |
| නීති කටයුතු මගින් අයකරගත් ආදායම | රු. මිලියන | 87 | 64.3 |

*(ප්‍රස්ථාර අංක 09 - 10)*

2013 වසර තුළ අනුකූලතා ප්‍රතිශතය වැඩිකර ගැනීම කෙරෙහි සියළු ප්‍රයත්නයන් ගන්නා ලෙස සෑම ප්‍රාදේශීය කාර්යාලයක් වෙතම උපදෙස් ලබා දී ඇත. එමෙන්ම වර්ෂය තුළ සෑම කාර්තුවක් තුලදීම ප්‍රාදේශීය කළමනාකාරවරුන් සමගම ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.

## පරිපාලන හා මානව සම්පත්

සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ විවිධ අංශයන් සඳහා 22 දෙනෙකු කාර්ය මණ්ඩලයට බඳවාගත් අතර, විශ්‍රාම ගැනීම්, සේවයෙන් ඉල්ලා අස්වීම්, සේවය අවසන් කිරීම ආදී හේතූන් මත සේවයෙන් ඉවත්වූ සංඛ්‍යාව 17 ක් විය. එයට අමතරව ඉහළ ශ්‍රේණි සඳහා උසස්වීම් ලද සංඛ්‍යාව 94 ක් විය. මේ අනුව වසර අවසානයේදි මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව 913 ක් ලෙස වාර්තා විය.

පසුගිය වසරේදී මෙන් මෙම වසරේදීද සියළුම මට්ටම්වල කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ඔවුන්ගේ ක්ෂේත්‍රයන්ට අදාල පුහුණුවීම් ලබා ගැනීමට අවස්ථාවන් උදාකර දෙන ලදී. මේ තුළින් කාර්ය මණ්ඩලයේ ඵලදායිත්වය, කාර්ය සාධනය හා ආකල්ප ඉහළ නැංවීමට හැකිවූ අතර, එම තත්ත්වය වසර තුළ මණ්ඩලය විසින් ලඟාකරගත් විශිෂ්ඨ ප්‍රගතිය සඳහා විශාල දායකත්වයක් සපයන ලදී. මේ අතුරින් තොරතුරු තාක්ෂණ අංශයේ කාර්ය මණ්ඩල පුහුණුව සහ කාර්ය මණ්ඩලයේ භාෂා නිපුනත්වය වැඩි කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිළධාරීන්ද ඔවුන්ගේ හැකියාවන් වර්ධනය පිණිස අදාළ පුහුණු පාඨමාලා වෙත යොමු කරන ලදී.

## මුදල්

මණ්ඩලයේ සමස්ථ මූල්‍ය කටයුතු පිළිබඳ වගකීම මුදල් කොට්ඨාශය වෙත පැවරී ඇත.

මණ්ඩලයේ සියළු ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීම, සියළු කාර්ය මණ්ඩල ගෙවීම්, සැපයුම් සහ සේවාවන් වෙනුවෙන් ගෙවීම් අධීක්ෂණය, මාසික සහ වාර්ෂික අවසාන ගිණුම් පිළියෙල කිරීම, වාර්ෂික අයවැය ලේඛණය සැකසීම, සාමාජිකයන් වෙනුවෙන් ගෙවිය යුතු වාර්ෂික ලාභාංශ තීරණය කිරීම සහ අනෙකුත් කළමනාකරණ තොරතුරු සැපයීම යනාදි කටයුතු මෙම කොට්ඨාශය මඟින් සිදු කරනු ලැබේ.

ඉහත සඳහන් කාර්යයන්ට අමතරව මණ්ඩලයේ ආයතනික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම වාර්ෂික වාර්තාව පිළියෙල කිරීම, විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීමේ සම්බන්ධීකරණයද, බාහිර ආයතනයන් වෙත මූල්‍ය තොරතුරු සැපයීම සහ අනෙකුත් මූල්‍ය ලේඛණ පවත්වාගෙන යාමද මෙම කොට්ඨාශය මඟින් සිදු කරනු ලබයි.

තවද, වඩාත් ගුණාත්මක මූල්‍ය කළමනාකරණයක් පවත්වා ගැනීම වෙනුවෙන් සැපයුම් කළමනාකරණ කාර්යයන්ද 2012 වසරේ සිට මුදල් කොට්ඨාශය වෙත අනුයුක්ත කරන ලද අතර, සැපයුම් සහ ගබඩා කළමනාකරණ කාර්යයන් මෙන්ම ටෙන්ඩර් මණ්ඩල කාර්යයන් ද 2012 වසරේ සිට මුදල් කොට්ඨාශය මඟින් මෙහෙයවනු ලැබේ.

තවද මුදල් කොට්ඨාශය, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට (SLFRS) අනුකූලව ප්‍රථම වරට 2012 වසරේ වාර්ෂික ගිණුම් සාර්ථකව පිළියෙල කරන ලදී.

## අභ්‍යන්තර විගණන

ආයතනයේ කටයුතු වලට අදාළ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමෝපායයන් පවත්වා ගැනීමට සහය වීම හා මූල්‍ය හා මෙහෙයුම් කටයුතු වල විනයක් පවත්වා ගැනීමට උපකාරි වීම අභ්‍යන්තර විගණන කොට්ඨාශයේ ප්‍රධාන කාර්යභාරය ලෙස සැලකිය හැකිය. මේ අතර ආයතනයේ විගණන කමිටුවේ සම්බන්ධීකරණ කටයුතු

අභ්‍යන්තර විගණන අංශය මගින් සිදුකරන අතර, වරලත් ගණකාධිකාරිවරයෙකු වන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගේ සභාපතිත්වය යටතේ සෑම කාර්තුවක් අවසානයේදී රැස්වී ආයතනයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු වල පවත්නා ගැටලු විමසීමට භාජනය කරන අතර, ඒවා නිවැරදි කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳව පසුවිපරමක් ද සිදු කරනු ලබයි. එමෙන්ම ආයතනයේ අරමුදල්වලින් විශාල ප්‍රතිශතයක් ප්‍රතිලාභ ගෙවීම් වශයෙන් සාමාජිකයන් වෙත මුදා හැරීමේ කටයුතු විගණනය කිරීමේ කාර්යය ද මෙම අංශයෙන් සිදුකරනු ලබයි. තවද, අභ්‍යන්තර විගණන කණ්ඩායමක් තෝරා ගන්නා ලද ප්‍රාදේශීය කාර්යාලයන් කිහිපයක් වෙත යැවුණු අතර, ඒවායේ ප්‍රධාන මෙහෙයුම් කටයුතු පිළිබඳවද වාර්තා කරන ලදී. මීට අමතරව ආයතනයේ විවිධ අංශ වල මෘදුකාංග පද්ධති නවීකරණයන් වල දී තොරතුරු තාක්ෂණ අංශය වෙත විගණන කාර්යයට අදාළ ක්ෂේත්‍ර කෙරෙහි උපදෙස් ලබා දීම ද මෙම අංශය විසින් සිදුකරනු ලබයි. මේ අතර අභ්‍යන්තර විගණන සැලැස්ම ද මෙම වසරේදී සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකිවිය. විශේෂ පරීක්ෂණ ද මෙම කොට්ඨාශය විසින් සිදුකරනු ලැබුණි.

## තාක්ෂණය

සාමාජික පරිපාලන මෘදුකාංග පද්ධතියට අදාලව කල්ගතවී පැවැති මෘදුකාංග ගැටළු විශාල ප්‍රමාණයක් මේ වසරේදී ආයතනයේ මෘදුකාංග සංවර්ධන කාර්ය මණ්ඩලය යෙදවීමෙන් විසඳා ගැනීමට හැකිවිය. මෙම ක්‍රියාමාර්ගය තුළින් මෙවැනි තාක්‍ෂණික ගැටලු විසඳා ගැනීම සඳහා බාහිර මෘදුකාංග සංවර්ධන සේවා ආයතනවලට වැය කිරීමට සිදුව තිබූ විශාල මුදලක් ඉතිරි කර ගැනීමට හැකිවිය.

IPVPN තාක්‍ෂණය යොදා ගනිමින් ගම්පහ, මහනුවර හා මාතර කාර්යාල මගින් ප්‍රධාන පරිගණක පද්ධතිය සම්බන්ධ කර ගනිමින් ආරම්භ කරන ලද ප්‍රතිලාභ ගෙවීමේ වැඩ පිළිවෙල සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකිවිය.

එක්රැස්ව තිබූ සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමටත්, වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීමටත්, තොරතුරු තාක්‍ෂණ අංශයෙන් විශාල තාක්‍ෂණික සහයක් ලබා දෙන ලදී.

ලංකා බැංකුව හා කොමර්ෂල් බැංකුව හරහා හඳුන්වා දුන් අන්තර් ජාලය මගින් විද්‍යුත් බැංකු පහසුකම් මත දායක මුදල් ගෙවීමේ ක්‍රියාවලියට සේවායෝජකයින්ගේ වැඩි නැඹුරුවක් දක්නට ලැබුණි. තවද, විශාල කාණ්ඩයේ සේවායෝජකයින් විසින් පෝරම II ට අදාළ විස්තර විද්‍යුත් මාධ්‍යය මගින් ලබා දීමේ ඉහළ ප්‍රවනතාවක් දක්නා ලදී.

කොළඹ හා කොළඹින් බැහැරව පවත්වන ලද විවිධ ප්‍රදර්ශන වල දී සේ. නි. භාර අරමුදලේ සාමාජිකයන් වෙත ඔවුන්ගේ සාමාජික ශේෂ පරීක්ෂා කිරීම සඳහා තොරතුරු තාක්‍ෂණ අංශය මගින් පහසුකම් සපයන ලදී. එමෙන්ම intranet පහසුකම උපයෝගි කර ගනිමින් ආයතනයේ කොට්ඨාශ සහ ප්‍රාදේශීය කාර්යාල අතර තොරතුරු හුවමාරු කර ගැනීමේ කටයුතු පහසු කරන ලදී.

මෙම වසර තුලදීද නවීනතම තොරතුරු ලබාගත හැකි වන පරිදි ආයතනයේ වෙබ් අඩවිය අඛණ්ඩව යාවත්කාලීන කිරීම සිදුකෙරිනි. මේ අතර මණ්ඩලය විසින් තවදුරටත් ආයතනයේ පද්ධති හා තාක්‍ෂණික ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම සඳහා අන්තර් ජාතික වශයෙන් පිළිගත් ක්‍රම වේදයන් හඳුන්වා දීම කෙරෙහි නිතරතුරුවම යෙදී සිටී.

තවද, තොරතුරු තාක්ෂණ කරුණු සඳහා උපදෙස් මෙන්ම මාර්ගෝපදේශ ලබාගැනීම පිණිස රජයේ තොරතුරු තාක්ෂණ ආයතනය වන ICTA සමඟ නිරන්තර සබඳතා වැඩිදුරටත් පවත්වා ගෙන යනු ලැබේ.

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතට සංශෝධන

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත 1993 වසරෙන් පසුව සංශෝධනය නොවූ අතර, වර්තමාන අවශ්‍යතාවයන් සහ සංවර්ධනයන් වෙනුවෙන් ඇතැම් සංශෝධනයන් කළ යුතු යයි තීරණය කර ඇත. ඒ අනුව 2011 වසර ආරම්භයේදී පත්කරනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත අනු කමිටුව මඟින් නිර්දේශිත අදාළ සංශෝධනයන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්තුමා වෙත යොමු කරන ලදී. ඒ හා සමගාමීව මෙම සංශෝධනයන් ජාතික කම්කරු උපදේශන කමිටුව වෙත ද අධ්‍යයනය සහ අදහස් දැක්වීම වෙනුවෙන් යොමු කරන ලදී. මෙම සංශෝධනයන් ජාතික කම්කරු උපදේශන කමිටුව විසින් සාකච්ඡාවට බඳුන් කරන ලද අතර, එම කාර්යය නිම කෙරෙමින් පවතී. ඉන් අනතුරුව මෙම තීරණයන් වැඩිදුර විධිමත් භාවයන් සඳහා මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මෙන්ම නීති සම්පාදකයන් වෙත යොමු කරනු ලබන අතර, 2013 වසර අග භාගය වන විට මෙම සංශෝධනයන් පාර්ලිමේන්තුවෙහි සභාගත කිරීමට හැකි වේයයි අපේක්ෂා කෙරේ.

## සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල

ආරම්භයේ සිටම සේ. නි. භාර අරමුදලේ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලැබුවේ කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි වලය. මේ වන විට ප්‍රධාන කාර්යාලයේ කොට්ඨාශ කිහිපයක් කිරුළ පාරේ සිට නාවල පාර දක්වා පිහිටා ඇති කුලී ගොඩනැගිලි 05 ක පවත්වාගෙන යනු ලැබේ. එම නිසා සේ. නි. භාර අරමුදලේ ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශ අතර මනා කළමනාකරණයක් පවත්වාගැනීම පිණිස එක් ගොඩනැගිල්ලක් තුළ පවත්වාගෙන යාම දිගුකලක පටන් පැවති අවශ්‍යතාවයකි.

2009 වසරේදී සේවක අර්ථසාධක අරමුදල, සේ. නි. භාර අරමුදල සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් සමාජ ආරක්ෂණ ආයතන සඳහා නව ගොඩනැගිල්ලක් තැනීමට කැබිනට් මණ්ඩලය විසින් තීරණය කරන ලදී. මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා මුල් ගල තැබීම 2009 දෙසැම්බර් මාසයේදී සිදුකරන ලද අතර, මෙම ඉදිකිරීම් කටයුතුවල කාර්යභාරය කම්කරු අමාත්‍යාංශය විසින් දරණු ලබයි. සේ. නි. භාර අරමුදල් මණ්ඩලය සඳහා මෙම ගොඩනැගිල්ලේ මහල් 14 ක් වෙන් කිරීමට එකඟවී ඇත. දැනට මෙම ගොඩනැගිල්ලේ මූලික ඉදකිරීම් කටයුතු අවසන් කෙරෙමින් පැවතියද, මෙම ඉදිකිරීම් වෙනුවෙන් ප්‍රධාන කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේ ප්‍රමාදයක් පවතී. මෙම ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු 2013 ආරම්භ කිරීමට අපේක්ෂිතව ඇති අතර, 2016 වසරේදී නිම කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ගොඩනැගිල්ලේ සේ. නි. භාර අරමුදල් මණ්ඩලයට වෙන්කරන ලද කොටසේ අයිතිය පවරා ගැනීම සඳහා සභාධිපත්‍ය දේපල පනත යටතේ කම්කරු අමාත්‍යාංශය සමඟ ගිවිසුමකට එළඹෙනු ඇත. සේ. නි. භාර අරමුදල් මණ්ඩලයට වෙන් කරනු ලබන මහල් වලට අයත් පිරිවැය අදාල අනුමැතීන් ලැබුණු පසු නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

## විශේෂ ව්‍යාපෘති

1. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සතුව පවතින අනුරාධපුර ඉඩමෙහි සංචාරක බංගලාවක් සහ නේවාසිකාගාරයක් සේවා නියුක්තයන්ගේ සාමාජිකයන් වෙනුවෙන් ඉදිකිරීමට මණ්ඩලීය කළමනාකාරිත්වය 2011 වසර ආරම්භයේදී තීරණය කරන ලදී. මෙහි ඉදිකිරීම් කටයුතු 2011 ඔක්තෝබර් මස ආරම්භ කෙරුණු අතර 2012 දෙසැම්බර් මස ඉදිකිරීම් නිම කෙරිනි. ඉඩම සකස් කිරීමේ අවසන් කටයුතු නිම කෙරෙමින් පවතින අතර, දැනට ඇති පැරණි කාර්යාල ගොඩනැගිල්ල කඩා ඉවත්කර නව කාර්යාල ගොඩනැගිල්ලක් මෙම ඉඩමෙහි ඉදිකිරීමට තීරණය කර ඇත.

2. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලීය ක්‍රීඩා සමාජයද සේ. නි. භා. අරමුදලේ කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සුභසාධනය වෙනුවෙන් භාවිතා කිරීම පිණිස නිවාඩු නිකේතනයක් 2012 වසරේදී යාල, පලටුපානෙහි ඉදිකරන ලදී.

## අධ්‍යක්ෂ මණ්ඩලය

2012 වසර අවසානයේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් පරිදි විය.

**කේ. එම්. ඒ. ගොඩවත්ත මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරි
ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කළ නියෝජිත

**ජී. තිස්සකුට්ටිආරච්චි මහතා**
ක්‍රියාකාරි අධ්‍යක්ෂ
ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කළ නියෝජිත

**පී. ඒ. එස්. පණ්ඩිතරත්න මහතා**
අධ්‍යක්ෂ
ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කළ නියෝජිත

**යූ. එස්. අබේරත්න මහතා**
අධ්‍යක්ෂ
ගරු මුදල් අමාත්‍යතුමා විසින් පත්කළ නියෝජිත

**පී. ඒ. අබේසේකර මහතා**
අධ්‍යක්ෂ
මහා භාණ්ඩාගාර නියෝජිත

**ජී. එල්. ඩී. දහනායක මිය**
අධ්‍යක්ෂ
ගරු වෙළෙඳ අමාත්‍යතුමා විසින් පත්කල නියෝජිත

**සී. එල්. කේ. පී. ජයසූරිය මහතා**
අධ්‍යක්ෂ
ලංකා හාම්පුතුන්ගේ සංගමය විසින් පත්කල නියෝජිත

**රංජිත් හෙට්ටිආරච්චි මහතා**
අධ්‍යක්ෂ
වෘත්තීය සමිති නියෝජිත

**දීපා වීරසූරිය මහත්මිය**
මණ්ඩලීය ලේකම්

## ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

2012 වර්ෂය අවසානයේදී මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය පහත සඳහන් පරිදි විය.

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරි**
කේ. එම්. ඒ. ගොඩවත්ත මහතා

**ක්‍රියාකාරි අධ්‍යක්ෂ**
ජී. තිස්සකුට්ටිආරච්චි මහතා

**අතිරේක සාමාන්‍යාධිකාරි**
එම්. සී. එච්. ගුණරත්න මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්**

ආර්. එන් ඥානසේකර මිය (ආයෝජන)

ජේ. එම්. එස්. බී. උඩුගම මහතා (දායක මුදල් රැස්කිරීම් හා සේවා යෝජක සබඳතා)

| | |
|---|---|
| ඩබ්ලිව්. එස්. දිසානායක මහතා | (සාමාජික සේවා) |
| එල්. එච් නිහාල් මහතා | (පරිපාලන හා මානව සම්පත්) |
| කේ. එස්. වැලිවිට මහතා | (අභ්‍යන්තර විගණන) |
| එන්. ඩබ්ලිව්. විමලවීර මහතා | (මුදල්) |

**සහකාර සාමාන්‍යාධිකාරිවරුන්**

| | |
|---|---|
| සී. මල්ලිකාරච්චි මහතා | (සාමාජික ගිණුම්) |
| එච්. එම්. සෙනෙවිරත්න මහතා | (සාමාජික සේවා) |
| ඩබ්ලිව්. සූරියආරච්චි මහතා | (ක්‍රියාත්මක කිරීමේ I කලාපය) |
| ඒ.ජේ.එම්.එස්. ජයසුන්දර මහතා | (ක්‍රියාත්මක කිරීමේ II කලාපය) |
| එම්. එස්. දිසානායක මහතා | (ක්‍රියාත්මක කිරීම්/ස්වයංරැකියා) |

## සමාප්තිය

මුදල් හා ක්‍රම සම්පාදන විෂය භාර අතිගරු ජනාධිපතිතුමා, නියෝජ්‍ය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් සහ එම කාර්ය මණ්ඩලයේ සියළු දෙනා විසින් දක්වන ලද සහයෝගය සහ මඟ පෙන්වීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සිය විශේෂ ස්තුතිය පල කර සිටී. 2012 වර්ෂය තුළ සියළු මෙහෙයුම් කාර්යයන්ගෙන් මණ්ඩලය ලද විශිෂ්ඨ ප්‍රගතිය සඳහා කැපවී සේවය කිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩලයේ සියළු දෙනා වෙතම අධ්‍යක්ෂ මණ්ඩලය සිය තුති පුදයි. ඕනෑම ආයතනයක සාර්ථකත්වය සඳහා එහි සේවක මණ්ඩලයේ කාර්ය සාධනය ඉවහල් වන අතර, පවරන ලද කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා කැපවූ සේවක පිරිසක් සිටීම ගැන අප ආඩම්බර වෙමු. සියළුම වෘත්තිය සමිති විසින් අප වෙත දක්වන ලද නොමඳ දායකත්වය සහ සහයෝගය ද අප අගය කරමු. වර්ෂය තුළ දී ආයතනයේ සාමාජික සේවා වෙනුවෙන් ආයතනයේ ශක්තිමත් පදනමක් ගොඩනැගීමට සමස්ථ කාර්ය මණ්ඩලය දක්වන ලද කැපවීම, අවංකභාවය සහ කණ්ඩායම් හැඟීම ප්‍රශංසාත්මකය.

# විගණන කමිටු වාර්තාව 2012

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලද ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුව 2003 වර්ෂයේදී ස්ථාපිත කරන ලදී. විගණන කමිටුවේ සභාපති තනතුර ගණකාධිකරණ සහ විගණන ක්ෂේත්‍රයන්හි පුළුල් පළපුරුද්දක් සහිත ජ්‍යෙෂ්ඨ වරලත් ගණකාධිකාරිවරයෙකු විසින් හොබවනු ලබයි.

2012 වසර තුළ විගණන කමිටු රැස්වීම් 05 ක් පවත්වන ලද අතර, අතිරේක සාමාන්‍යාධිකාරී, කැඳවුම්කරු ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අභ්‍යන්තර විගණන) සහ අනෙකුත් සියලුම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, රජයේ විගණන අංශයේ කණ්ඩායම් භාර නිලධාරි සහ අනෙකුත් අදාළ නිලධාරීන්, රැස්වීම් සඳහා කමිටුවේ ආරාධනය මත සහභාගි වූහ.

විගණන කමිටු රැස්වීම් කටයුතු පිළිබඳව නිරන්තරයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ.

නීතිරීති, රෙගුලාසි සහ නිකුත් කරන ලද චක්‍ර ලේඛවලට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න පිළිබඳ නිරන්තර සමාලෝචනය සහ ඊට පටහැනි වන අවස්ථාවන් පිළිබඳව මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහය දක්වන ලදී. කමිටුව අභ්‍යන්තර විගණන අනාවරණයන් සහ කළමනාකාරිත්වයේ ප්‍රතිචාරයන් සහිත නිර්දේශයන් සහ එම නිර්දේශයන් සමස්ථ පාලන පරිසරය වැඩිදියුණු කිරීමෙහිලා දක්වන ලද ප්‍රගතිය ද සමාලෝචනය කරන ලදී. ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධති හඳුන්වා දීමට සහ ක්‍රියාත්මක කිරීමට සහ අඛණ්ඩව පද්ධති වැඩිදියුණු කිරීමේ යෝජනා ඉදිරිපත් කිරීමෙන් ද විගණන කමිටුව මණ්ඩලය වෙත සහය දක්වන ලදී.

මණ්ඩලයේ අභ්‍යන්තර විගණන කටයුතු අභ්‍යන්තර විගණන කොට්ඨාශය මගින් සිදු කරනු ලැබේ. අභ්‍යන්තර විගණන සැලැස්ම කමිටුවේ සමාලෝචනයට භාජනය වූ අතර, මණ්ඩලය විසින් භාවිතා කරනු ලබන මූල්‍ය වාර්තාකරණ පද්ධතිය මත විශ්වාසනීයව මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කරනු ලබන්නේ ද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණකාධිපති වාර්තාව ද විගණන කමිටුව සමාලෝචනය කරන ලදී. එමගින් තීව්‍ර කර දක්වන ලද අඩුලුහුඩුකම් නිවැරදි කරගන්නා ආකාරය පිළිබඳව ද මණ්ඩලීය කළමනාකාරිත්වය වෙත නිර්දේශ කරන ලදී.

*අත්සන් කළේ*

**පී ඒ එස් පණ්ඩිතරත්න**
සභාපති
විගණන කමිටුව

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

# මූල්‍ය ප්‍රකාශන 2012

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| | සටහන් | 2012 | 2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **ආදායම්** | | | |
| පොළී ආදායම | 4 | 13,324,819,872 | 12,416,540,323 |
| ලාභාංශ ආදායම | 5 | 208,700,797 | 164,355,257 |
| ලාභාලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) | 6 | (304,378,044) | (280,676,440) |
| අනෙකුත් ආදායම් | 7 | 258,891,913 | 251,872,364 |
| | | **13,488,034,538** | **12,552,091,505** |
| **වියදම්** | | | |
| සේවක මණ්ඩල වියදම් | 8.1 | 632,244,346 | 570,882,463 |
| මෙහෙයුම් වියදම් | 8.2 | 110,701,557 | 107,613,150 |
| මූල්‍ය වියදම් | 8.3 | 2,484,779 | 2,774,251 |
| සාමාජික වියදම් | 8.4 | 289,908,491 | 294,181,876 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂය | | 20,877,992 | 20,303,987 |
| ප්‍රවර්ථන වර්ෂයේ ගෙවන ලද පොළී | | 118,220,400 | 108,106,649 |
| **මුළු මෙහෙයුම් වියදම** | | **1,174,437,564** | **1,103,862,376** |
| ආදායම් බදු වියදම | 9 | (165,648,658) | (141,008,314) |
| **වර්ෂයේ ලාභය** | | **12,147,948,316** | **11,307,220,814** |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | | |
| වත්කම් ප්‍රත්‍යාගණනයේ ශුද්ධ ලාභය /(අලාභය) | | - | 1,842,000,000 |
| පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය /(අලාභය) | | (269,065,066) | 511,084,990 |
| විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය /(අලාභය) | | - | 7,000,000 |
| ආයුගණන ලාභය / (අලාභය) | | (1,275,517) | 277,391 |
| ආදායම් බදු අඩුකළ පසු වර්ෂයේ අනෙකුත් විස්තීර්ණ ආදායම් | | **(270,340,584)** | **2,360,362,381** |
| **ආදායම් බදු අඩුකළ පසු විසර්ජනයට පෙර වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම** | | **11,877,607,733** | **13,667,583,195** |

නිවැරදි බවට සහතික කළේ

**එන් ඩබ්ලිව් විමලවීර**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

**එම් සී එච් ගුණරත්න**
අතිරේක සාමාන්‍යාධිකාරී

**කේ එම් ඒ ගොඩවත්ත**
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2012 | 2011 | 2011 ජනවාරි 01 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | |
| මුදල් හා මුදල් සමානයන් | | 414,830,531 | 366,615,131 | 265,992,240 |
| විකිණීම පිණිස රඳවා ගත් අනෙකුත් මූල්‍ය වත්කම් | 10 | 6,871,631,979 | 6,393,856,348 | 4,765,802,654 |
| විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන | 11 | 485,834,544 | 485,834,544 | 439,943,500 |
| පරිනත වීම තෙක් රඳවා ගත් මූල්‍ය ආයෝජන | 12 | 135,407,687,030 | 120,212,461,978 | 106,129,045,597 |
| ණය සහ ලැබිය යුතු මූල්‍ය ආයෝජන | 13 | 7,234,690,204 | 7,137,288,683 | 7,263,920,182 |
| අනෙකුත් වත්කම් | 14 | 4,451,654,278 | 4,322,080,322 | 4,911,487,835 |
| දේපළ, පිරියත සහ උපකරණ | 15.1 | 188,241,276 | 164,972,841 | 151,745,341 |
| අස්පෘශ්‍ය වත්කම් | 15.2 | 717,470 | 1,002,291 | 1,401,501 |
| ආයෝජන දේපළ | 16 | 3,200,000,000 | 3,200,000,000 | 1,358,000,000 |
| **මුළු වත්කම්** | | **158,255,287,312** | **142,284,112,140** | **125,287,338,851** |
| **බැරකම් හා ස්කන්ධය** | | | | |
| ප්‍රවර්තන බදු බැරකම | | 109,797,276 | 71,710,608 | 194,499,444 |
| අනෙකුත් බැරකම් | 17 | 156,894,176 | 301,475,525 | 167,771,087 |
| ප්‍රතිපාදන | 18 | 37,496,585 | 16,066,095 | 14,282,705 |
| **මුළු බැරකම්** | | **304,188,037** | **389,252,228** | **376,553,236** |
| **මුළු ස්කන්ධය** | 19 | **157,951,099,275** | **141,894,859,914** | **124,910,785,614** |
| **මුළු බැරකම් හා ස්කන්ධය** | | **158,255,287,312** | **142,284,112,140** | **125,287,338,851** |

මෙහි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

නිවැරදි බවට සහතික කළේ

**එන් ඩබ්ලිව් විමලවීර**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

**එම් සී එච් ගුණරත්න**
අතිරේක සාමාන්‍යාධිකාරී

මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කර අත්සන් කරන ලදී.

**කේ එම් ඒ ගොඩවත්ත**
සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | |
| ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් විකුණුම් ලදමනාව | 1,029,949,105 | 1,518,180,111 |
| පරිනතවීම තෙක් රඳවාගත් මූල්‍ය උපකරණ පරිනතවීම් | 100,176,683,956 | 94,344,963,816 |
| මූල්‍ය උපකරණ පරිනතවීම් - ණය සහ ලැබිය යුතු ගිණුම් | 63,715,656 | 121,742,689 |
| ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට ඇති මූල්‍ය වත්කම් මිලදී ගැනීම් | (1,854,540,832) | (4,027,741,947) |
| පරිනත වීම තෙක් රඳවාගන්නා මූල්‍ය උපකරණ මිලදී ගැනීම් | (113,182,588,792) | (107,915,815,208) |
| ණය සහ ලැබිය යුතු මූල්‍ය උපකරණ අත්පත් කරගැනීම සඳහා ණය ප්‍රදානය | (60,763,735) | (48,140,191) |
| පොලී ලැබීම් | 10,778,335,799 | 13,687,335,345 |
| ලාභාංශ ලැබීම් | 208,635,789 | 164,355,257 |
| අනෙකුත් අදායම් ලැබීම් | 239,975,375 | 241,150,753 |
| ගෙවන ලද මෙහෙයුම් වියදම් | (725,598,731) | (569,400,196) |
| ගෙවන ලද මූල්‍ය වියදම් | (2,484,779) | (2,659,355) |
| ගෙවන ලද සාමාජික වියදම් | (281,208,655) | (190,584,105) |
| ගෙවන ලද ආදායම් බදු | (1,414,439) | (263,797,150) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(3,611,304,283)** | **(2,940,410,180)** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්** | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම් | (52,273,935) | (39,428,759) |
| දේපළ, පිරියත හා උපකරණ විකුණුම් ලදමනාව | 2,920,040 | 3,056,019 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද / (භාවිත කළ) ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(49,353,895)** | **(36,372,740)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්** | | |
| දායක මුදල් ලැබීම් | 12,582,954,752 | 10,959,906,153 |
| ප්‍රතිලාභ ගෙවීම් | (8,565,217,045) | (7,774,489,115) |
| පොලී ගෙවීම් | (118,332,167) | (108,305,783) |
| 5 වසර ශිෂ්‍යත්ව මුදල් (ගෙවීම්) / ආපසු ලැබීම් | (75,844,266) | (73,374,449) |
| උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව මුදල් (ගෙවීම්) / ආපසු ලැබීම් | (3,096,000) | (20,064,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **3,820,465,274** | **2,983,672,806** |
| | | |
| මුදල් හා මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම | 159,807,096 | 6,889,886 |
| ජනවාරි 01 දිනට මුදල් හා මුදල් සමානයන් | 255,023,435 | 248,133,550 |
| **දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමානයන්** | **414,830,531** | **255,023,435** |

# ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| | සාමාජික අරමුදල | ලාභාංශ තුළන සංචිතය | ප්‍රත්‍යාගණන සංචිතය | රඳවාගත් ඉපැයීම් | මුළු ස්කන්ධය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| **2011 ජනවාරි 01 දින** | 119,852,873,251 | 4,000,000,000 | 1,313,730,470 | (255,818,107) | 124,910,785,614 |
| පෙර වර්ෂ ගැලපුම් | (1,082,778) | - | - | - | (1,082,778) |
| වර්ෂය තුළ ලද දායක මුදල් | 11,092,062,998 | - | - | - | 11,092,062,998 |
| වර්ෂය තුළ ගෙවූ ප්‍රතිලාභ | (7,774,489,115) | - | - | - | (7,774,489,115) |
| සාමාජික අරමුදල සඳහා පොළී | 3,695,080,931 | - | - | (3,695,080,931) | - |
| ලාභාංශ | 8,621,855,505 | - | - | (8,621,855,505) | - |
| ලාභාංශ තුළන සංචිතයට මාරුකිරීම් | - | (1,000,000,000) | - | - | (1,000,000,000) |
| වර්ෂය සඳහා ගලපන ලද ලාභය | - | - | - | 12,307,220,814 | 12,307,220,814 |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| වත්කම් ප්‍රත්‍යාගණනයෙන් ලද ශුද්ධ ලාභ/(අලාභ) | - | - | 1,842,000,000 | - | 1,842,000,000 |
| ඒකක වල සාධාරණ වටිනාකම ගැලපීම | - | - | - | - | - |
| විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් | - | - | - | 7,000,000 | 7,000,000 |
| විකිණීම සඳහා ඇති වත්කම්වල ශුද්ධ ලාභ/(අලාභ) | - | - | - | - | - |
| ආයුගණන ලාභ / (අලාභ) | - | - | - | 277,391 | 277,391 |
| පරිනත වීම තෙක් රඳවා ගත් මූල්‍ය වත්කම්වලින් ලද ශුද්ධ ලාභ/(අලාභ) | - | - | - | 511,084,990 | 511,084,990 |
| **2011 දෙසැම්බර් 31 දින** | **135,486,300,792** | **3,000,000,000** | **3,155,730,470** | **252,828,652** | **141,894,859,913** |
| **2012 ජනවාරි 01 දින** | **135,486,300,792** | **3,000,000,000** | **3,155,730,470** | **252,828,652** | **141,894,859,913** |
| පෙර වර්ෂ ගැලපුම් | (850,297) | - | - | - | **(850,297)** |
| වර්ෂය තුළ ලද දායක මුදල් | 12,745,270,261 | - | - | - | **12,745,270,261** |
| වර්ෂය තුළ ගෙවූ ප්‍රතිලාභ | (8,565,788,334) | - | - | - | **(8,565,788,334)** |
| සාමාජික අරමුදල සඳහා පොළී | 4,189,947,973 | - | - | (4,189,947,973) | **-** |
| ලාභාංශ | 9,776,545,270 | - | - | (9,776,545,270) | **-** |
| රඳවාගත් ඉපයීම් ගිණුමට මාරුකිරීම් | - | (2,000,000,000) | - | - | **(2,000,000,000)** |
| වර්ෂය සඳහා ගලපන ලද ලාභය | - | - | - | 14,147,948,315 | **14,147,948,315** |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | | | | |
| ආයුගණන ලාභ / (අලාභ) | - | - | - | (1,275,517) | **(1,275,517)** |
| පරිනත වීම තෙක් රඳවා ගත් මූල්‍ය වත්කම්වලින් ලද ශුද්ධ ලාභ/(අලාභ) | - | - | - | (269,065,066) | **(269,065,066)** |
| **2012 දෙසැම්බර් 31 දින** | **153,631,425,664** | **1,000,000,000** | **3,155,730,470** | **163,943,141** | **157,951,099,275** |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| සටහන් | | 2012 | 2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 4 | පොළී ආදායම | | |
| 4.1 | *විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන* | | |
| | පොරොන්දු නෝට්ටු මත පොළී - වනික් ඉන්කෝපරේෂන් | - | - |
| | | - | - |
| 4.2 | *පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන* | | |
| | ස්ථාවර තැන්පත් පොළී | 64,295,443 | 1,783,507 |
| | ණයකර පොළී | 123,353,810 | 104,475,486 |
| | භාණ්ඩාගාර බැඳුම්කර ඉපයීම් | 11,150,769,108 | 10,523,413,814 |
| | භාණ්ඩාගාර බිල්පත් ආන්තිකය | 793,229,660 | 753,949,617 |
| | ප්‍රති මිලදීගැණුම් ගිවිසුම් පොළී | 101,318,784 | 67,187,566 |
| | මුදල් වෙළඳපොළ තැන්පත් පොළී | 1,424,914 | 1,049,987 |
| | විදුලි බල ව්‍යාපෘති බැඳුම්කර පොළී | 400,101,716 | 277,630,549 |
| | වාණිජ පත්‍ර මත පොළී | 6,433,071 | - |
| | | **12,640,926,506** | **11,729,490,526** |
| 4.3 | *ණය සහ ලැබියයුතු ගිණුම් මත මූල්‍ය ආයෝජන* | | |
| | රුපියල් ණය පොළී | 587,000,000 | 587,000,000 |
| | වියන නිවාස ණය පොළී | 86,790,193 | 91,040,635 |
| | ආපදා ණය පොළී | 476,615 | 367,080 |
| | වාහන ණය පොළී | 2,420,990 | 2,046,694 |
| | විශේෂ ආපදා ණය පොළී | 4,250,431 | 3,897,679 |
| | විශේෂ උත්සව අත්තිකාරම් පොළී | 132,241 | 121,887 |
| | පරිගණක ණය පොළී | 9,925 | 6,545 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නිවාස ණය පොළී | 2,780,472 | 2,569,277 |
| | ක්‍රීඩා සමිති ණය පොළී | 32,500 | - |
| | | **683,893,366** | **687,049,797** |
| | මුළු පොළී ආදායම | **13,324,819,872** | **12,416,540,323** |
| 5 | ලාභාංශ ආදායම | | |
| | *විකිණීම සඳහා රඳවාගත් ආයෝජන* | | |
| | මිල ප්‍රකාශිත කොටස් මත ලාභාංශ | 187,059,350 | 135,417,855 |
| | මිල ප්‍රකාශිත ඒකක මත ලාභාංශ | 8,947,697 | 16,243,652 |
| | *විකිණීමට ඇති ආයෝජන* | | |
| | මිල ප්‍රකාශිත නොවූ කොටස් මත ලාභාංශ | 12,693,750 | 12,693,750 |
| | | **208,700,797** | **164,355,257** |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| සටහන් | | 2012 | 2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 6 | ලාභාලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) | | |
| | *ලාභාලාභ ගිණුම හරහා සාධාරන අගය මත කළ මූල්‍ය වත්කම්* | | |
| | මිල ප්‍රකාශිත කොටස් විකිණීමෙන් ලාභ | 124,368,330 | 554,940,657 |
| | ඒකක භාර මත සාධාරණ වටිනාකම ගැලපීම | 165,899,913 | - |
| | කොටස් මත සාධාරණ වටිනාකම ගැලපීම | (594,646,286) | (835,617,097) |
| | | **(304,378,044)** | **(280,676,440)** |
| 7 | අනෙකුත් ආදායම් | | |
| | දේපළ ආදායම් බදු කුලිය | 20,482,080 | 20,482,080 |
| | දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලාභය | 452,588 | 2,665,709 |
| | අධිභාර | 205,128,179 | 183,334,809 |
| | කඩිනම් ප්‍රතිලාභ ගෙවීම් ආදායම | 13,381,000 | 10,908,000 |
| | කාර්ය මණ්ඩල ණය අදායම | 18,463,002 | 16,602,334 |
| | අඩුවෙන්/වැඩියෙන් ගෙවන ලද ප්‍රතිලාභ ලියාහැරීම් | 949 | - |
| | විවිධ ආදායම් | 984,116 | 17,879,432 |
| | | **258,891,913** | **251,872,364** |
| 8.1 | සේවක මණ්ඩල වියදම් | | |
| | කාර්ය මණ්ඩල පිරිවැය (අධ්‍යක්ෂ මණ්ඩල වියදම් ඇතුළු) | | |
| 8.1.1 | *වැටුප් සහ වේතන* | | |
| | වැටුප් | 245,143,047 | 216,076,218 |
| | අධ්‍යක්ෂ ගාස්තු | 529,500 | 379,500 |
| | ජීවන වියදම් දීමනා | 62,208,645 | 60,515,360 |
| | අතිකාල | 16,986,225 | 14,092,107 |
| | නිවාඩු දින ගෙවීම් | 10,171,463 | 8,613,844 |
| | | **335,038,880** | **299,677,029** |
| 8.1.2 | *කෙටිකාලීන මූල්‍ය සහ මූල්‍ය නොවන ප්‍රතිලාභ* | | |
| | බඳවා ගැනීම්, පුහුණු කිරීම් හා සංවර්ධන | 996,766 | 1,693,013 |
| | කාර්ය මණ්ඩල සුභසාධනය | 16,847,846 | 18,353,944 |
| | දිරි දීමනා | 81,067,392 | 74,845,611 |
| | ලබා නොගත් නිවාඩු සඳහා ගෙවීම් | 9,045,013 | 8,094,217 |
| | ප්‍රසාද දීමනා | 48,727,577 | 44,482,478 |
| | වෛද්‍යාධාර වියදම් ප්‍රතිපූර්ණය | 36,952,477 | 29,687,036 |
| | කාර්ය මණ්ඩල ණය පිරිවැය | 18,463,002 | 16,602,334 |
| | නිවාස ණය පොළිය | 12,720,868 | 7,942,535 |
| | සේවක හදිසි අනතුරු වන්දි යෝජනා ක්‍රමය | - | 1,647,856 |
| | | **224,820,940** | **203,349,024** |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| සටහන් | | 2012 | 2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 8.1.3 | ***නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්*** | | |
| | පොළී පිරිවැය | 8,722,615 | 8,007,997 |
| | ප්‍රවර්තන සේවා පිරිවැය | 4,514,458 | 4,145,152 |
| | | **13,237,073** | **12,153,149** |
| 8.1.4 | ***අනෙකුත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ*** | | |
| | සේ. අ. අ. දායකය | 48,197,538 | 43,561,301 |
| | සේ. නි. භා. අ. දායකය | 9,639,228 | 8,712,918 |
| | | **57,836,766** | **52,274,219** |
| 8.1.5 | ***අනෙකුත් සේවක සුභසාධන වියදම්*** | | |
| | උ. වි. ගෙ. බදු | 1,310,687 | 3,429,042 |
| | | **1,310,687** | **3,429,042** |
| | **මුළු මෙහෙයුම් වියදම්** | **632,244,346** | **570,882,463** |
| | **ප්‍රධාන කළමනාකරණ පාර්ශව දීමනා** | | |
| | අධ්‍යක්ෂ දීමනා | 529,500 | 379,500 |
| | | **529,500** | **379,500** |
| 8.2 | **මෙහෙයුම් වියදම්** | | |
| | ගොඩනැගිලි කුලී | 32,391,437 | 31,127,266 |
| | වරිපනම් බදු | 1,428,116 | 545,023 |
| | විදුලිය ගාස්තු | 15,787,012 | 15,103,126 |
| | දුරකථන ගාස්තු | 6,501,801 | 6,575,335 |
| | ජල ගාස්තු | 1,556,531 | 1,358,705 |
| | උපදේශක ගාස්තු | 1,717,061 | 1,214,500 |
| | විගණන ගාස්තු | 800,004 | 553,970 |
| | ආරක්ෂක ගාස්තු | 4,356,416 | 4,576,961 |
| | නීති ගාස්තු | 907,342 | 876,214 |
| | ලේකම් ගාස්තු | 300,000 | 300,000 |
| | තැපැල් හා විදුලි පණිවුඩ | 2,144,107 | 2,072,960 |
| | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 1,370,224 | 1,296,077 |
| | ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ වියදම් | 1,108,191 | 1,097,001 |
| | තොරතුරු තාක්ෂණ වියදම් | 921,695 | 1,063,607 |
| | පුවත්පත් දැන්වීම් සහ වෙළඳ දැන්වීම් | 2,027,637 | 1,968,604 |
| | වාහන රක්ෂණ හා බලපත්‍ර ගාස්තු | 2,477,969 | 2,227,346 |
| | පුවත්පත් හා වාර සඟරා | 527,119 | 599,525 |
| | පරිත්‍යාග | 213,420 | 853,440 |
| | අනෙකුත් රක්ෂණ | 44,312 | 44,445 |
| | කාර්යාලීය නඩත්තු සහ අවශ්‍යතා | 504,664 | 648,448 |
| | මුද්දර බදු | 1,475 | 10,260 |
| | මාධ්‍ය හා ප්‍රචාරණය | 162,086 | - |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

| සටහන් | | 2012 | 2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| | විවිධ වියදම් | 1,877,417 | 2,821,828 |
| | වාහන අළුත්වැඩියාව හා නඩත්තුව | 9,978,497 | 11,073,083 |
| | ඉන්ධන වියදම් | 14,375,808 | 11,795,724 |
| | ගොඩනැගිලි නඩත්තුව | 5,448,880 | 5,831,737 |
| | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නඩත්තුව | 1,772,336 | 1,977,967 |
| | | **110,701,557** | **107,613,150** |
| 8.3 | **මූල්‍ය වියදම්** | | |
| | ආයෝජන කළමනාකරණ ගාස්තු | 235,200 | 235,200 |
| | බැංකු ගාස්තු | 2,246,457 | 2,406,705 |
| | ලියා හරින ලද බොල් ණය | - | 103,484 |
| | සුළු මුදල් අලාභය | - | 11,412 |
| | ලියා හරින ලද ප්‍රතිලාභ මුදාහැරීම් | 3,122 | 17,450 |
| | | **2,484,779** | **2,774,251** |
| | **මුළු මෙහෙයුම් වියදම්** | **745,430,682** | **681,269,865** |
| 8.4 | **සාමාජික වියදම්** | | |
| 8.4.1 | ***සාමාජික ප්‍රතිලාභ*** | | |
| | මරණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය | 49,246,905 | 45,730,216 |
| | නිත්‍ය දුබලතා යෝජනා ක්‍රමය | 5,681,376 | 5,473,887 |
| | අභ්‍යන්තර අක්ෂිකාච සවිකිරීමේ යෝජනා ක්‍රමය | 3,927,975 | 3,997,040 |
| | ශ්‍රමසුව රැකවරණ යෝජනා ක්‍රමය | 20,759,546 | 21,773,206 |
| | හෘද සැත්කම් යෝජනා ක්‍රමය | 53,070,233 | 59,539,543 |
| | වකුගඩු බද්ධ කිරීමේ සැත්කම් යෝජනා ක්‍රමය | 1,119,956 | 1,573,873 |
| | 5 වසර ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය | 74,925,000 | 70,485,000 |
| | උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය | 23,604,000 | 23,640,000 |
| | | **232,334,991** | **232,212,765** |
| 8.4.2 | ***සාමාජික සේවා*** | | |
| | තැපැල් හා විදුලි පණිවුඩ | 19,507,830 | 18,656,657 |
| | ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ | 9,973,719 | 9,873,009 |
| | පරිගණක ලිපිද්‍රව්‍ය | 4,044,244 | 4,070,408 |
| | සේවකයින් දැනුවත් කිරීමේ යෝජනා ක්‍රමය | 235,077 | 438,765 |
| | ගමන් වියදම් හා සංයුක්ත දීමනා | 5,104,520 | 4,355,145 |
| | මාධ්‍ය හා ප්‍රචාරණය | 741,071 | 2,233,131 |
| | සාමාජිකයින් සඳහා වෛද්‍ය උපදේශන ගාස්තු | 21,000 | 23,200 |
| | 5 වසර ශිෂ්‍යත්ව පිරිනැමීමේ වියදම් | 850,685 | 3,566,599 |
| | දැයට කිරුළ ප්‍රදර්ශනය සහ සමාජීය ව්‍යාපෘති | 3,123,761 | 4,602,203 |
| | | **43,601,906** | **47,819,117** |

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට

| සටහන් | | 2012 | 2011 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 8.4.3 | *තොරතුරු තාක්ෂණික සේවා* | | |
| | දෘඩකාංග නඩත්තුව | 3,511,469 | 4,106,602 |
| | මෘදුකාංග නඩත්තුව | 317,353 | 146,925 |
| | ක්ෂයවීම් | 5,987,572 | 5,906,173 |
| | රක්ෂණය | 93,862 | - |
| | රැහැන් බදු කුලී | 4,061,338 | 3,990,294 |
| | | **13,971,594** | **14,149,994** |
| | **මුළු සාමාජික වියදම්** | **289,908,491** | **294,181,876** |
| 9 | ආදායම් බදු | | |
| | ශුද්ධ බදු වියදම | 165,648,658 | 141,008,314 |
| | | **165,648,658** | **141,008,314** |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට

| සටහන් | | 2012 | 2011 | 2011 ජනවාරි 01 දින |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 10 | **විකිණීම පිණිස රඳවා ගත් අනෙකුත් මූල්‍ය වත්කම්** | | | |
| | මිල ප්‍රකාශිත කොටස් ආයෝජන | 8,134,626,575 | 7,228,104,571 | 4,718,542,735 |
| | මිල ප්‍රකාශිත ඒකක | 243,643,959 | 77,744,046 | 77,744,046 |
| | අඩුකළා : මිල ප්‍රකාශිත කොටස් අගය හීනවීමේ ප්‍රතිපාදන | (1,506,638,554) | (911,992,269) | (30,484,127) |
| | | **6,871,631,979** | **6,393,856,348** | **4,765,802,654** |
| 11 | **විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන** | | | |
| | මිල ප්‍රකාශිත නොවූ කොටස් ආයෝජන | 485,834,544 | 485,834,544 | 485,834,544 |
| | පොරොන්දු නෝට්ටු | 12,174,382 | 12,174,382 | 12,174,382 |
| | අඩුකළා : කොටස් අගය හීනවීමේ ප්‍රතිපාදන | - | - | (45,891,044) |
| | පොරොන්දු නෝට්ටු හානිකරණය | (12,174,382) | (12,174,382) | (12,174,382) |
| | | **485,834,544** | **485,834,544** | **439,943,500** |

*සටහන*

ඇවරකරණය සඳහා කොළඹ දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින වණික් ඉන්කෝපරේෂන් ආයතනය විසින් මෙම පොරොන්දු නෝට්ටු නිකුත් කර ඇත. එම නිසා මෙය විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කමක් ලෙස හඳුනාගෙන ඇත. ආරම්භයේදී විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කමක් ලෙස සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති අතර, පසුකාලීනවද සාධාරණ වටිනාකමට මිණුම්කරණය කර ඇත. වෙනස අනෙකුත් විස්තීර්ණ ආදායමට ගලපා ඇත.

| | | | | |
|---|---|---|---|---|
| 12 | **පරිනත වීම තෙක් රඳවා ගත් මූල්‍ය ආයෝජන** | | | |
| | භාණ්ඩාගාර බැඳුම්කර | 120,946,399,942 | 105,628,837,452 | 91,004,458,542 |
| | භාණ්ඩාගාර බිල්පත් | 6,660,949,670 | 8,900,869,526 | 9,910,864,055 |
| | මිල ප්‍රකාශිත ණයකර | 165,201,559 | 150,000,000 | 157,450,259 |
| | *අඩුකළා :* මිල ප්‍රකාශිත ණයකර හානිකරණය | (7,450,259) | (7,450,259) | (8,950,259) |
| | ස්ථාවර තැන්පත් | 2,550,200,000 | 300,200,000 | 1,000,000 |
| | ප්‍රති මිලදී ගැණුම් ගිවිසුම් | 1,327,091,000 | 1,300,555,000 | 1,140,723,000 |
| | මිල ප්‍රකාශිත නොවූ ණයකර | 675,000,000 | 947,450,259 | 931,500,000 |
| | වාණිජ පත්‍ර | 98,295,118 | - | - |
| | බැඳුම්කර - කෙරවළපිටිය විදුලි බල යෝජනා ක්‍රමය | 2,992,000,000 | 2,992,000,000 | 2,992,000,000 |
| | | **135,407,687,030** | **120,212,461,978** | **106,129,045,597** |
| 13 | **මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු ගිණුම්** | | | |
| | රුපියල් ණය | 6,100,000,000 | 6,100,000,000 | 6,100,000,000 |
| | නිවාස මූල්‍ය ණය - ජාතික සංවර්ධන බැංකුව | 770,881,334 | 765,861,991 | 839,464,490 |
| | **කාර්ය මණ්ඩල ණය** | | | |
| | ආපදා ණය | 14,738,483 | 12,948,606 | 6,341,698 |
| | විශේෂ ආපදා ණය | 111,430,984 | 78,492,221 | 127,814,928 |
| | උත්සව අත්තිකාරම් | 934,075 | 730,814 | 972,175 |
| | විශේෂ උත්සව අත්තිකාරම් | 881,810 | 842,994 | 550,100 |
| | විශේෂ අත්තිකාරම් | 3,620,945 | 2,814,475 | 3,652,000 |
| | වාහන ණය | 63,376,940 | 45,704,069 | 58,021,963 |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට

| සටහන් | | 2012 | 2011 | 2011 ජනවාරි 01 දින |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| | පරිගණක ණය | 259,291 | 247,403 | - |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු සේවක නිවාස ණය | 168,563,891 | 129,638,973 | 127,095,331 |
| | සුනාමි සහන ණය | 2,450 | 7,135 | 7,497 |
| | | **7,234,690,204** | **7,137,288,683** | **7,263,920,182** |

සටහන
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ට අනුව කාර්ය මණ්ඩල ණය වෙළඳපොළ අනුපාතයන්ට සංසන්දනාත්මකව සාධාරණ වටිනාකමට මිණුම්කරණය කර ඇත. මෙම වටිනාකම ගණනය කිරීම සඳහා 12% ක අනුපාතය යොදාගැනීමෙන් සාධාරණ වටිනාකමට මිණුම්කරණය කර ඇත. එනම් ණය ප්‍රදානය කරන දිනයට ව්‍යවසාය විසින් එහි හොඳම පාරිභෝගිකයාට පිරිනැමෙන පොළී අනුපාතය පදනම කරගෙනය.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද නිර්දේශය මත 2011 ජනවාරි 01 දිනට පෙර ප්‍රදානය කරන ලද ණය 2011 ජනවාරි 01 දිනට සම්පූර්ණයෙන් නිරවුල් කළ ලෙස සැලකෙන අතර නව ණය මුදලක් සේ එදිනම එම මුදලම ප්‍රදානය කළ ලෙස සැලකේ.

| | | | | |
|---|---|---|---|---|
| 14 | **අනෙකුත් වත්කම්** | | | |
| | ***උපචිත ආදායම්*** | | | |
| | ලැබිය යුතු පොළී | 3,242,466,116 | 3,260,625,621 | 3,990,989,148 |
| | අඩුකළා : අඩමාන ආදායම් සඳහා ප්‍රතිපාදන | (27,865,633) | (27,865,633) | (33,365,633) |
| | | **3,214,600,483** | **3,232,759,988** | **3,957,623,515** |
| | ***ලැබිය යුතු ගිණුම් සහ පූර්ව ගෙවීම්*** | | | |
| | ලැබිය යුතු දායක මුදල් | 1,118,136,952 | 961,345,946 | 830,072,745 |
| | මුදල් ඇණවුම් පාලක ගිණුම | 3,785,984 | - | - |
| | තැපැල් මුද්‍රා යන්ත්‍ර අග්‍රිමය | 166,768 | 234,293 | 96,249 |
| | විවිධ ණයගැතියෝ | 2,132,868 | 2,743,747 | 78,718,965 |
| | හිටපු සේවකයින්ගෙන් අයවිය යුතු මුදල් | 1,580,019 | 967,811 | 623,719 |
| | ආරක්ෂිත තැන්පතු | 2,972,189 | 2,926,800 | 2,790,300 |
| | පූර්ව ගෙවීම් | 11,889,237 | 7,717,723 | 14,125,149 |
| | කාර්ය මණ්ඩල ණය පෙරගෙවුම් පිරිවැය | 61,296,779 | 79,759,781 | - |
| | අත්තිකාරම් ගෙවීම් | 488,850 | 2,775,634 | 1,621,307 |
| | වැඩියෙන් ගෙවන ලද ප්‍රතිලාභ | - | 2,280 | 2,280 |
| | සමර්විල් සහ සමාගම - තැන්පතු | 21,900,000 | 21,900,000 | 21,900,000 |
| | වෛද්‍යාධාර අත්තිකාරම් | 15,000 | 45,000 | 150,000 |
| | ක්‍රීඩා සමාජය | 1,800,000 | - | 20 |
| | | **1,226,164,645** | **1,080,419,015** | **950,100,734** |
| | ***අයකරගත යුතු බදු*** | | | |
| | ආදායම් බදු අත්තිකාරම් | 3,951,562 | 3,968,000 | - |
| | | **3,951,562** | **3,968,000** | - |
| | ***ලිපිද්‍රව්‍ය තොග ඇතුළු අනෙකුත් ද෴*** | | | |
| | ලිපිද්‍රව්‍ය තොග සහ මුද්‍රණ ද්‍රව්‍ය | 6,937,588 | 4,933,319 | 3,763,586 |
| | | **6,937,588** | **4,933,319** | **3,763,586** |
| | | **4,451,654,278** | **4,322,080,322** | **4,911,487,835** |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට

15.1 දේපළ, පිරියත සහ උපකරණ

| | ඉඩම් සහ ගොඩනැගිලි | මෝටර් වාහන | සවිකිරීම් සහ වැද්දුම් | පරිගණක උපකරණ | ලීබඩු සහ අනෙකුත් උපකරණ | එකතුව |
|---|---|---|---|---|---|---|
| *පිරිවැය* | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | 20,000,000 | 110,979,263 | 15,809,800 | 120,108,473 | 45,251,615 | 312,149,151 |
| එකතු කිරීම් | 8,357,423 | 17,164,384 | - | 8,077,361 | 5,829,591 | 39,428,759 |
| අපහරණයන් | - | (4,442,675) | - | (999,506) | (694,703) | (6,136,884) |
| ප්‍රත්‍යාගණනයන් | - | - | - | - | - | - |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **28,357,423** | **123,700,972** | **15,809,800** | **127,186,328** | **50,386,503** | **345,441,026** |
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 28,357,423 | 123,700,972 | 15,809,800 | 127,186,328 | 50,386,503 | 345,441,026 |
| එකතු කිරීම් | 19,330,155 | 19,430,000 | - | 6,449,410 | 7,064,371 | 52,273,935 |
| අපහරණයන් | - | (6,563,800) | - | - | (613,409) | (7,177,209) |
| ප්‍රත්‍යාගණනයන් | - | - | - | - | - | - |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **47,687,578** | **136,567,172** | **15,809,800** | **133,635,738** | **56,837,465** | **390,537,752** |
| *සමුච්චිත ක්ෂයවීම්* | | | | | | |
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | - | 57,628,327 | 14,929,742 | 62,119,233 | 25,726,508 | 160,403,810 |
| වර්ෂයට අදාළ ක්ෂයවීම් | - | 15,010,770 | 252,497 | 6,982,256 | 3,565,426 | 25,810,949 |
| අපහරණයන් | - | (4,299,905) | - | (855,020) | (591,649) | (5,746,574) |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | **68,339,192** | **15,182,239** | **68,246,469** | **28,700,285** | **180,468,185** |
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | - | 68,339,192 | 15,182,239 | 68,246,469 | 28,700,285 | 180,468,185 |
| වර්ෂයට අදාළ ක්ෂයවීම් | - | 15,345,066 | 180,591 | 7,199,644 | 3,855,441 | 26,580,742 |
| අපහරණයන් | | (4,242,067) | - | - | (510,384) | (4,752,451) |
| **2012 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | **79,442,191** | **15,362,830** | **75,446,113** | **32,045,342** | **202,296,476** |
| *ශුද්ධ පොත් අගය* | | | | | | |
| 2011 ජනවාරි 01 දිනට ශේෂය | **20,000,000** | **53,350,936** | **880,058** | **57,989,240** | **19,525,107** | **151,745,341** |
| 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය | **28,357,423** | **55,361,780** | **627,561** | **58,939,859** | **21,686,218** | **164,972,841** |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | **47,687,578** | **57,124,981** | **446,970** | **58,189,625** | **24,792,122** | **188,241,276** |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට

| සටහන් | | 2012 | 2011 | 2011 ජනවාරි 01 දින |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 15.2 | **අස්පෘශ්‍ය වත්කම් - පරිගණක මෘදුකාංග** | | | |
| | කාලච්ඡේදය ආරම්භයට | 1,002,291 | 1,401,501 | 3,232,004 |
| | ක්‍රමක්ෂය | (284,821) | (399,210) | (1,830,503) |
| | කාලච්ඡේදය අවසානයට | 717,470 | 1,002,291 | 1,401,501 |
| 16 | **ආයෝජන දේපළ** | | | |
| | කාලච්ඡේදය ආරම්භයට | 3,200,000,000 | 1,358,000,000 | 1,358,000,000 |
| | සාධාරණ වටිනාකමේ වෙනස්වීම් | - | 1,842,000,000 | - |
| | කාලච්ඡේදය අවසානයට | **3,200,000,000** | **3,200,000,000** | **1,358,000,000** |
| 17 | **අනෙකුත් බැරකම්** | | | |
| | නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව | 90,119,163 | 79,296,500 | 72,799,970 |
| | ***ගෙවිය යුතු ගිණුම් සහ විවිධ ණයහිමියෝ*** | | | |
| | ක්‍රීඩා සමාජය | - | 1,220 | - |
| | ප්‍රතිලාභ ආපසු ගෙවීම් මත රඳවා ගත් බදු | 3,751,289 | 5,133,956 | 4,589,382 |
| | ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවිය යුතු මුද්දර බදු | 451,320 | 407,570 | 386,445 |
| | නොගෙවූ වේතන | 21,913 | 114,775 | 116,683 |
| | වැටුප් ගෙවීම් මත ගෙවිය යුතු මුද්දර බදු | 72,975 | 62,325 | 54,600 |
| | අධිකාරී සේවක අර්ථසාධක අරමුදල | 9,009,022 | 8,327,287 | 7,278,381 |
| | විවිධ ණය හිමියෝ | 23,297,357 | 67,651,660 | 39,916,592 |
| | ඉල්ලුම් නොකළ ප්‍රතිලාභ ආපසු ගෙවීම් | 5,149,573 | 4,575,055 | 3,555,679 |
| | අඩුවෙන් ගෙවූ ප්‍රතිලාභ | - | 3,229 | 3,229 |
| | නොගෙවූ මරණ ප්‍රතිලාභ | 7,573,889 | 7,017,309 | 6,699,317 |
| | උ. වි. ගෙ. බදු | 770,924 | 2,703,710 | 118,709 |
| | රඳවාගත් රඳවා ගැනීමේ බදු | - | - | 544,561 |
| | එකතුකළ අගය මත බදු | 208,992 | 208,992 | 209,228 |
| | රඳවාගත් එකතුකළ අගය මත ගෙවිය යුතු බදු ප්‍රතිපාදනය | - | - | 174,085 |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද | 34,760 | 34,760 | 53,753 |
| | ඉල්ලුම් නොකළ ශිෂ්‍යත්ව අරමුදල් | 2,367,110 | 2,451,941 | 1,774,791 |
| | ආපසු එවන ලද ප්‍රතිලාභ | 13,905,162 | 11,749,478 | 11,485,846 |
| | වැටුප් අවකරණ නිෂ්කාශන | 160,727 | 144,062 | 151,146 |
| | ***බැංකු අයිරාව*** | | | |
| | මහජන බැංකුව - ජ/ගි 149 | - | 6,534,623 | 17,858,690 |
| | මහජන බැංකුව - ජ/ගි 249 | - | 102,145,699 | - |
| | කොමර්ෂල් බැංකුව - ජ/ගි 800 | - | 2,911,374 | - |
| | | **156,894,176** | **301,475,525** | **167,771,087** |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා සටහන්

දෙසැම්බර් 31 දිනට

| සටහන් | | 2012 | 2011 | 2011 ජනවාරි 01 දින |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| | **නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව** | | | |
| | ජනවාරි 01 දිනට ආරම්භක නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව | 79,296,500 | 72,799,970 | - |
| | පොළී පිරිවැය | 8,722,615 | 8,007,997 | - |
| | ප්‍රවර්ථන සේවා පිරිවැය | 4,514,458 | 4,145,152 | - |
| | ප්‍රතිලාභ ගෙවීම් | (3,689,927) | (5,379,228) | - |
| | බැඳියාව මත ආයුගණන (ලාභ) / අලාභ | 1,275,517 | (277,391) | - |
| | දෙසැම්බර් 31 දිනට අවසාන නිශ්චිත ප්‍රතිලාභ බැඳියාව | **90,119,163** | **79,296,500** | **72,799,970** |
| 18 | **ප්‍රතිපාදන** | | | |
| | විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 2,350,004 | 1,550,000 | 4,042,549 |
| | දුරකථන ගාස්තු සඳහා ප්‍රතිපාදන | 46,180 | 179,059 | 59,213 |
| | සේවක අනතුරු වන්දි යෝජනා ක්‍රමය සඳහා ප්‍රතිපාදන | 2,000,000 | 2,000,000 | 2,000,000 |
| | ප්‍රසාද දීමනා ප්‍රතිපාදන | 5,428 | 341,312 | 149,222 |
| | ලබා නොගත් නිවාඩු ගෙවීම් සඳහා ප්‍රතිපාදන | 7,846,571 | 6,895,144 | 6,570,000 |
| | තැපැල් ගාස්තු සඳහා ප්‍රතිපාදන | 1,164,401 | 1,524,580 | 1,461,721 |
| | උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව සඳහා ප්‍රතිපාදන | 24,084,000 | 3,576,000 | - |
| | | **37,496,585** | **16,066,095** | **14,282,705** |
| 19 | **ස්කන්ධය සහ සංචිත** | | | |
| | ජනවාරි 01 දිනට සාමාජික අරමුදල | 135,486,300,792 | 119,852,873,251 | 103,057,082,969 |
| | **අඩුකළා** : පසුගිය වර්ෂය සඳහා ගෙවූ දායක මුදල් සහ පොළී | 850,297 | 1,082,778 | 227,982 |
| | | 135,485,450,495 | 119,851,790,473 | 103,056,854,987 |
| | වර්ෂය තුළ ලද ශුද්ධ දායක මුදල් | 4,179,481,927 | 3,317,573,883 | 3,479,032,347 |
| | **එකතුකළා:** සාමාජික අරමුදල සඳහා පොළී 3.0% | 4,189,947,973 | 3,695,080,931 | 3,196,076,620 |
| | ලාභාංශ 7.0% | 9,776,545,270 | 8,621,855,505 | 10,120,909,297 |
| | **දෙසැම්බර් 31 දිනට සාමාජික අරමුදල** | **153,631,425,664** | **135,486,300,792** | **119,852,873,251** |
| | **සංචිත** | | | |
| | රඳවාගත් ලාභ | 14,130,436,383 | 12,569,765,088 | 13,061,167,810 |
| | ලාභාංශ තුලන සංචිත අරමුදල | 3,000,000,000 | 4,000,000,000 | 4,000,000,000 |
| | රඳවාගත් ඉපයීම් ගිණුමට මාරුකිරීම් | (2,000,000,000) | (1,000,000,000) | - |
| | ප්‍රත්‍යාගණන සංචිතය | 3,155,730,470 | 3,155,730,470 | 1,313,730,470 |
| | **ස්කන්ධය සහ සංචිත** | **171,917,592,517** | **154,211,796,350** | **138,227,771,531** |
| | **අඩුකළා** : සාමාජික අරමුදල සඳහා පොළී 3.0% | 4,189,947,973 | 3,695,080,931 | 3,196,076,620 |
| | ලාභාංශ 7.0% | 9,776,545,270 | 8,621,855,505 | 10,120,909,297 |
| | **ස්කන්ධය සහ සංචිත** | **157,951,099,275** | **141,894,859,914** | **124,910,785,614** |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා සටහන්

2011 ජනවාරි 01 දිනට ව්‍යවසායේ ස්කන්ධ සැසඳුම
(ශ්‍රී.ල.මු.වා. ප්‍රමිතයන්ට මාරුවීමේ දිනය

| | පූර්ව පො.ස.ගි.මු. | ප්‍රති මිණුම්කරණ | ශ්‍රීලමුවාප්‍ර/ශ්‍රීලගිප්‍ර |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| මුදල් සහ මුදල් සමානයන් | 265,992,240 | - | 265,992,240 |
| දිගු කාලීන ආයෝජන | 103,068,479,306 | (103,068,479,306) | - |
| කෙටි කාලීන ආයෝජන | 15,818,389,708 | (15,818,389,708) | - |
| ලිපි ද්‍රව්‍ය තොග සහ මුද්‍රණ ද්‍රව්‍ය | 3,763,586 | (3,763,586) | - |
| ලැබිය යුතු ගිණුම් | 5,232,179,942 | (5,232,179,942) | - |
| විකිණීම සඳහා රඳවාගත් අනෙකුත් මූල්‍ය වත්කම් | - | 4,765,802,654 | 4,765,802,654 |
| විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන | - | 439,943,500 | 439,943,500 |
| පරිනතවීම තෙක් රඳවාගත් මූල්‍ය ආයෝජන | - | 106,129,045,597 | 106,129,045,597 |
| මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු ගිණුම් | - | 7,263,920,182 | 7,263,920,182 |
| අනෙකුත් වත්කම් | - | 4,911,487,835 | 4,911,487,835 |
| දේපළ, පිරියත සහ උපකරණ | 1,511,146,843 | (1,359,401,501) | 151,745,341 |
| අස්පෘශ්‍ය වත්කම් - පරිගණක මෘදුකාංග | - | 1,401,501 | 1,401,501 |
| ආයෝජන දේපළ | - | 1,358,000,000 | 1,358,000,000 |
| **මුළු වත්කම්** | **125,899,951,625** | **(612,612,775)** | **125,287,338,850** |
| **වගකීම් සහ ස්කන්ධය** | | | |
| ප්‍රතිපාදන | 158,159,293 | (143,876,588) | 14,282,705 |
| ගෙවිය යුතු ගිණුම් | 285,894,576 | (285,894,576) | - |
| බැංකු අයිරාව | 17,858,690 | (17,858,690) | - |
| අනෙකුත් බැරකම් | - | 362,270,531 | 362,270,531 |
| සාමාජික අරමුදල | 119,852,873,251 | - | 119,852,873,251 |
| සංචිත | 5,585,165,815 | (527,253,452) | 5,057,912,363 |
| **මුළු වගකීම් සහ ස්කන්ධය** | **125,899,951,625** | **(612,612,775)** | **125,287,338,850** |

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සඳහා සටහන්

2011 දෙසැම්බර් 31 දිනෙන අවසන් වූ වර්ෂයේ ව්‍යවසායේ මුළු විස්තීර්ණ ආදායම් සැසඳුම

| ආදායම් | සටහන් | පූර්ව පො.ස.ගි.මු. | ප්‍රති ගිණුම්කරණ | ශ්‍රීලමුවාප්‍ර/ශ්‍රීලගිප්‍ර |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| ආයෝජන ආදායම | | 13,126,827,076 | (164,355,257) | 12,962,471,819 |
| ලාභාංශ ආදායම | | - | 164,355,257 | 164,355,257 |
| මිල ප්‍රකාශිත කොටස් විකිණීමෙන් ලාභය | 1 | - | (554,940,657) | (554,940,657) |
| කාර්ය මණ්ඩල ණය මත ආදායම | 2 | - | 9,009,162 | 9,009,162 |
| අනෙකුත් ආදායම් | | 243,816,462 | 8,055,902 | 251,872,364 |
| ලාභාලාභ ගිණුම හරහා මූල්‍ය වත්කම් හා වගකීම් මත ශුද්ධ ලාභ/(අලාභ) | | | (280,676,440) | (280,676,440) |
| | | **13,370,643,538** | **(818,552,033)** | **12,552,091,505** |
| **වියදම්** | | | | |
| මෙහෙයුම් / කාර්ය මණ්ඩල/මූල්‍ය වියදම් | 3 | (699,470,956) | (2,102,895) | (701,573,851) |
| සාමාජික වියදම් | | (294,181,877) | - | (294,181,876) |
| ප්‍රතිලාභ ගෙවීම් මත පොළිය | | (108,106,649) | - | (108,106,649) |
| මුළු මෙහෙයුම් වියදම් | | (1,101,759,482) | (2,102,895) | (1,103,862,376) |
| **මෙහෙයුම් ලාභය** | | 12,268,884,056 | (820,654,928) | 11,448,229,129 |
| ආදායම් බදු | | (141,008,314) | - | (141,008,314) |
| **ශුද්ධ ආදායම** | | **12,127,875,742** | **(820,654,928)** | **11,307,220,815** |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | | | |
| වත්කම් ප්‍රත්‍යාගණනය මත ශුද්ධ ලාභ/(අලාභ) | | - | - | 1,842,000,000 |
| පරිනත වීම තෙක් රඳවාගත් මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) | | - | - | 511,084,990 |
| විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභ/(අලාභ) | | - | - | 7,000,000 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් | | - | - | 277,391 |
| **ආදායම් බදු අඩුකළ පසු අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | - | - | **2,360,362,381** |
| **ආදායම් බදු අඩුකළ පසු මුළු විස්තීර්ණ ආදායම** | | **-** | **-** | **13,667,583,195** |

*සටහන 1* - මිල ප්‍රකාශිත කොටස් විකුණුම් ලාභය රු. 554,940,657/-

*සටහන 2* - කාර්ය මණ්ඩල ණය මත පොළී ආදායම රු. 9,009,162/-

*සටහන 3* - පාරිතෝෂික අධි ප්‍රතිපාදන ප්‍රතිවර්ථනය රු. 14,499,439/- හා කාර්ය මණ්ඩල ණය සාධාරණ වටිනාකම ගැළපීම මත අලාභය රු.16,602,334.06

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.1 සාංගමික තොරතුරු

#### 1.1.1 නෛතික සහ ලියාපදිංචි ආකෘතිය

1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ 1981 මාර්තු 01 දින ස්ථාපිත කරන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය කොළඹ පිහිටි රාජ්‍ය සංස්ථාවකි. කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරන ලදුව, 1997 දී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතට අනුයුක්ත කරන ලදී.

#### 1.1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය

රාජ්‍ය සේවා විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සියළුම රාජ්‍ය සහ පෞද්ගලික අංශ සේවකයින් මෙම මණ්ඩලයේ සාමාජිකයන් වන අතර, එම ආයතනයන්හි සේවා යෝජකයින් එකී සේවකයින්ගේ දළ මාසික ඉපයීමෙන් 3% ක් මෙම අරමුදලට ප්‍රේෂණය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම අරමුදලේ පාලනයට අමතරව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය එහි සාමාජිකයන් වෙනුවෙන් සාමාජීය හා සුභසාධන ප්‍රතිලාභයන් රැසක් ලබා දීමේ කාර්යයන්හි ද නිරතව සිටී.

#### 1.1.3 නිකුත් කිරීම සඳහා අනුමැතිය සහ දිනය

2013 පෙබරවාරි 27 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

### 1.2 පිළියෙල කිරීමේ පදනම

සාධාරණ වටිනාකමට අගය කරන ලද ඇතැම් වත්කම් හා බැරකම් හැර මූල්‍ය ප්‍රකාශනයන් ඓතිහාසික පිරිවැය පදනමට පිළියෙල කරන ලදී. වෙනත් අයුරකින් දක්වා නොමැති නම් සියළුම අගයයන් ආසන්න රුපියලට වටයන ලදී.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන්ට අනුගත වීමේදී, මණ්ඩලය විසින් වාර්තා කරන ලද මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය සහ අරමුදල් ප්‍රවාහ ප්‍රකාශයන්ට වන බලපෑම් පිළිබඳව පැහැදිලි කිරීම් සටහන් හි දැක්වේ.

### 1.3 අනුකූලතා ප්‍රකාශනය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාර පිළියෙල කර තිබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කොට ඇත.

## 1.4 ප්‍රථම වරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිත කිරීම (SLFRS/LKAS)

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය ඇතුළු ඉකුත් කාලච්ඡේදයන් සඳහා මුල්‍ය ප්‍රකාශනයන් පූර්ව මූල්‍ය වාර්තාකරන ආකෘතිය අනුකූලව සකස් කරන ලදී.

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මුල්‍ය ප්‍රකාශනයන් සහ සංසන්දනාත්මක මුල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කරන ලදී. මෙම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්ට සමගාමී වේ. මෙය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මුල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කරන ලද ප්‍රථම අවස්ථාව වේ. මෙම මුල්‍ය ප්‍රකාශන සැකසීමේදී, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය මෙම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුගත වීමේ දිනය 2011 ජනවාරි 01 ලෙස සලකා මුල්‍ය තත්ත්වය ප්‍රකාශ කොට ඇත.

**අදාළ නිදහස් කිරීම්**

*ශ්‍රී.ල.මූ.වා.ප්‍ර 1* - ප්‍රථම වරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කරන්නන් සඳහා ඇතැම් නිදහස් කිරීම් අතීතානුයෝගීව අදාල කරගැනීමට අවස්ථාව සළසා ඇත.

ව්‍යවසාය පහත දැක්වෙන නිදහස් කිරීම් අදාල කර ඇත:

- **කල්බදු (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර 1 D9)**

  ප්‍රථම වරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතය සඳහා අවතීර්ණ වන දිනයේදී පැවැති කරුණු සහ අවස්ථාවන් පැරණි තත්ත්වයන් මත පදනම්ව තීරණය කිරීමට ඉඩකඩ සලසා ඇත.

- **සේවක ප්‍රතිලාභ (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර 1 D10)**

  පිළිගත් පොදු ගිණුම් මූලධර්ම යටතේ මීට ප්‍රථම හඳුනා නොගත් ආයුගණන ලාභ හෝ පාඩු ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුගතවන දිනයේදී සමුච්චිත ආයුගණන ලාභ හෝ අලාභ ලෙස හඳුනාගත හැක. මෙය ඉදිරියේදී උද්ගත වන ආයුගණන ලාභ හෝ අලාභ සඳහා පරාස පිවිසුමක් සේ භාවිත කළ හැක.

- **පූර්වයෙන් හඳුනාගත් මූල්‍ය සාධන පත්‍ර (ශ්‍රී.ල.මූ.වා.ප්‍ර 1 D19)**

  ප්‍රථම වරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතය සඳහා අවතීර්ණ වන්නන්ට මූල්‍ය වත්කම් හා බැරකම් සාධාරණ අගයට ලාභ හෝ අලාභ ලෙස නිර්ණය කිරීමට හෝ අනුගත වන දිනයේදී විකිණීම සඳහා පවතින බවට නිර්ණය කිරීමට ඉඩකඩ සලසා ඇත.

## 1.5 අඛණ්ඩ පැවැත්ම

අඛණ්ඩව මණ්ඩලය පවත්වාගැනීමේ හැකියාව පිළිබඳව මණ්ඩලීය කළමණාකාරිත්වය තක්සේරු කර ඇති අතර, සැලකිය යුතු අනාගත කාලච්ඡේදයක් දක්වා මණ්ඩලය පවත්වා ගත හැකි සම්පත් මණ්ඩලය සතුව ඇත. එතෙකුදු වුවත් සැලකිය යුතු ඇතැම් අවිනිශ්චිතතාවයන් අඛණ්ඩ පැවැත්ම කෙරෙහි ඇතිවේයයි මණ්ඩලය නොදනී. එබැවින්, අඛණ්ඩ පැවැත්මේ පදනම මත පිහිටා මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

## 1.6 ආදායම

මණ්ඩලය වෙත ආර්ථික ප්‍රතිඵල ගලා ඒමේ හැකියාව සහ ආදායම නිසැකවම මැනිය හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. ආදායම හඳුනා ගැනීමට පෙර පහත දැක්වෙන උපමානයන් ද සපුරාලිය යුතුය.

### 1.6.1 පොළී සහ සමාන ආදායම් සහ වියදම්

ක්‍රමක්ෂය පිරිවැයට වටිනාකම් ගණනය කරන ලද මූල්‍ය උපකරණ, විකිණීම සඳහා ඇති පොළි හිමි මූල්‍ය වත්කම්, ලාභාඅලාභ මත සාධාරන අගය නිර්නය කරන මූල්‍ය වත්කම් වල පොළි ආදායම හෝ වියදම සඵල පොළි අනුපාත භාවිතයෙන් වාර්තා කරනු ලැබේ. සඵල පොළි අනුපාතිකය යනු මූල්‍ය වත්කම් හෝ මූල්‍ය බැරකමෙහි ධාරන වටිනාකම මත එහි අපේක්ෂිත ජීව කාලය හෝ අවශ්‍ය පරිදි ඊට අඩු කාලයකදී ලැබෙන හෝ ගෙවන වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල අනුපාතිකය වේ. මූල්‍ය උපකරණයන්හි සියළුම ගිවිසුම්ගත කරුණු උදාහරනයක් ලෙස හෝ ගෙවීම් වරනයන් ගණනය කිරීම සඳහා සලකා බැලෙන අතර, අනාගත ණය අලාභයන් හැර සෘජුවම ආරෝපනය කල හැකි ගාස්තු හා වර්ධක පිරිවැය සඵල පොළි අනුපාතිකයෙහි අදාළ කොටසක් වේ.

හානිකරණ අලාභයක් හේතුවෙන් මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වත්කම් සමූහයක වාර්තාකරණ ලද වටිනාකමක් අඩුකරනු ලබන විට හානිකරණ අලාභය ගණනය කිරීමේ අරමුණ සඳහා අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට භාවිතා කළ මුල් පොළී අනුපාතයට අනුව පොළී ආදායම අඛණ්ඩව හඳුනාගනු ලැබේ.

### 1.6.2 ලාභාංශ ආදායම්

ලාභාංශ ආදායම මණ්ඩලය වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනා ගනු ලැබේ.

### 1.6.3 අනෙකුත් ආදායම්

සේවකයින්ගේ සේවා කාලය පදනම්ව ක්‍රමක්ෂය කරනු ලබන සේවක ණය මත ලැබෙන සාධාරණ වටිනාකම මත ගණනය කරනු ලබන පොලී ආදායම හැර අනෙකුත් ආදායම් මණ්ඩලය වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

## 1.7 ව්‍යවහාරික සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ව්‍යවහාරික මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල වේ. සියළු මූල්‍ය විස්තර ශ්‍රී ලංකා රුපියල් මඟින් ඉදිරිපත් කර ඇත.

## 1.8 මූල්‍ය සාධන පත්‍ර ආරම්භක හඳුනා ගැනීම සහ පසුකාලීන මිනුම්කරණය

### හඳුනාගැනීමේ දිනය

මූල්‍ය වත්කම් සහ වගකීම් ප්‍රථමයෙන්ම වෙළඳ දිනයේදී හඳුනාගනු ලැබේ. එනම් එම සාධන පත්‍රයන්ගේ ගිවිසුම් ප්‍රතිපාදනයන්හි පාර්ශවකරුවන් වශයෙන් මණ්ඩලය පත්වූ දිනයයි. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණනු මූල්‍ය වත්කම් වූකලී සාමාන්‍ය රෙගුලාසි මඟින් හෝ වෙළඳපොළෙහි පවත්නා සම්ප්‍රදාය මඟින් නියමිත කාල රාමුව තුළදී භාරදිය යුතුව මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ හෝ මූල්‍ය වත්කම් වන්නේය.

**මූල්‍ය සාධන පත්‍ර ආරම්භක මිනුම්කරණය**

මූල්‍ය සාධන පත්‍ර ආරම්භයේදී හඳුනාගැනීම සහ වර්ගීකරණය එහි අරමුණ සහ ලක්ෂණ මෙන්ම ඒවා අත්පත් කර ගැනීමේ කළමනාකාරිත්වයේ අරමුණු මත රඳා පවතී. ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට වාර්තා කරනු ලබන මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හැර අනිකුත් සියළුම මූල්‍ය සාධන පත්‍ර ආරම්භයේදී ඒවායේ සාධාරණ වටිනාකමට අත්පත් කර ගැනීමේ පිරිවැය එකතුකර මිණුම්කරණය කරනු ලැබේ.

**විකිණීම පිණිස රඳවා ගත් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය බැරකම්**

විකිණීම පිණිස රඳවා ගත් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සාධාරණ වටිනාකමට සටහන් කරනු ලැබේ. සාධාරණ වටිනාකමෙහි වෙනස්වීම් ආදායම් ප්‍රකාශනයේදී හඳුනාගනු ලැබේ. පොළී සහ ලාභාංශ ආදායම් හෝ වියදම් ගිවිසුමේ වගන්ති ප්‍රකාර ආදායම් ප්‍රකාශනයේ වාර්තා කිරීම හෝ ගෙවීම් සඳහා අයිතිය ප්‍රතිෂ්ඨාපනය වූ පසු සටහන් කරනු ලැබේ. මෙම වර්ගීකරණයෙහි ඇතුළත් ස්කන්ධ මූලිකවම නුදුරු කාලච්ඡේදයක විකිණීම හෝ යළි මිලදී ගැනීමේ පරමාර්ථයෙන් අත්පත් කරගත් ඒවා වේ.

**ලාභ අලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට නම්කරන ලද මූල්‍ය වත්කම් හෝ මූල්‍ය බැරකම්**

ආරම්භක හඳුනාගැනීම අනුව කළමනාකාරිත්වය විසින් වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් මේ යටතේ දැක්වේ. කළමනාකාරිත්වය විසින් පහත සඳහන් නිර්ණායකයන් සපුරාලීම අනුව  පමණක් ලාභ හෝ අලාභ මත උපකරණයක සාධාරන වටිනාකම ආරම්භක හඳුනාගැනීමේදී නිර්නය කරනු ලබන අතර, මෙම නිර්නය කිරීම උපකරණයෙන් උපකරණයට පදනම මත තීරණය කරනු ලැබේ.

- වත්කම් හෝ බැරකම් හෝ ඒ මත රැඳි ලාභ හෝ අලාභ වෙනස් පදනම් මත මිණුම්කරනයේදී මතුවන ඒකාකාරී නොවන ප්‍රතිකර්මයන් සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමක් හෝ සැළකිය යුතු ලෙස අඩුකිරීමක් මෙමඟින් සිදු වීම.
- ලේඛණගත අවදානම් කළමනාකරණය හෝ ආයෝජන උපායමාර්ගයන් අනුව සාධාරණ වටිනාකම් පදනම මත කාර්යක්ෂමතාව අගය කරනු ලබන මෙම වත්කම් සහ බැරකම්, මූල්‍ය වත්කම් සහ බැරකම් සමූහයක හෝ දෙවර්ගයේම කොටසකි.

ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට ගලපන මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාධාරණ වටිනාකමට වාර්තා කෙරේ. සාධාරණ වටිනාකමෙහි වෙනස ලාභාලාභ ගිණුම හරහා සාධාරණ වටිනාකමට නිර්නය කරන ලද මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම්වල ශුද්ධ ලාභ හා අලාභ අතර වෙනස වාර්තා කරනු ලැබේ. පිළිවෙලින් පොළී ඉපැයුම් සහ දරන ලද පොළී "පොළී ආදායම්" සහ "පොළී වියදම්" ලෙස සඵල පොළී අනුපාතය භාවිතයෙන් උපචිත කරනු ලබන අතර, ලාභාංශ ආදායම, ලැබීමේ අයිතිය තහවුරුවූ පසු ආදායම් ප්‍රකාශයෙහි "ලාභාංශ ආදායම" යටතේ වාර්තා කරනු ලැබේ.

**විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන**

විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජනයන්ට ණය සුරැකුම්පත් අන්තර්ගත වේ. මෙම වර්ගීකරණයට අදාළ ණය සුරැකුම්පත් අවිනිශ්චිත කාලච්ඡේදයක් සඳහා රඳවා ගැනීමට අපේක්ෂිත වූ සහ වෙළඳපොළ තත්ත්වයන්හි වෙනස්කම් සහ ද්‍රවශීලතා අවශ්‍යතාවන් මත විකිණීමට ඇති ආයෝජනයන් වේ.

විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන පළමුවර මිනුම්කරණයෙන් පසුකාලීනව සාධාරණ වටිනාකමට මිනුම්කරණය කරනු ලැබේ. උපලබ්ධි නොවූ ලාභ සහ අලාභ ඍජුවම ස්කන්ධයන්හි "අලෙවිය සඳහා ඇති සංචිත" (අනෙකුත් විස්තීර්ණ ආදායම්) ලෙස හඳුනා ගනු ලැබේ. ආයෝජනයන් අපහරණය කලවිට ස්කන්ධයන්හි කලින් හඳුනා ගෙන තිබූ සමුච්චිත ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයේ "අනෙකුත් ආදායම්" ලෙස හඳුනා ගනු ලැබේ. විකිණීම සඳහා රඳවා තිබූ මූල්‍ය ආයෝජනයන්ගෙන් ඉපැයූ පොළී ආදායම් සඵල පොළී අනුපාතය භාවිතයෙන් පොළී ආදායම් ලෙස වාර්තා කරනු ලැබේ. විකිණීම සඳහා රඳවා තිබූ මූල්‍ය ආයෝජනයන් සඳහා වූ ලාභාංශ ආදායම් ලැබීමේ අයිතිය තහවුරු වූ පසු "අනෙකුත් ආදායම්" යටතේ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. එවැනි ආයෝජන හානිකරණයෙන් ඇතිවන අලාභ ආදායම් ප්‍රකාශනයෙහි "මූල්‍ය ආයෝජනයන්ගේ හානිකරණ අලාභ" ලෙස හඳුනා ගන්නා අතර "විකිණීම සඳහා ඇති සංචිතයන්ගෙන්" ඉවත් කරනු ලැබේ.

**පරිනත වීම තෙක් රඳවාගත් ආයෝජන**

පරිනත වීම තෙක් රඳවාගත් ආයෝජන ලෙස ස්ථාවර හෝ නිගමනය කල හැකි ගෙවීම් සහ ස්ථාවර කල්පිරීම් හේතුවෙන් මණ්ඩලයට අභිප්‍රායයක් සහ කල්පිරීම තෙක් රඳවා ගැනීමට ඇති හැකියාව හේතුවෙන් කල්පිරීම තෙක් රඳවාගත් ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වශයෙන් සැළකිය හැකිය. පරිනත වීම තෙක් රඳවාගත් ආයෝජන ආරම්භක මිනුම්කරණයෙන් අනතුරුව හානිකරණ අලාභ ඉවත්කර සඵල පොළී අනුපාතය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කරනු ලැබේ. සඵල පොළී අනුපාතයේ සංකලිත කොටස් වන වට්ටම් හෝ අත්පත් කර ගැනීමේ අධිමිල හා ගාස්තු සැළකිල්ලට ගෙන ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයේ ක්‍රමක්ෂය "පොළී ආදායම්" ලෙස ඇතුළත් කරන අතර, එම වත්කම් හානිකරණයෙන් උද්ගත වන අලාභ ආදායම් ප්‍රකාශනයේ සටහන් තුළ හඳුනාගනු ලැබේ.

**ණය හා ලැබිය යුතු ගිණුම්**

ණය හා ලැබිය යුතු ගිණුම් ව්‍යුත්පන්න නොවන ස්ථාවර සහ නිගමනය කල හැකි ගෙවීම් සහිත සක්‍රීය වෙළඳපොළෙහි මිල ප්‍රකාශිත නොවූ මූල්‍ය වත්කම් වේ. ආරම්භක මිනුම්කරණයෙන් අනතුරුව වූ හානිකරණ අලාභ අඩුකර සඵල පොළී අනුපාතය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කරනු ලැබේ. සඵල පොළී අනුපාතයේ සංකලිත කොටස් වන වට්ටම් හෝ අත්පත් කර ගැනීමේ අධිමිල හා ගාස්තු හෝ පිරිවැය සැළකිල්ලට ගෙන ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශනයේ සඵල පොළී අනුපාත ක්‍රමක්ෂය "පොළී ආදායම්" ලෙස ඇතුළත් කරන අතර, එම වත්කම් හානිකරණයෙන් උද්ගත වන අලාභ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

**ප්‍රති මිලදීගැණුම් සහ ප්‍රතිවර්ථන මිලදීගැණුම් ගිවිසුම්**

ප්‍රති මිලදීගැනුම් ගිවිසුම්වල ආයෝජනය එහි ඇති ස්ථාවර හෝ නිගමනය කල හැකි ගෙවීම් හා ස්ථාවර කල්පිරීම් සහිත බැවින්ද, කල්පිරීම තෙක් රඳවා ගැනීමේ ධනාත්මක අභිප්‍රායක් සහ හැකියාවක් මණ්ඩලය සතු බැවින්ද, එම ආයෝජන කල්පිරෙන තෙක් රඳවා ගැනීමට හැකි ආයෝජන ලෙස නිගමනය කිරීමට තීරණය කර ඇත. ආරම්භයේදී අත්පත් කර ගැනීමේ පිරිවැයක් ඇත්නම් එයද ඇතුළුව සාධාරණ වටිනාකමට මිණුම්කරණය කර ඇති අතර, පසුකාලීනව සඵල පොළී අනුපාතිකය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කර ඇත.

**මූල්‍ය වත්කම් හානිකරණය**

කිසියම් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හෝ හානිකරණය වී ඇති බවට අරමුණුගත සාක්ෂි තිබේ දැයි සේ.නි.භා.අ. මණ්ඩලය සෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශන වාර්තාකරන දිනයන්හි දී තක්සේරු කරනු ලැබේ. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකරණය වී ඇතැයි අරමුණුගත සාක්ෂි ඇත්නම් පමණක් සහ සිදුවීම් එකක හෝ කිහිපයක ප්‍රතිඵලයක් ලෙස ආරම්භක හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුවී ඇත්නම් (දරා ඇති අලාභ සිද්ධිය) සහ එම සිද්ධිය (හෝ සිද්ධි) එම මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ට කිසියම් බලපෑමක් සිදුව ඇතැයි විශ්වාසනීයව ඇස්තමේන්තු කළ හැකි විය යුතුය.

**ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන ගිය වත්කම්**

ක්‍රමක්ෂය පිරිවැයට දක්වා ඇති මූල්‍ය වත්කම් (සේවක ණය සහ අත්තිකාරම් සහ පරිණත වනතෙක් රඳවාගත් ආයෝජන) මණ්ඩලය ප්‍රථමයෙන් තනිව හා තනිව වැදගත් හා සාමූහිකව නොවැදගත් මූල්‍ය වත්කම් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේ දැයි තක්සේරු කරනු ලබයි. එසේ තනිව තක්සේරු කරන ලද මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි නොමැති යයි මණ්ඩලය තීරණය කරන්නේ නම් එම මූල්‍ය වත්කමට සමාන ණය අවදානමක් ඇති මූල්‍ය වත්කම් සමූහයකට ඇතුලත් කර එම වත්කම් හානිකරණය සඳහා සාමූහිකව තක්සේරු කරනු ලැබේ. හානිකරණ අලාභ සඳහා තනිව තක්සේරු කරන ලද වත්කම මත හානිකරණ අලාභ පවතී නම් හෝ ඒ බව අඛණ්ඩව හඳුනාගෙන තිබේ නම් ඒවා සාමූහික තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.

වත්කමක් හානිකරණය වී ඇති බවට අරමුණුගත සාක්ෂි ඇත්නම්, එහි අලාභය ලෙස මිනුම්කරණය කරනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ (මෙතෙක් දරා නොමැති අනාගත ණය අලාභ හැර) වර්තමාන අගය අතර වෙනසය. වත්කමෙහි ධාරණ අගය දීමනා ගිණුමක් මඟින් අඩුකරන අතර අලාභය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ. අඩුකරන ලද ධාරණ අගයට පොළී ආදායම අඛණ්ඩව උපචිත කරන අතර, අනාගත පොළී මුදල් ප්‍රමාණයන් වට්ටම් කිරීම සඳහා යොදාගත් පොළී ප්‍රතිශතයන් හානිකරණ අලාභ මිනුම්කරණය සඳහා ද යොදාගනු ලැබේ.

පොළී ආදායම "පොළී ආදායමේ" කොටසක් ලෙස වාර්තා කරනු ලැබේ. අනාගතයේ දී අයකර ගැනීමේ නිශ්චිත හැකියාවක් නොමැති ණය හා සම්බන්ධිත දීමනාවන් ලියා හරිනු ලැබේ. පසු වර්ෂයක දී හානිකරණය හඳුනාගැනීමෙන් පසුව සිදු වූ සිද්ධියක් හේතුවෙන් ඇස්තමේන්තුගත හානිකරණ අලාභයේ අගය වැඩිවන්නේ නම් හෝ අඩු වන්නේ නම් කළින් හඳුනාගත් හානිකරණ අලාභය දීමනා තුළින් අඩු හෝ වැඩි කිරීම මගින් ගළපනු ලැබේ.

ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන වටිනාකම මූල්‍ය වත්කමේ මුල් සඵල පොළී අනුපාතය මගින් වට්ටම් කරනු ලැබේ. ණය සඳහා විචල්‍ය පොළී අනුපාතයක් පවතින්නේ නම්, කිසියම් හානිකරණ අලාභයක් මිනුම්කරණය සඳහා වට්ටම් අනුපාතය ලෙස ප්‍රවර්තන සඵල පොළී අනුපාතය යොදා ගත යුතු වේ. ආයතනය විසින් වෙළඳ වත්කම්, ණය හා අත්තිකාරම් ලෙස නැවත වර්ගීකරණයක් කරන්නේ නම් ඒ තුළින් කිසියම් හානිකරන අලාභයක් ඇතිවන්නේ නම් එය මැනීම සඳහා වට්ටම් අනුපාතිකය ලෙස එදිනට තීරණය කරන ලද සඵල පොළී අනුපාතිකය යොදා ගනු ලැබේ.

### විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන

විකිණීමට ඇති මූල්‍ය ආයෝජනයක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්දැයි ආයතනය විසින් සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරු කරනු ලැබේ.

ණය උපකරණයක් විකිණීමට ඇති ආයෝජන ලෙස වර්ගීකරණය කර ඇති විටෙක, එකී නිර්ණායකය පදනම් කොට ගෙන මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කර ඇති හෙයින්, ආයතනය විසින් තනි තනිව එම ණය උපකරණ හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේ දැයි තක්සේරු කරනු ලබයි. කෙසේ වුවද, හානිකරණය වශයෙන් වාර්තා කරන ලද මුදල, ආදායම් ප්‍රකාශනයේ කලින් හඳුනාගත් ආයෝජන මත හානිකරණ අලාභය හැර ක්‍රමක්ෂය පිරිවැය හා වර්තමාන සාධාරණ වටිනාකම අතර වෙනසෙහි මිනුම්කරණය කරන ලද සමුච්චිත අලාභය වේ. අනාගත පොළී ආදායම අඩුකරන ලද ධාරණ වටිනාකම මත පදනම් වන අතර, හානිකරණ අලාභය මිනුම්කරණය සඳහා භාවිතාකරන අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීමට යොදාගත් පොළී අනුපාතය භාවිතයෙන් උපචිත කරනු ලැබේ. පොළී ආදායම "පොළී ආදායමේ" කොටසක් ලෙස වාර්තා කරනු ලැබේ. පසු කාලීන කාලච්ඡේදයකදී ණය උපකරණයක සාධාරණ වටිනාකම වැඩි වන්නේ නම් සහ හානිකරණ අලාභය ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනීමෙන් අනතුරුව සිදුවන ණය සිද්ධියකට අරමුණුගතවම අදාළ වන්නේ නම්, හානිකරණ අලාභය ආදායම් ප්‍රකාශනය හරහා ප්‍රතිවර්තනය කෙරේ. ස්කන්ධ ආයෝජනයක් විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කර ඇති විටෙක, ආයෝජනයේ සාධාරණ වටිනාකම එහි පිරිවැයට අඩු බවට "වැදගත්" සහ "දිගු කාලීන" පරිහානියක් ඇති බවට සාධාරණ සාක්ෂි ඇතුළත් වේ. හානිකරණය සඳහා සාක්ෂි ඇති විටෙක, සමුච්චිත අලාභය අත්පත් කර ගැනීමේ පිරිවැය සහ ප්‍රවර්තන සාධාරණ අගයෙහි වෙනස සමුච්චිත අලාභය ලෙස මිනුම්කරණය කෙරේ. එම ආයෝජනයෙහි හානිකරණ අලාභයක් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගෙන ඇත්නම්, ස්කන්ධයෙන් ඉවත් කර ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. ස්කන්ධ ආයෝජනයන්හි හානිකරණ අලාභයන් ආදායම් ප්‍රකාශනය තුළින් ප්‍රතිවර්තනය නොකෙරෙන අතර, හානිකරණයෙන් පසුව ධාරණ වටිනාකමෙහි වැඩිවීම් ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

## 1.9 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගනු ලැබේ. මිලදී ගැනීමේ පිරිවැය, සෘජුවම ආරෝපනය කළ හැකි පිරිවැය සහ අනාගතයේදී නොවැලැක්විය හැකි ඉවත් කිරීමේ හෝ කොටස් වෙන් කිරීමේ පිරිවැයෙහි ඇස්තමේන්තුගත වර්තමාන අගය පිරිවැයෙහි අන්තර්ගත වේ. අදාළ බැරකම ප්‍රතිපාදන තුළින් හඳුනාගනු ලැබේ.

ආරම්භක තත්ත්වයේ කාර්යක්ෂමතාවයෙන් අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවෙන් දේපළ, පිරියත හා උපකරණ නඩත්තුව හෝ අළුත් වැඩියාව සඳහා වූ පිරිවැය එය දරණ අවස්ථාවේදී වියදමක් ලෙස ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

සින්නක්කර ඉඩම් (ආයෝජන දේපළ) හැර, ක්ෂය ප්‍රතිපාදනය හීනවන ශේෂ ක්‍රමය අනුව ගණනය කරනු ලැබේ. සින්නක්කර ඉඩම් ක්ෂය කරනු නොලැබේ. අනෙකුත් සියළුම දේපළ, පිරියත සහ උපකරණ ක්ෂයවීම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවකාලය තුළ සුන්බුන් වටිනාකම අඩුකළ ධාරණ වටිනාකමට ප්‍රතිපාදනය කෙරේ. වත්කම්වල ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවකාලය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| පරිගණක උපකරණ | - | 20% |
| අනෙකුත් උපකරණ | - | 20% |
| ලී බඩු | - | 15% |
| මෝටර් වාහන | - | 25% |
| සවිකිරීම් සහ වැද්දුම් | - | 33.33% |

වත්කම් භාවිතය සඳහා යෙදවූ දිනයේ දී ක්ෂයවීම් ආරම්භ වේ.

## 1.10 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට ලක්වීමේ සළකුණු දක්වන්නේ දැයි යන්න මණ්ඩලය විසින් එක් එක් වාර්තාකරණ දිනයේ දී සමාලෝචනය කරනු ලැබේ. එවැනි සළකුණක් දක්වන්නේ නම් හෝ වත්කමෙහි හානිකරණ පරීක්ෂණයක් අවශ්‍ය වන්නේ නම් හෝ මණ්ඩලය විසින් වත්කමෙහි අයකර ගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක අයකර ගත හැකි මුදල වන්නේ එම වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි සාධාරණ වටිනාකමෙන් විකුණුම් පිරිවැය අඩුකළ සාධාරණ වටිනාකම හෝ භාවිත වටිනාකම යන දෙකෙහි ඉහළ අගයයි. වත්කමෙහි හෝ මුදල් උත්පාදන ඒකකයෙහි ධාරණ වටිනාකම අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණය වූ ලෙස සළකා අයකර ගත හැකි වටිනාකම දක්වා ලියාහරිනු ලැබේ.

භාවිත වටිනාකම ගණනයේ දී ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන් මුදලේ වර්තමාන අගය සහ වත්කමට අදාළ අවදානම සහිත ප්‍රවර්තන වෙළඳපොළ තක්සේරු පිළිඹිබු වන බදු පෙර වට්ටම් අනුපාතය භාවිතයෙන් වට්ටම් කරනු ලැබේ. සාධාරණ වටිනාකමෙන් අඩුකළ විකුණුම් පිරිවැය තීරණය කළ යුත්තේ නිවැරදි ආගණන ආකෘතිය අනුවය. මෙම ආගණනයන්, විවිධ වටිනාකම්, ප්‍රසිද්ධ වෙළඳ සමාගම්වල මිල ප්‍රකාශිත කොටස් හෝ පවත්නා අනෙකුත් සාධාරණ අගය මිණුම් සාධක මගින් තහවුරු කෙරේ.

## 1.11 ආයෝජන දේපළ

අත්පත් කර ගැනීමේ පිරිවැය ඇතුළු ගත් මිලට ආයෝජන දේපළ මිනුම්කරණය කෙරේ. මුල් හඳුනාගැනීමෙන් අනතුරුව වාර්තාකරණ දිනයේ දී වෙළඳපොළ තත්ත්වයන් දක්වන සාධාරණ වටිනාකමට ආයෝජන දේපළ සටහන් කරනු ලැබේ. ආයෝජන දේපළෙහි සාධාරණ වටිනාකම නිසා උද්ගත වන ලාභ හෝ අලාභ ඒවා උද්ගත වූ කාලච්ඡේදයේ ආදායම් ප්‍රකාශනයේ අන්තර්ගත කෙරේ.

මණ්ඩලයේ ආයෝජන දේපළ සෑම වසර 3 කට වරක්ම විවෘත වෙළඳපොළ වටිනාකමට ප්‍රත්‍යාගණනය කරනු ලබන අතර, ධාරණ වටිනාකමෙහි සිදුවන වෙනස්කම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

ලැබිය යුතු කුලී කල්බදු කාලච්ඡේදය තුළ සරල මාර්ග පදනම යටතේ බෙදා හරිනු ලැබේ. කුලී නිවැසියාට කුලී රහිත කාලසීමාවක් වැනි දිරිගැන්වීමක් ලබා දෙන්නේ නම් මෙම පදනම යටතේ හඳුනාගනු ලබන කුලී ආදායමක් හේතුවෙන් වාර්තාවන වෙනත් වත්කමක වටිනාකම ආයෝජන වත්කමෙහි ධාරණ වටිනාකමෙන් අඩුකරනු ලැබේ.

## 1.12 අස්පෘෂ්‍ය වත්කම්

### 1.12.1 බාහිරව අත්පත්කරගන්නා ලද අස්පෘෂ්‍ය වත්කම්

වෙන් වෙන්ව අත්පත් කර ගත් අස්පෘෂ්‍ය වත්කම් ආරම්භයේදී හඳුනාගත් පිරිවැයට මිනුම්කරණය කෙරේ. ආරම්භක හඳුනාගැනීමට අනුකූලව අස්පෘෂ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට ධාරණය කරනු ලැබේ.

අස්පෘෂ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ජීවකාලය නිශ්චිත හෝ අවිනිශ්චිත ලෙස තක්සේරු කරනු ලැබේ.

නිශ්චිත ජීවකාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම් ඒවායෙහි ප්‍රයෝජනවත් ආර්ථික ජීවකාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබන හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ. කිසියම් සළකුණක් දක්වන්නේ නම් අස්පෘෂ්‍ය වත්කම් හානිකරණය කරනු ලැබේ. එක් එක් වාර්තාකරණ කාලච්ඡේදයක් අවසානයේදී නිශ්චිත ජීවකාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කමෙහි ක්‍රමක්ෂය කාලච්ඡේදය සහ ක්‍රමක්ෂය ක්‍රමය සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවකාලය හෝ වත්කමට අනුබද්ධිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජන රටාවේ වෙනස්කම් අදාළ පරිදි ක්‍රමක්ෂය කාලච්ඡේදය හෝ ක්‍රමක්ෂය ක්‍රමය වෙනස් කිරීමෙන්, එම වෙනස්කම් ගිණුම් ඇස්තමේන්තු වෙනස්කම් සේ සළකනු ලැබේ. නිශ්චිත ජීවකාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය වියදම ආදායම් ප්‍රකාශනයේ වියදම් වර්ග යටතේ, අස්පෘෂ්‍ය වත්කම්වල ක්‍රියාකාරිත්වය සාපේක්ෂව හඳුනාගනු ලැබේ.

අස්පෘෂ්‍ය වත්කමක් හඳුනා නොගැනීමෙන් උද්ගත වන ලාභ හෝ අලාභ වත්කමෙහි ධාරණ අගය සහ ශුද්ධ උපලබ්ධි ලැබීම් අතර වෙනස සේ මිනුම්කරණය කරනු ලබන අතර, වත්කම හඳුනා නොගැනීමෙන් පසුව ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ.

**පරිගණක මෘදුකාංග පැකේජයන්**

පරිගණක මෘදුකාංග පැකේජයන් අත්පත් කරගැනීමේ සහ වැඩිදියුණු කිරීමේ වියදම අස්පෘෂ්‍ය වත්කමක් ලෙස හඳුනාගන්නා අතර වසර 03 ක් තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ.

## 1.13 කල්බදු දේපළ

### 1.13.1 මෙහෙයුම් කල්බදු

අයිතියට අදාළ අවදානම සහ ප්‍රතිඵලය අවස්ථානුකූලව මණ්ඩලය වෙත මාරු නොකරන අවස්ථාවන්හිදී (මෙහෙයුම් කල්බදු), ගෙවිය යුතු මුළු කල්බදු කුලී ප්‍රමාණය සරළ මාර්ග ක්‍රමයට කල්බදු කාලය පුරා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට මාරුකරනු ලැබේ.

## 1.14 තොග

යල් පැනගිය සහ සෙමින් චලනය වන අයිතමයන්ට අදාළ දීමනා අඩු කිරීමෙන් පසු පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩාත් අඩු අගයට තොග ආගණනය කෙරේ.

## 1.15 විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය

### 1.15.1 නිශ්චිත දායක යෝජනා ක්‍රම

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයිනට, සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වයට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකම ලැබේ. මණ්ඩලය විසින් සේවකයන්ගේ දළ පාරිශ්‍රමිකයෙන් 15% ක් සහ 03% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ.

### 1.15.2 නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම - පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 - සේවක ප්‍රතිලාභ - අනුව වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සියළුම සේවකයන් වෙනුවෙන් විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදනය කර ඇත. කෙසේ වුවද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත අනුව කාර්ය මණ්ඩලය වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පමණක් බැරකම උද්ගත වේ. මෙම බැරකම බාහිරව මුල්‍යනය නොකෙරේ.

නිශ්චිත දායක යෝජනා ක්‍රමය හැරුණු විට නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, පශ්චාත් රැකියා ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි. නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම යෝජනා ක්‍රම මත ව්‍යවසායයේ ශුද්ධ බැඳියාව, ප්‍රවර්තන සහ පූර්ව කාලච්ඡේදයන් සඳහා සේවකයන්ගේ සේවා දායකත්වය මත උපයන ලද අනාගත ප්‍රතිලාභ ඇස්තමේන්තු මත ගණනය කරනු ලබන අතර, එම ප්‍රතිලාභය වර්තමාන වටිනාකම තීරණය කිරීම සඳහා වට්ටම් කරනු ලැබේ. හඳුනා නොගත් පූර්ව සේවා පිරිවැයක් ඇත්නම් අඩු කරනු ලැබේ.

වාර්තා කරනු ලබන දිනට පැවැති උසස් තත්ත්වයේ සංස්ථාපිත බැඳුම්කරයන්ගේ ඵලදා ප්‍රතිශතය වට්ටම් අනුපාතය වේ. පරිනත දනියන් සහිත ව්‍යවසායයේ බැඳියාව සාමාන්‍ය කරන ප්‍රතිලාභ ගෙවීමට අපේක්ෂිත විනිමය අනුපාතිකය අදාළ කෙරේ. වාර්ෂිකව සුදුසුකම් ලත් ආයුගණක වරයෙකු විසින් ප්‍රතික්ෂේපිත ඒකක ණය ක්‍රමය උපයෝගි කර ගනිමින් ගණනය කරනු ලැබේ.

සැලසුමක ඇති ප්‍රතිලාභ වැඩිදියුණු කිරීමෙන්, සේවකයන්ගේ පසුගිය සේවා කාලයට අදාළ කොටස වැඩිවන අතර ප්‍රතිලාභ අත්පත් කර ගන්නා තෙක් කාලච්ඡේදය පුරා ලාභාලාභ ගිණුම තුළින් සරළ මාර්ග ක්‍රමයට හඳුනා ගැනේ.

විශ්‍රාම පාරිතෝෂික බැඳියාව තීරණය කිරීමේදී භාවිතාකරන ප්‍රධාන උපකල්පනයන් මෙසේය:

| | |
|---|---|
| වට්ටම් අනුපාතය | 11% |
| වැටුප් වර්ධක අනුපාතය | 02% |
| විශ්‍රාම ගන්නා වයස | අවුරුදු 60 |

### 1.17 බදුකරණය

#### 1.17.1 ප්‍රවර්තන බදු

වාර්තාකරන දිනට පවතින බදු ප්‍රතිශතය හෝ ස්වාධීනව ක්‍රියාත්මක වන බදු ප්‍රතිශතය මත වර්ෂයේ බදු ගෙවිය යුතු ලාභය හෝ අලාභය මත ගෙවිය යුතු බදු හෝ ලැබිය යුතු බදු සහ ගෙවිය යුතු ගැළපීම් මත බදු, ප්‍රවර්තන බද්ද වේ.

### 1.18 ස්කන්ධය

#### 1.18.1 සාමාජික අරමුදල

වර්ෂය තුළ ආපසු ගෙවන ලද ප්‍රතිලාභ අඩුකළ පසු සාමාජිකයන්ගෙන් ලද දායක මුදල් හා ලැබිය යුතු දායක මුදල් සහ ඒ මත උපචිත කරන ලද පොළී සහ ලාභාංශවලින් සාමාජික අරමුදල සමන්විත වේ.

#### 1.18.2 ලාභාංශ

ලාභාංශ ආදායම අරමුදල වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

### 1.19 ප්‍රතිපාදන

අවිනිශ්චිත කාල සහ සංඛ්‍යාවන් සහිත බැරකම් සඳහා මණ්ඩලය විසින් ප්‍රතිපාදන හඳුනාගෙන තිබේ. වාර්තාකරන දිනට බැඳියාව නිරවුල් කිරීම සඳහා අවශ්‍ය වියදම පිළිබඳව හොඳම තක්සේරුව මත ප්‍රතිපාදනය ගිණුම්කරණය කරන අතර, බැරකමට බලපාන වර්තමාන වෙළෙඳපොළ තක්සේරු මුදලේ කාල වටිනාකම සහ විශේෂිත අවදානම් හුවා දැක්වෙන බදු පූර්ව අනුපාතය මත වට්ටමක් ද ලැබේ.

## 2. තීරණාත්මක ගිණුම් ඇස්තමේන්තු සහ විනිශ්චයන්

අනාගතය පිළිබඳව මණ්ඩලය ඇතැම් ඇස්තමේන්තු සහ උපකල්පනයන් සකසනු ලැබේ. ඇස්තමේන්තු සහ විනිශ්චයන් ඓතිහාසික පළපුරුද්ද සහ වෙනත් කරුණු පදනම් කොට ගෙන අඛණ්ඩව අගයනු ලබන අතර, අවස්ථානුකූලව සාධාරණ යයි විශ්වාස කළ හැකි අනාගත සිද්ධි ද ඇතුළුව අනාගතයේදී සත්‍ය සිදුවීම් මත මෙම ඇස්තමේන්තු සහ උපකල්පනයන් වෙනස් විය හැක. ඉදිරි මූල්‍ය වසර තුළ මෙම ඇස්තමේන්තු සහ උපකල්පනයන්ගේත් වත්කම් සහ බැරකම් වල ධාරණ වටිනාකමේ කළ හැකි ප්‍රමාණාත්මක සහ වැදගත් අවදානම පිළිබඳව පහත සාකච්ඡා කර ඇත.

### ඇස්තමේන්තු සහ උපකල්පනයන්

#### (අ) ආයෝජන දේපළ අගයනය

ව්‍යවසාය එහි ආයෝජන දේපළ බාහිර තක්සේරුකරුවකු ලවා එකී ආයෝජනයේ සාධාරණ වටිනාකම ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. මෙම අගයනය අනාගත කුලී ආදායම, පුරෝකථන නඩත්තු පිරිවැය, අනාගත සංවර්ධන පිරිවැය සහ අදාළ වට්ටම් අනුපාත යන උපකල්පනයන් මත පදනම් වේ. මෙම තක්සේරුකරු මේ හා සමාන දේපළවල ගණුදෙනු වටිනාකම පිළිබඳ වෙළෙඳපොළ සාක්ෂි කෙරෙහි ද යොමුවේ.

(ආ) **මූල්‍ය උපකරණ වල සාධාරණ වටිනාකම**

මණ්ඩලය වටිනාකම් ඇගයීමේ තාක්ෂණ ක්‍රම යොදාගැනීමෙන් මිල ප්‍රකාශිත නොවූ ආයෝජනයන්ගේ සාධාරණ වටිනාකම තීරණය කරනු ලැබේ. වට්ටම් අනුපාත සහ අනාගත මූල්‍ය ප්‍රවාහයන්ගේ ඇස්තමේන්තු ඇතුළුව භාවිතාකරන ලද උපකල්පනයන් එකී තාක්ෂණ ක්‍රමයන් මත සැළකිය යුතු අන්දමින් ගළපා ඇත. මේ අයුරින් සාදාගන්නා ලද සාධාරණ වටිනාකමේ ඇස්තමේන්තු ස්වාධීන වෙළෙඳපොළ හා සැමවිටම සංසන්දනය කළ නොහැකි අතර බොහෝ අයිතමයන් සඳහා ක්ෂණිකව උපලබ්ධි කිරීමේ හැකියාවක් නැත.

(ඇ) **දේපළ, පිරියත සහ උපකරණයන්ට අදාළ ප්‍රයෝජනවත් ජීවකාලය සහ සුන්බුන් අගය**

ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවකාලය සහ සුන්බුන් අගය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලවන්නේ ද සහ අදාළවන්නේ ද යන්න ව්‍යවසාය වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ.

## 3. මූල්‍ය උපකරණ අවදානම් කළමනාකරණය

### අවදානම් කළමනාකරණ ව්‍යුහය

සියළුම ව්‍යාපාර මෙහෙයුම් ක්ෂේත්‍රයන්හි නීති, රීති, රෙගුලාසි, නිත්‍ය උපදෙස්, සහ අනුමත කළ ප්‍රතිපත්ති අනුකූලව කටයුතු කිරීමට මණ්ඩලයට අනුකූලතා කාර්ය භාරයක් පවතී.

අනෙකුත් සියලු ව්‍යාපාරයන්ට අනුකූලව, මණ්ඩලය මූල්‍ය උපකරණ භාවිතයේ දී මතුවන අවදානම මණ්ඩලයට තිබේ. එම අරමුණු, ප්‍රතිපත්ති සහ සැළසුම් සහ එකී අවදානම් කළමනාකරණය කිරීමට සහ ඒවා මිණුම්කරණය කිරීමට භාවිතා කරන ක්‍රම පිළිබඳව මෙම සටහනෙහි විස්තර කෙරේ. මෙම අවදානම පිළිබඳ ප්‍රමාණාත්මක තොරතුරු වැඩිදුරටත් මෙම මූල්‍ය ප්‍රකාශනයන් තුළින් ඉදිරිපත් කෙරේ.

මූල්‍ය උපකරණ අවදානම සම්බන්ධව මණ්ඩලයේ ස්වාධීන වෙනසක් නිරාවරණය නොවන අතර එහි අරමුණු, ප්‍රතිපත්ති සහ එකී අවදානම් කළමනාකරණය හෝ ඒවා මිණුම්කරණයේදී භාවිත ක්‍රම පූර්ව කාලච්ඡේදයන් සඳහා විස්තර සටහන්වල නොදැක්වේ නම් පූර්ව ක්‍රමයන් අනුගමනය කර ඇත.

### 3.1 ණය අවදානම

මණ්ඩලයේ පාරිභෝගිකයන් හෝ සමානයන් ඔවුන්ගේ ගිවිසුම්ගත බැඳීම් ඉටුකිරීමට අසමත් වීම හේතුවෙන් මණ්ඩලයට දැරීමට සිදුවන අලාභය ණය අවදානම ලෙස සැළකේ. පෞද්ගලික පාර්ශවකරුවන් භාරගැනීමට කැමති අවදානම් ණය සීමා නියම කිරීමෙන් සහ එම සීමාවන්ට අදාළ නිරාවරණයන් අධීක්ෂණය මගින් මණ්ඩලය විසින් ණය අවදානම පාලනය කරයි.

### 3.2 හානිකරණ තක්සේරුව

හානිකරණය වූ වත්කම් මත අලාභය හඳුනාගැනීම සඳහා මණ්ඩලය දරන ලද අලාභ ආකෘතිය මණ්ඩලය විසින් මිණුම්කරණය සඳහා උපයෝගි කර ගනී. එහි අර්ථය වන්නේ නිරීක්ෂණය වූ විශේෂිත අලාභ සිද්ධියකට අදාළව සාධාරණ සාක්ෂි මත හඳුනාගැනීමයි. ඉලක්කගත සිද්ධීන්ට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

- පාරිභෝගිකයාගේ වැදගත් මූල්‍ය අවශ්‍යතා
- ගෙවීම් පැහැර හැරීම් වැනි ගිවිසුම් උල්ලංඝණය කිරීම්

- පාරිභෝගිකයාගේ ගෙවීම් සඳහා වූ මූල්‍ය අපහසුතා මත මණ්ඩලය පාරිභෝගිකයා වෙත සහන සැලසීම.
- බොහෝ විට පාරිභෝගිකයා බුන්වත්වීම හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයන්ට පත්වීම.
- ඇස්තමේන්තුකළ ණය මත අනාගත මූල්‍ය ප්‍රවාහයන් අඩුවීමේ දත්ත නිරීක්ෂණය වීම.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

# විගණකාධිපති වාර්තාව 2012

# විගණකාධිපති වාර්තාව 2012

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. : ඊල්/ඩී/ඊපීඑෆ්/එෆ්ජ්/12 | ඔබේ අංකය / உமது இல. / Your No. : | දිනය / திகதி / Date : 2014 පෙබරවාරි 17 දින |

සභාපති
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

**සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (7) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 46 දරණ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (7) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 10 (1) වගන්තියෙන් විගණකාධිපති වෙත බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 16 හි 34 වන වගන්තිය ප්‍රකාරව වත්කමක සාධාරණ වටිනාකම ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස්වන හෝ එසේ වෙනස් නොවන බවට හඳුනා ගැනීමට වර්ෂ 3 කට හෝ වර්ෂ 5 කට වරක්වත් වත්කම් ප්‍රත්‍යාගණනයක් කළ යුතු වුවත්, මණ්ඩලයේ රු. 188,241,276 ක් වූ ස්ථාවර වත්කම් එසේ ප්‍රත්‍යාගණනයකට භාජනය කර නොතිබුණි.

#### 2.2.2 සාමාජික ගිණුම් වලට බැර නොවූ දායක මුදල්

2012 දෙසැම්බර් 31 දිනට සාමාජික අරමුදල් ගිණුමේ ශේෂය රු. 153,631,425,664 ක් බව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කර තිබුණද, එදිනට සත්‍ය වශයෙන්ම සාමාජික ගිණුම් වලට බැරවී තිබුණු මුදල රු.

143,079,139,946 ක් විය. මෙදිනට අරමුදලට ලැබී තිබුණු, සාමාජික ගිණුම් වලට බැර කර නොතිබුණු මුදල රු. 10,552,285,718 ක් විය. මෙම මුදලින් රු. 4,099,849,873 ක් පසුගිය වර්ෂ 32 ක පමණ කාලයක් තුළදී ලැබී තිබුණු නමුදු, 2012 දෙසැම්බර් 31 දින වනවිටත් සාමාජික ගිණුම් වලට බැරකර නොතිබුණු සාමාජික දායක මුදල් වූ අතර, ඉතිරි රු. 6,452,435,845 ක මුදල ඉහත කී ලැබූ දායක මුදලට අදාළව කලින් කලට සාමාජික ගිණුම් වලට බැරවිය යුතුව තිබුණු පොළී මුදල විය. මෙතෙක් ගිණුම්ගත කර නොතිබුණු, ලැබූ දායක මුදල් පිළිබඳව කාල විශ්ලේෂණයක් පහත දක්වා ඇත.

| ලැබී තිබුණු සාමාජික ගිණුම් වලට බැර නොකල ශේෂයේ වයස් විශ්ලේෂණය | මෙතෙක් ගිණුම්ගත නොකෙරුණු දායක මුදල |
|---|---:|
| වර්ෂ 1 සිට 5 දක්වා | 2,170,507,917 |
| වර්ෂ 5 සිට 10 දක්වා | 824,534,055 |
| වර්ෂ 10 සිට 15 දක්වා | 417,178,073 |
| වර්ෂ 15 සිට 20 දක්වා | 226,346,967 |
| වර්ෂ 20 සිට 25 දක්වා | 240,248,55 |
| වර්ෂ 25 ට වැඩි | 221,034,506 |
| **එකතුව** | **4,099,849,873** |

"මසකට වරක් ගෙවනු ලබන සාමාජික මුදලට අදාළ සාමාජික විස්තර මසකට හා 6 මසකට වරක් අරමුදලට ලැබෙන බවද, සාමාජික මුදල් ගිණුම්ගත කිරීම එළඹෙන වර්ෂයේ පෙබරවාරි 28 දින සිදුවන බවද, මෙසේ සාමාජික මුදල් ගිණුම්ගත කිරීම පමාවී ඇත්තේ සේවායෝජකයින් මුදල් බැර කිරීමට අදාළ සේවක විස්තර ලබා නොදීම, ලබාදුන් දත්ත අපැහැදිලිවීම, ආයතන කිහිපයක් එක් චෙක්පතකින් මුදල් ගෙවීම නිසා විභජනය අපහසුවීම, කළමනාකාරිත්වය වෙනස්වීම නිසා පෙර කාල වලට අදාළ තොරතුරු ලබාගත නොහැකිවීම, වතු ආශ්‍රිත සේවක නම්වල පවත්නා ගැටලු හා අක්‍රිය සාමාජිකයින්ගේ මුදල් ගෙවා ඇති නමුත් විස්තර ඉදිරිපත් නොකිරීම යනාදී හේතුන් නිසා බවද, මෙසේ කලින් කලට ගිණුම්ගත විය යුතු සාමාජික මුදල් ගිණුම්ගත වන තෙක් පොළී මුදල් සාමාජික ගිණුම්වලට බැරවීමක් සිදුනොවන බවද," පිළිතුරු වශයෙන් මණ්ඩලයේ සභාපතිවරයා දන්වා තිබුණි.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැරකම් යටතේ දැක්වෙන 1995 වර්ෂයේ සිට පැවත එන හිමිකම් නොපාන ලද මරණ ප්‍රතිලාභ ගිණුමේ ශේෂය රු. 7,573, 890 ක් දක්වාද, 2001 වර්ෂයේ සිට පැවත එන ආපසු ගෙවන ප්‍රතිලාභ ගිණුමේ ශේෂය රු. 13,905,162 ක් දක්වාද, සමාලෝචිත වර්ෂය අවසානය වනවිට අඛණ්ඩව වැඩිවී තිබුණි. "සාමාජිකයාගේ මරණයෙන් පසු ඔහුගේ ප්‍රතිලාභ ලැබීමට එක් අයෙකුට වඩා හිමිකම් ලාභීන් සිටීම හා ඔවුන් එකවර ඉදිරිපත් නොවීම නිසාත් ප්‍රමාණවත් ලිඛිත තොරතුරු ඉදිරිපත් නොවීම නිසාත් නිවැරදි හිමිකම තීරණය කරන තෙක් රඳවාගෙන ඇති හිමිකම් නොපාන ප්‍රතිලාභ ගිණුමේ ශේෂයෙන් 2013 වර්ෂයේදී හිමිකම්ලාභීන් 5 දෙනෙකුට රු. 391,744 ක් ගෙවා ඇති බවද ප්‍රතිලාභ ඉල්ලුම්කරුවන්ගේ බැංකු ගිණුම් විස්තර වල දෝෂ සහිත බව නිවැරදි කරගෙන නැවත ගෙවන තෙක් රඳවාගෙන ඇති ආපසු එවන ප්‍රතිලාභ ගිණුමේ ශේෂයෙන් 2013 වර්ෂයේ දී රු. 3,257,115 ක් ගෙවා ඇති බව" මෙයට පිළිතුරු වශයෙන් මණ්ඩලයේ සභාපතිවරයා දක්වා තිබුණි.

(ආ) 2001 වර්ෂයේ සිට වැඩිවෙමින් පැවති 2012 දෙසැම්බර් 31 දිනට රු. 5,149,573 ක් වූ ආපසු ගෙවන ප්‍රතිලාභ ගිණුමේ ශේෂය නිරවුල් කර නොතිබුණි. "චෙක්පත් මඟින් ප්‍රතිලාභ ඉල්ලුම්කරුවන්ට ගෙවීම් කරන ලද නමුදු බැංකුව වෙත ඉදිරිපත් කර නොමැති චෙක්පත්වල වටිනාකම නිරූපණය වන මෙම ශේෂයෙන් 2013 වර්ෂයේ දී රු. 468,728 ක් ප්‍රතිලාභ ඉල්ලුම්කරුවන් 22 කට ගෙවා ඇති බව" මෙයට පිළිතුරු වශයෙන් මණ්ඩලයේ සභාපතිවරයා දක්වා තිබුණි.

(ඇ) මණ්ඩලයේ නිලධාරියකුට වාහන ණය මුදල් ගෙවීමේදී ඉකුත් වර්ෂයේදී වැඩිපුර ගෙවන ලද මුදලකින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අයකරගෙන නොතිබුණු ශේෂය රු. 61,770 ක් විය.

(ඈ) සේවයෙන් ඉවත්වී වර්ෂ 1 සිට වර්ෂ 13 දක්වා වූ කාලයක් ගතවී ඇති, නිලධාරීන් 18 ක ගෙන් තවදුරටත් අයකර ගත යුතු ශේෂය 2013 ඔක්තෝම්බර් 04 දින වන විට රු. 260,281 ක් විය.

(ඉ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායක මුදල් ලෙස මුදල් ඇනවුම් වලින් 2013 ඔක්තෝම්බර් 04 දින වන විට තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයෙන් අයකර ගත යුතුව ඇති හිඟ මුදල රු. 1,218,909 ක් වී තිබුණි.

## 2.2.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1999 ඔක්තෝම්බර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය, 1.1.6 වගන්තිය හා 2.3 වගන්තිය | මෙම රෙගුලාසි වලට පටහැනිව ආයතනයේ නිලධාරීන් 09 කගේ පෞද්ගලික ගමන් සඳහා මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ දී වැයකර ඇති ඉන්ධන වියදම රු. 4,108,740 ක් විය. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක 130 හා 1998 මාර්තු 18 දිනැති චක්‍රලේඛය, අංක 26/47 හා 1997 නොවැම්බර් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2011 ඔක්තෝම්බර් 18 දින පැවති අංක 56 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම් සටහනේ 19 වගන්තිය | 4.2% වන සේවක ණය පොළී අනුපාතය මත සංස්ථා හා ව්‍යාවස්ථාපිත මණ්ඩල වල සේවකයින් සඳහා ණය ලබා නොදිය යුතු බව සඳහන් කර තිබුණද, මණ්ඩලය ඊට පටහැනි ලෙස කටයුතු කරමින් ඉහත පොළී අනුපාතයට හා ඊට අඩු පොළී අනුපාත යටතේ සේවක ණය ලබාදී තිබුණි. 2012 දෙසැම්බර් 31 වන දින වනවිට ඉහත පොළී අනුපාතයන් මත ලබාදුන් රු. 413,101,257ක ණය ශේෂයක් අයවීමට තිබුණි. |

(ඇ) අංක පීඊඩී 12 හා 2003 ජූනි 06 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 8.7 වගන්තිය

නිලධාරින්ගේ සේවා නියුක්ති ආදායම මත අයකරගෙන, දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවිය යුතු 2012 වර්ෂයට අදාළ රු. 1,310,687 ක් වූ උපයනවිට ගෙවීම් බදු මුදල් නිලධාරින්ගෙන් අයකර නොගෙන, මණ්ඩලය අරමුදලින් දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙත ගෙවා තිබුණි.

(ii) 9.12 වගන්තිය

මණ්ඩලය විසින් හඳුන්වාදෙන සුභසාධක වැඩසටහන් සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එසේ අනුමැතිය ලබානොගත් සුභසාධන ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 16,847,846 ක වියදමක් දරා තිබුණි.

(ඈ) අංක පීඑෆ්/පීඊ 5 හා 2000 ජනවාරි 11 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2011 ඔක්තෝම්බර් 18 දින පැවති අංක 56 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම් සටහනේ 16 වැනි වගන්තිය

මහා භාණ්ඩාගාර අනුමැතියෙන් තොරව දිරිගැන්වීමේ දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 81,067,392 ක මුදලක් ගෙවා තිබුණි. මෙම කටයුතු නිවැරදි කරන ලෙස අදාළ රාජ්‍ය ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී දන්වා තිබුණි.

(ඉ) අංක 47 හා 2011 දෙසැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය

මෙම චක්‍රලේඛයේ 1 හා 2 වගන්ති වලට පටහැනි වන පරිදි සමාලෝචිත වර්ෂයේදී රු. 48,727,577 ක ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. 8 වන වගන්තිය පරිදි චක්‍රලේඛයේ විධිවිධාන වලට පරිබාහිරව ප්‍රසාද දීමනා ගෙවන්නේ නම් අමාත්‍ය මණ්ඩල පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, මණ්ඩලය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි (මු.රෙ.)

මු.රෙ. 104

වාහන අනතුරු 45 ක් සම්බන්ධයෙන් වූ අලාභ හානි පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

2012 දෙසැම්බර් 31 වන දිනට රු. 390,537,752 ක ස්ථාවර වත්කම් භෞතිකව සනාථ කෙරෙන භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

(අ) අධ්‍යක්‍ෂ මණ්ඩල අනුමැතිය මත 1999 සිට මණ්ඩලයේ ක්‍රියාත්මක කරන මූල්‍ය කාර්යය පටිපාටි සංග්‍රහය සඳහා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම මුදල් අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. මෙම කාර්යය පටිපාටි සංග්‍රහයට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ චක්‍රලේඛ විධිවිධාන යනාදියට පරිබාහිර කරුණු ඇතුළත් වී තිබුණි.

(ආ) මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගෙන මණ්ඩලයේ නිලධාරීන් වෙනුවෙන් 1993 වර්ෂයේ සිට නිල ඇඳුම් ලබාදීම සිදුකර තිබුණු අතර, මේ සඳහා සාමාලෝචිත වර්ෂයේදී රු. 6,236,582 ක වියදමක් දරා තිබුණි. පසුගිය වර්ෂ 5 ක කාලය තුළදී එසේ අනුමැතියක් රහිතව අරමුදලින් නිල ඇඳුම් සඳහා දරන ලද වියදම රු. 36,575,879 ක් විය.

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු. 12,147,948,316 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු. 11,307,220,814 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සාමාලෝචිත වර්ෂයේ අතිරික්තයේ වැඩිවීම රු. 840,727,502 ක් විය. පොලී ආදායම, ලාභාංශ ආදායම හා ශුද්ධ වර්තමාන අගයන් ගැළපීමේදී සිදුවූ අගය වැඩිවීම මෙලෙස අතිරික්තයක් වැඩිවීමට හේතුවී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

(අ) පෙර වර්ෂ හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ අතිරික්තය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 7.44 ප්‍රතිශතයක වැඩිවීමක් සිදුවුවත් සාමාජිකයන් වෙත ලබාදෙන ලද ප්‍රතිලාභ ප්‍රතිශතය සියයට 10 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා එසේ ගෙවන ලද ප්‍රතිලාභ පිළිබඳ විස්තරයක් පහත දක්වා ඇත.

| වර්ෂය | 2012 | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|---|
| සාමාජිකයින් වෙත ගෙවන ලද ප්‍රතිලාභ | 10% | 10% | 12.5% | 13% | 12% |

(ආ) **අරමුදලේ සාමාජිකයන්ගේ හිමිකම, මුළු දායක මුදල හා ප්‍රකාශිත පොළියේ සමුච්චිත අගයේ වර්ෂ 5 තුළ විචලන**

පසුගිය වර්ෂ 05 ක් තුළ මණ්ඩලයේ සාමාජිකයන්ගේ මුළු හිමිකම හා එම හිමිකම් වලට අයත් මුළු දායක මුදල් හා සමුච්චිත පොලී ලෙස බෙදී ගිය අකාරය පහත දැක්වේ.

| වර්ෂය | මුළු දායක මුදල<br>රු. මිලියන | සමුච්චිත පොලිය<br>රු. මිලියන | සාමාජිකයන්ගේ හිමිකම<br>රු. මිලියන |
|---|---|---|---|
| 2008 | 44,301 | 44,568 | 88,869 |
| 2009 | 49,834 | 53,223 | 103,057 |
| 2010 | 56,616 | 63,236 | 119,852 |
| 2011 | 64,054 | 71,432 | 135,486 |
| 2012 | 72,773 | 80,858 | 153,631 |

ඉහත තොරතුරු අනුව 2012 වර්ෂය වන විට මණ්ඩලයේ සාමාජිකයන්ගේ මුළු හිමිකමින් සියයට 47 ක් දායක මුදල්ව තිබූ අතර, සියයට 53 ක් සමුච්චිත පොලිය වී තිබුණි. එමෙන්ම 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී සාමාජිකයන්ගේ මුළු හිමිකම සියයට 13.39 කින් වර්ධනය වී තිබුණු අතර, එකී වර්ෂයේදී මුළු දායක මුදල සියයට 13.61 කින් වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### 4.1.1 මෙහෙයුම් කාර්ය සාධනය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ) 2012 වර්ෂය අවසානයේ දී කාර්ය සාධන තත්ත්වය පහත පරිදි වේ.**

| විස්තරය | තථ්‍ය සංඛ්‍යාව | අරමුදල් ක්‍රියාකාරිත්වයට අදාළ වූ සංඛ්‍යා | එහි ප්‍රතිශතයන් % |
|---|---|---|---|
| පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය | 3,832,840 | 2,200,000 | 57.40 |
| සේවා යෝජකයින් | 227,612 | 70,194 | 30.84 |
| අරමුදලේ සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 9.8 | 2.2 | 22.45 |

2012 වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ ස්වයං රැකියාලාභින් 2,593,151 ක් අරමුදලට බඳවාගෙන සහන සැලසීමේ ප්‍රමාණවත් වැඩපිළිවෙලක් මණ්ඩලයෙන් සැකසී නොතිබුණි. "ප්‍රාදේශීය කාර්යාල ජාලය උපයෝගී කරගෙන ස්වයංරැකියාවල යෙදෙන්නන් මෙම මණ්ඩලය වෙත බඳවා ගැනීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වන බැවින් 2013 වර්ෂය අවසානය වනවිට ස්වයං රැකියා සාමාජිකත්වය විශේෂ වර්ධනයක් අපේක්ෂිත බවද, එම ස්වයංරැකියාවල යෙදෙන්නන් අරමුදලට බඳවාගැනීමේ දී සිය කැමැත්තෙන්ම ආයක මුදල් ගෙවිය යුතුවීම මෙහි වර්ධනයට බාධාවක් බව" මෙයට පිළිතුරු වශයෙන් මණ්ඩලයේ සභාපතිවරයා දන්වා තිබුණි.

(මූලාශ්‍රය 2012 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව)

(ආ) පසුගිය වර්ෂ 5ක කාල සීමාව තුළදී සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ වැඩපිළිවෙලට අදාළ තොරතුරු පහත දක්වා ඇත.

| වර්ෂය | අරමුදලට දායකවූ ක්‍රියාකාරි සාමාජික සංඛ්‍යාව | සිසු දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලැබූ සාමාජික සංඛ්‍යාව | 5 වසර ශිෂ්‍යත්ව පිරිවැය රු | උසස් පෙළ ශිෂ්‍යත්ව පිරිවැය රු | මුළු ශිෂ්‍යත්ව පිරිවැය රු |
|---|---|---|---|---|---|
| 2008 | 2,100,000 | 2,497 | 26,084,760 | - | 26,084,760 |
| 2009 | 2,100,000 | 3,000 | 46,811,006 | - | 46,811,006 |
| 2010 | 2,100,000 | 3,000 | 45,385,680 | - | 45,385,680 |
| 2011 | 2,100,000 | 6,669 | 74,051,599 | 23,640,000 | 97,691,599 |
| 2012 | 2,200,000 | 6,962 | 75,775,685 | 23,604,000 | 99,379,685 |

පසුගිය වර්ෂ 5 ක කාලසීමාව තුළදී 2,200,000 ක් වූ සමස්ථ සාමාජිකයන් සතු අරමුදලින් 22,128 ක් වූ සීමිත පිරිසකට පමණක් මෙසේ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට මණ්ඩලය කටයුතු කර තිබුණද, අධ්‍යාපන කටයුතු කර ගෙන යෑමට හැකියාවක් නොමැති අරමුදලේ සාමාජිකයන්ගේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නැංවීම සඳහා වූ වැඩපිළිවෙලක් පිළිබඳව සමාලෝචිත වර්ෂය තෙක් මෙතෙක් මණ්ඩලයේ අවධානය යොමුවී නොතිබුණි.

### 4.1.2 ආයෝජන හා ආයෝජන ආදායම්

සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට රුපියල් මිලියන 135,099 ක් වූ ආයෝජන, මිලදී ගැනීම් සහ කල්පිරීම් ගැළපීමෙන් පසුව වර්ෂය අවසාන ශේෂය රුපියල් මිලියන 150,000 ක් දක්වා වැඩිවී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කෙටිකාලීන රීපෝ ආයෝජන

කෙටිකාලීන රීපෝ ආයොජනයක් ලෙස දක්වමින් 2006 වර්ෂයේ සිට දීර්ඝකාලීන ද්විපාර්ශවීය ගිවිසුම් එකඟතාවයක් මත එක්තරා රාජ්‍ය බැංකුවකින් මණ්ඩලයට සපයනු ලබන සේවය වෙනුවෙන් සහනදායි ප්‍රතිදානයක් ලෙස ලබාදී තිබුණු රු. 500,000,000 ක තැන්පතුවකට 2012 වර්ෂයේදී භාණ්ඩාගාර බිල්පත් සඳහා දින 364 කට ගෙවූ පොළි අනුපාතයවත් නොලැබී යෑම නිසා මණ්ඩලයට 2012 වර්ෂයේදී අහිමිවී ගිය ආදායම ආසන්න වශයෙන් රු. 12,011,821 ක් විය. "2013 වර්ෂයේ මාර්තු හා අගෝස්තු මාස වලදී පිළිවෙලින් රු. මිලියන 10 ක් හා රු. මිලියන 490 ක් ද වශයෙන් එකතුව රු. මිලියන 500 ක් වූ මෙම ආයෝජනය පිළිවෙලින් සියයට 15 ක හා සියයට 12 ක පොළි මත අදාළ බැංකුවේ ස්ථාවර තැන්පතු වල අලුත් කර ඇති බව" මෙයට පිළිතුරු වශයෙන් මණ්ඩලයේ සභාපතිවරයා දන්වා තිබුණි.

(ආ) කොටස් වෙළඳපොළ ආයෝජන

2012 දෙසැම්බර් 31 වන දිනට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල විසින් කළඹ 1 හා 2 ලෙස කොටස් 115,385,085 ක කර තිබුණු රු. 8,620,461,119 ක ආයෝජනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 ජූනි 30 දිනට කළඹ 1 හා 2 ලෙස කොටස් වෙළඳපොළේ නිල ලැයිස්තුගත සමාගම් 83 ක කොටස් 107,312,668 ක මණ්ඩලය විසින් රු. 8,013,793,452 ක්

ආයෝජනය කර තිබුණි. මෙම ආයෝජනයෙන් සමාගම් 68 ක කොටස් 83,036,582 ක් ආයෝජනය කර තිබූ රු. 6,333,036,059 ක ආයෝජනය කොටස් වෙළඳපොළේදී රු. 4,864,387,677 දක්වා රු. 1,468,648,382 කින් මිල පහළ වැටී තිබුණි.

(ii) 2012 වර්ෂයේදී කොළඹ කොටස් වෙළඳපොළ තරමක පසුබෑමකට ලක්වී තිබුණු අතර, 2010 හා 2011 වර්ෂයන් හා සසඳා බලන විට 2012 වර්ෂයේදී ලැබුණු කොටස් වෙළඳපොළේ ආයෝජන ආදායමේ අඩුවීම පහත සඳහන් පරිදි විය.

| වර්ෂය | සමාගම් ගණන | කොටස් ගණන | ආයෝජිත මුදල ජන 01 දිනට රු | ලැබූ ආයෝජන ආදායම රු | ආදායමේ ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|
| 2010 | 116 | 41,549,265 | 2,719,879,864 | 1,308,502,652 | 48.1 |
| 2011 | 130 | 78,211,481 | 5,204,377,279 | 703,052,274 | 13.5 |
| 2012 | 107 | 101,999,123 | 7,713,939,116 | 324,179,030 | 4.2 |

2012 වර්ෂයේදී මෙම මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කරනු ලැබුවේ නම් ලැබිය හැකිව තිබුණු ආදායම මත මෙම ආයෝජනයෙන් ඇස්තමේන්තුගත ආදායම් අහිමිවීම රු. 577,580,453 ක් විය. "කොටස් වෙළඳපොලේ ආයෝජන ප්‍රතිලාභ වැඩි එමෙන්ම අවදානමද ඉතාම වැඩි අතර, ප්‍රතිලාභ සලකා බැලිය යුත්තේ දිගුකාලීනව බවද, කොටස් වෙළඳපොළ ඉහළ ගිය අවස්ථාවලදී ඉතා ඉහළ ප්‍රතිලාභ ලබාගෙන ඇති බවද, මෙයට පිළිතුරු වශයෙන් මණ්ඩලයේ සභාපතිවරයා දන්වා තිබුණි.

(iii) කළඹ 1 හා කළඹ 2 ආයෝජනය ලෙස 2012 වර්ෂයේ දී සමාගම් 25 ක කොටස් 13,046,750 ක කර තිබුණු රු. 226,125,038 ක ආයෝජනයෙන් මණ්ඩලයට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. පසුගිය වර්ෂ 3 ක කාලසීමාව තුළදී එසේ ආදායම් කිසිවක් නොලැබුණු මණ්ඩලයේ අරමුදල් ආයෝජිත සමාගම් පිළිබඳ විස්තරයක් පහතින් දක්වා ඇත.

| වර්ෂය | සමාගම් ගණන | ආයෝජිත කොටස් | ආයෝජිත මුදල |
|---|---|---|---|
| 2010 | 17 | 4,111,468 | 119,083,880 |
| 2011 | 18 | 7,683,979 | 163,867,080 |
| 2012 | 25 | 13,046,750 | 226,125,038 |

(iv) අරමුදලට කොටස් ආයෝජනයෙන් ලැබෙන ආදායම අඩුවීම හා දිගින් දිගටම කොටස් වෙළඳපොළේ කොටස් මිල පහළ වැටීම පිළිබඳ නොසලකා 2012 වර්ෂයේ දී නිල ලැයිස්තුගත සමාගම් 42 කින් කොටස් වෙළඳපොළෙන් අලුතින් කොටස් 23,240,912 ක් රු. 1,810,894,725 කට මිලදී ගෙන තිබුණු අතර, 2013 ජූනි 30 දින වන විට මෙසේ සමාගම් 26 කින් රු. 879,359,901 කට අලුතින් මිලදීගත් කොටස් 8,030,618 ක වටිනාකම කොටස් වෙළඳපොළේ දී රු. 248,609,303 කින් අඩුවී තිබුණි.

(v) මණ්ඩලය 1997 - 1999 කාල පරිච්ඡේදය තුළ දී නිල ලැයිස්තුගත නොවන සමාගම් 3 ක කොටස් 4,067,500 ක රු. 485,834,544 ක් ආයෝජනය කර තිබුණි. එම සමාගම් තුන සඳහා 2011 හා 2012 වර්ෂයන්හි දී ලැබූ ආදායම හා ආදායමේ ප්‍රතිශතය පිළිබඳ විස්තරයක් පහත දක්වා ඇත.

| සමාගම | ආයෝජනය | 2011 ආදායම රු | 2011 ප්‍රතිශතය % | 2012 ආදායම රු | 2012 ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|
| 1 | 14,248,606 | නැත | – | නැත | – |
| 2 | 625,000 | 93,750 | 15 | 93,750 | 15 |
| 3 | 470,960,937 | 12,600,000 | 2.67 | 12,600,000 | 2.67 |
| එකතුව | 485,834,544 | 12,693,750 | 2.61 | 12,693,750 | 2.61 |

මෙම නිල ලැයිස්තුගත නොවන සමාගම් වල කරන ලද ආයෝජනය සඳහා වාර්ෂිකව ලැබී තිබුණු සමස්ත ආදායමේ ප්‍රතිශතය සියයට 2.61 ක් විය. රු. 14,248,606 ක් ආයෝජිත සමාගමකින් 2011 හා 2012 වර්ෂ සඳහා ආදායම් ලැබී නොතිබුණි. මෙම කොටස් කොටස් වෙළෙඳපොළේ ගනුදෙනු සඳහා යොදාගත නොහැකිවීම නිසා ප්‍රාග්ධන ලාභ හෝ ආයෝජිත මුදල් ආපසු ලබා ගැනීමේ අවදානමක් පැවතුණි.

(vi) 2006 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මකව තිබූ මණ්ඩලයේ ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශණය 2012 දෙසැම්බර් 01 දින නැවත සංශෝධනයකට භාජනය කර තිබුණි. මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 8 (අ) හා (ඈ) වගන්ති යටතේ මණ්ඩලය වෙත පවරා දී ඇති බලතල මණ්ඩලය විසින් ඍජුවම මැදිහත් වී අනුමත කර ක්‍රියාත්මක කරනවා වෙනුවට සමපේක්ෂණ චේතනාවෙන් සිදුකරනු ලබන කොටස් වෙළඳපොළ ගනුදෙනු වලදී ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 2006 සැප්තැම්බර් 4.1 (බී) මගින් හා 2012 දෙසැම්බර් 4.2 (ඒ) xi මගින් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය වෙත බලතල පවරා දීම ප්‍රශ්නගත කරුණක් බව නිරීක්ෂණය කෙරේ.

- යා කිරීම් "ඒ" හි සඳහන් අලාභයට කොටස් හා ඒකක විකිණීම සඳහා වූ අනුමැතියට අදාළ වගන්ති වෙනුවට මහා භාණ්ඩාගාරයේ එකඟතාවය හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත අලාභයට කොටස් අලෙවිය සිදුකල හැකි බවට වගන්ති ඇතුළත් කරනවා මිස අලාභයට කොටස් හා ඒකක විකිණීමට මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි ඇතුළත් වගන්තියේ ගැටලු සහගත තත්ත්වයක් ඇති බව නිරීක්ෂණය කෙරේ. 2010 වර්ෂයේ දී මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් අනුමැතිය යටතේ රු. 16,429,168 ක අලාභයට එක්තරා සමාගමක කොටස් විකුණා තිබුණි.

(vii) 624,570 ක් වූ කොටස් වල රු. 25,227,541 ක් ආයෝජිත සමාගම් 2 ක් ඈවරකරණයට ලක්වී තිබුණු අතර, කොටස් 178,700 ක රු. 4,066,314 ක් ආයෝජිත සමාගමක්, ලැයිස්තුගත සමාගම් ලැයිස්තුවෙන් ඉවත් කර තිබීම නිසා 2000 වර්ෂයට ආසන්න කාලයක සිට මණ්ඩලයට එම සමාගම් වල ආයෝජිත රු. 29,239,855 ක මුදල හෝ වෙනත් ආදායම් කිසිවක් හෝ ලබාගත නොහැකි වී තිබුණි.

(viii) 2012 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 1 1/2 සිට වර්ෂ 14 ක් දක්වා කාල සීමාවක් තුළ ප්‍රාග්ධන වෙළඳපොළේ ගනුදෙනු සිදුකර නොමැති සමාගම් 06 ක ආයෝජිත මුදල රු. 93,074,734 ක් වූ අතර, එසේ කොටස් වෙළඳපොළේ ගණුදෙනු සඳහා මෙම ආයෝජනය යොදා ගෙන නොතිබීම නිසා මණ්ඩලයට ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට ද නොහැකිවී තිබුණි.

(ix) 2011 ජනවාරි 01 දිනට කොටස් වෙළඳපොළේ කර තිබුණු ආයෝජනය රු. 5,204,377,279 ක් සිට 2012 ජනවාරි 01 දින වනවිට රු. 7,713,996,715 ක් දක්වා වැඩිවී තිබුණු නමුත්, ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ කොටස් විකිණීමෙන් ලැබූ ප්‍රාග්ධන ලාභයේ අඩුවීම රු. 430,572,328 ක් වූ අතර එසේ අඩුවීමේ ප්‍රතිශතය 77.6% ක් විය.

(x) මණ්ඩලයේ 2012 ජනවාරි 01 දිනට කළඹ 1 හා කළඹ 2 ලෙස සමාගම් 104 ක ආයෝජනය කර තිබුණු රු. 7,228,104,572 ක මුදලින් රු. 5,539,965,503 ක් හෙවත් සියයට 76.64 ක් ආයෝජනය කර තිබුණේ සමාගම් 22 කය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

මෙම සමාගම් 22 හි කරන ලද සමස්ත ආයෝජනයට ලැබූ අදායමේ ප්‍රතිශතය සියයට 4.28 ක් වූ අතර, සමාගම් 6 ක් හැරුණු විට අනෙකුත් සමාගම් 16 න්ම අරමුදලට ලැබී තිබුණේ සියයට 0.17 සිට සියයට 4.28 ක් දක්වා වූ ඉතාමත්ම අඩු ආදායම් ප්‍රතිශතයන්ය. "ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට නොහැකි වී ඇති බැවින් ලබා ගත හැකිවූ ආදායම් ප්‍රතිශතය අඩුවී ඇති බව" මෙයට පිළිතුරු වශයෙන් මණ්ඩලයේ සභාපතිවරයා දන්වා තිබුණි.

(ඇ) සමාගම් 02 ක ආයෝජනය කරන ලද ණයකර හා පොරොන්දු නෝට්ටු වෙනුවෙන් වර්ෂ 10 කට පෙර සිට ලැබිය යුතු ආයෝජන පොළී රු. 27,854,580 ක් අයකර ගැනීමට 2013 ජූනි 30 දින වන විටත් මණ්ඩලයට නොහැකි වී තිබුණි. "එක් සමාගමක් මූල්‍ය දුෂ්කරතාවයකට මුහුණපෑම හා අනෙක් සමාගමට එරෙහිව පවතින අධිකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් මෙම මුදල් අයකර ගැනීමට නොහැකි වී ඇති බව" මෙයට පිළිතුරු වශයෙන් මණ්ඩලයේ සභාපතිවරයා දන්වා තිබුණි.

(ඈ) මණ්ඩලය එක්තරා ඒකක භාර අරමුදලක 1997 වර්ෂයේ දී මිලදී ගත් ඒකක 1,000,000 ක් සඳහා ආයෝජනය කර තිබුණු මුදල රු. 10,000,000 ක් විය. මෙම ඒකක භාර ආයෝජනය මිලදී ගත් වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම එම ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් මණ්ඩලයට ලැබී නොතිබුණි. කෙසේ වුවද, 2012 වර්ෂයේදී පමණක් මෙම ආයෝජනය භාණ්ඩාගාර බිල්පත් වල සිදුකලේ නම් ඒ මඟින් ලැබිය හැකිව තිබුණු ඇස්තමේන්තුගත ආදායම රු. 1,169,000 ක් විය.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිසි පරිදි අවශ්‍යතා හඳුනා ගෙන මිළදී ගැනිම් සිදුනොකිරීම නිසා 2012 වර්ෂය අවසාන වනවිට භාවිතයට නොගෙන ගබඩාවේ ඉතිරිව තිබූ තිල ඇඳුම්වල වටිනාකම රු. 2,183,775 ක් විය. 2008 වර්ෂයේ සිට පැවත එන මෙම තිල ඇඳුම් තොග අපහරණය කිරීමට සමාලෝචිත වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) 1998 වර්ෂයේ දී රු. 2,090,600 කට මිලදී ගත් වාහනයක රජයේ තක්සේරුවක් ලබා නොගෙන 2012 වර්ෂයේදී ප්‍රසිද්ධ මිල දැක්වීමකින් අනතුරුව රු. 832,000 කට අලෙවි කර තිබුණි. මෙම වාහනය අලෙවි කරන අවස්ථාවේ දී පෞද්ගලික තක්සේරුකාර සමාගමක් විසින් ලබාදී තිබුණු තක්සේරුවකට අනුව එහි වෙළඳපොළ අගය රු. 1,300,000 ක් බව නිගමනය වී තිබුණි.

## 4.3 මෙහෙයුම් ආකර්යක්ෂමතා

නීතිපති නොවිමසා එක්තරා සමාගමක් සමඟ එළඹෙන ලද ගිවිසුමක් කඩකිරීමක් මත විත්ති පාර්ශවය ලෙස මණ්ඩලයට එරෙහිව වූ අභියාචනා අධිකරණ නියෝගයකින් අදාළ පැමිණිලිකාර සමාගමට ගෙවීමට සිදු වූ රු. 21,900,000 ක මුදලක් සම්බන්ධයෙන් කරන ලද අභියාචනයක ප්‍රතිඵලයක් ලෙස එම සමාගම අධිකරණයේ තැන්පත් කරන ලද බැංකු ඇපකරයේ වටිනාකම මණ්ඩලයට ආපසු ලැබිය යුතු මුදලක් සේ ගිණුම්ගත කර තිබුණි. මෙම අධිකරණ ක්‍රියාවලිය 2013 ජූනි 30 වන විටත් අවසන්ව නොතිබුණු අතර, මෙම මුදල් ගෙවීම අවාසි සහගත අධිකරණ ක්‍රියාවලියක් මත සිදු වූවක් වන බැවින් මුදල් ආපසු ලැබීමේ අවිනිශ්චිතතාවයක් පැවතුණි.

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

2009 ජූනි මාසයේදී රු. 4,473,200 ක් ගෙවා මිලදී ගන්නා ලද එකම වර්ගයේ වාහන 3 ක් මිලදී ගෙන වසර 3 කට ආසන්න කාල සීමාවක් තුළදී රු. 1,900,000 ක පෞද්ගලික ආයතනයක තක්සේරුවක් මත රු. 1,901,000 කට ටෙන්ඩර් මගින් අලෙවි කර තිබුණි. මෙම අලෙවියෙන් රු. 363,590 ක අලාභයක් ලබා තිබුණි.

## 4.5 අරමුණු වලට පටහැනි වියදම්

භාණ්ඩාගාර අනුමැතියකින් තොරව මණ්ඩලයේ අරමුණු වලට පටහැනිව මණ්ඩලයේ නිලධාරීන් විසින් පවත්වාගෙන යනු ලබන ක්‍රීඩා සමාජය සඳහා රු. 2,000,000 ක ණය මුදලක් කිසිදු ගිවිසුම්ගත බැඳීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී ලබාදී තිබුණි.

## 4.6 අනුමැතිය නොලත් ගනුදෙනු

මණ්ඩලය සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ක්‍රියාත්මක වන ආයතනයක් බව දක්වමින් අතිකාල පැයකට පැය එකහමාරක් සහ සෙනසුරාදා / ඉරිදා සහ රජයේ නිවාඩු දිනවල අතිකාල පැය 8 ක් සම්පූර්ණ විමත් සමඟ දිනක වැටුපක් ද එකතු කර අතිකාල ගෙවීම නිසා මණ්ඩලයේ 2012 වර්ෂයේ අතිකාල පිරිවැය රු. 16,986,225 ක් වී තිබුණි. පනත ප්‍රකාරව මෙසේ අතිකාල ලබා ගැනීමට මණ්ඩලයේ නිලධාරීන් සතියකට දින පහමාරක් සේවය කල යුතු වන අතර, වාර්ෂික නිවාඩු දින 21 කට සීමාකර තිබුණ ද ඊට පටහැනිව නිලධාරීන්ට වාර්ෂික නිවාඩු 42 ක් ලබාදීම හා සතියකට දින 5 ක් සේවාවක් ඉටු කිරීමට ඉඩ ලබාදී තිබුණි.

## 4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

අංක පීඊ/ඩී 12 හා 2003 ජූනි 6 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට හා මු.රෙ 502 (2) 11 පරිශිෂ්ටයේ 9 වන උපලේඛණයට පටහැනිව විධිමත් පවරා දීමකින් තොරව මණ්ඩලයට අයත් රු. 6,189,922 ක් වටිනා අංක පීබී - 1089 දරන කැබ් රථය ජනාධිපති ලේකම් කාර්යාල වෙත ලබාදී තිබුණු අතර, එම වාහනය ජනාධිපති ලේකම් කාර්යාලයේ තිබිය දී 2012 වර්ෂයේ අලුත්වැඩියා හා සේවා කටයුතු වෙනුවෙන් මණ්ඩලය රු. 384,578 ක් වැයකර තිබුණි. ජනාධිපති ලේකම් කාර්යාලයේ තිබූ මෙම වාහනයේ අලුත්වැඩියා වියදම් වෙනුවෙන් පසුගිය වර්ෂයේ දී ද රු. 646,868 ක් වැයකර තිබුණි.

### 4.8 සේවක පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

සමාලෝචිත වර්ෂය අවසානයේ දී වූ රු. 90,119,163 ක පාරිතෝෂිත වෙන්කිරීම් වෙනම අරමුදලක් ලෙස ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 4.9 වාහන උපයෝජනය

සමාලෝචිත වර්ෂයේ දී මණ්ඩලයේ වාහන 2 ක් අනතුරු වලට භාජනය වීමෙන් සිදු වූ රු. 214,665 ක අලාභය රක්ෂණයෙන් හෝ එම අනතුරු වලට වගකිව යුතු පාර්ශවයන්ගෙන් හෝ අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණු අතර, අනතුරට ලක්වූ තවත් වාහන 3 ක් සම්බන්ධයෙන් වියදම් ඇස්තමේන්තු ද සකස් කර නොතිබුණි.

## 5 ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිලි සංකීර්ණය සඳහා දැරීමට අපේක්ෂිත පිරිවැය හැරුණු විට තථ්‍ය මිලදී ගැනීම් හා ප්‍රසම්පාදන සැලැස්මේ මුළු පිරිවැය අතර විචලනය සියයට 50 කට ආසන්න විය. එබැවින් ඉදිරි අරමුදල් ප්‍රවාහ පිළිබඳව කරනු ලබන මෙවැනි සැලසුම් ඵලදායි නොවන බවට නිරීක්ෂණය කෙරේ.

### 5.2 අභ්‍යන්තර විගණනය

මු. රෙ. 133 (2) ප්‍රකාරව මණ්ඩලයේ සමහර වැදගත් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක වී නොතිබුණි.

### 5.3 අයවැය ලේඛණමය පාලනය

මණ්ඩලයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේ දී සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වී ඇති බැවින්, අයවැය ලේඛණය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගැනීම කෙරෙහි තවදුරටත් අවධානය යොමු කල යුතුව තිබුණි.

## 6 පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මණ්ඩලයේ සභාපති වෙත වරින්වර දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය.

(ආ) අයවිය යුතු මුදල් හා ගෙවිය යුතු මුදල්.

(ඇ) පනතට කළ යුතු කාලීන සංශෝධන.

(ඈ) ආයෝජන.

**එච්.ඒ.එස්. සමරවීර**
*විගණකාධිපති*

# විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මණ්ඩලයේ පැහැදිලි කිරීම්

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති

මණ්ඩලය විසින් දේපළ හා පිරියත පවත්වාගෙන යනු ලබන්නේ හුදෙක්ම පරිපාලන කටයුතු සඳහා වන බැවින් යන්ත්‍ර, දේපළ හා පිරියත ප්‍රත්‍යාගණනය කිරීමට යන පිරිවැය එම ප්‍රත්‍යාගණනයෙන් ලැබෙන ප්‍රතිලාභය හා සැසඳීමේදී ආර්ථික වශයෙන් ඵලදායි නොවන ගනුදෙනුවක් බව අපගේ හැඟීමයි. එසේම, යන්ත්‍ර, දේපළ හා පිරියත ප්‍රත්‍යාගණනය කල යුත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති වලට අනුව මූල්‍ය වාර්තා සඳහා ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකල යුතු ගණුදෙනු සඳහා පමණක් වන බැවින්, හා මණ්ඩලය විසින් භාවිතා කරන දේපළ හා පිරියත වල සාධාරණ අගය නිතර වෙනස් නොවන බව අප විසින් නිරීක්ෂණය කර ඇති බැවින්ද, ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 16 හි 34 වන වගන්තියේ ප්‍රකාරව මෙවැනි වත්කම් ප්‍රත්‍යාගණනයක් කඩිනමින් සිදුකිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී.

### 2.2.2 සාමාජික ගිණුම් වලට බැර නොවූ ආයක මුදල්

සටහන් කර ගතිමි.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) සටහන් කර ගතිමි.

(ආ) සටහන් කර ගතිමි.

(ඇ) මෙම මුදල අදාළ නිලධාරියාගෙන් මාසිකව අයකර ගනු ලැබේ.

(ඈ) සේවයෙන් ඉවත්ව ගොස් ඇති සේවකයින්ගෙන් මණ්ඩලයට අයවිය යුතුව තිබෙන මෙම හිඟ මුදල එකී සේවකයින්ගෙන් හා ණය මුදල්වල ඇපකරුවන්ගෙන් අයකර ගෙන යනු ලැබේ.

(ඉ) සටහන් කර ගතිමි.

### 2.2.4 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

(අ) විමසුමේ සඳහන් පරිදි අදාළ ඉන්ධන වියදම් මෙම නිලධාරීන් 09 ගේ පෞද්ගලික ගමන් සඳහා නොවන අතර, අදාළ වර්ෂය තුළ මෙම නිලධාරීන්ගේ සමස්ථ ධාවන සඳහා වැයවූ මුදලය.

මණ්ඩලයේ නිලධාරීන් රාජකාරී කටයුතු සඳහා වාහන භාවිතා කිරීම පිළිබඳව අප අනුගමනය කරනුයේ මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2008 ජූලි 28 දිනැති අංක 50 දරන චක්‍රලේඛයේ සඳහන් උපදෙස්ය.

එම චක්‍රලේඛයට අනුව නිලධාරීන්ට පහත සඳහන් පරිදි මාසික ඉන්ධන දීමනාව වෙන්කර ඇත.

| | පෙට්‍රල් රුපියල් | ඩීසල් රුපියල් |
|---|---|---|
| සභාපති | 20,000 | 14,000 |
| ක්‍රියාකාරි අධ්‍යක්ෂ/ සාමාන්‍යාධිකාරි | 18,000 | 12,000 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි | 15,000 | 10,000 |
| මෙම පහසුකමට හිමිකම් ඇති වෙනත් නිලධාරින් (සහකාර සාමාන්‍යාධිකාරිවරුන්) | 12,500 | 8,000 |

අදාළ නිලධාරීන් විසින් මෙම මාසික දීමනාව ඉක්මවා ධාවනය කරන අවස්ථා වලදී එම අමතර වියදම අදාළ නිලධාරියාගේ මාසික වැටුපෙන් අයකර ගැනීම සිදුකරනු ලැබේ.

(ආ) එවකට පැවති උපදෙස් අනුව මණ්ඩලයෙන් ලබාදෙන ණය සඳහා පොළී අනුපාතය 4.2% දක්වා අඩු කිරීමට 1998.01.20 වන දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ එම අනුමැතිය මත මණ්ඩලීය සේවකයන් සඳහා 4.2% ක පොළී අනුපාතය මත ණය මුදල් ලබාදීමට ක්‍රියා කොට තිබේ. එසේම ඉහත පොළී අනුපාතය මත ලබාදුන් ණය ශේෂයන් පොළිය ද සමග මණ්ඩලයේ සේවකයින්ගේ මාසික වැටුපෙන් අයකර ගනු ලැබේ.

(ඇ) (i) අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත 2007 වසරේ අප්‍රේල් මස සිට සේවා නියුක්ති ආදායම වෙනුවෙන් ගෙවිය යුතු උපයනවිට ගෙවීම් බදු මණ්ඩලය විසින් දරනු ලැබේ.

(ii) සුභසාධක කටයුතු ලෙස ප්‍රධාන වශයෙන් වැයවී ඇත්තේ සේවකයන්හට වාර්ෂිකව ලබාදෙන නිල ඇඳුම් හා උදේ/සවස තේ ලබාදීම සඳහා දරන වියදමය. හුදෙක්ම සේවක සුභසාධන කටයුත්තක් ලෙස සලකා තේ ලබාදීම මණ්ඩලය ආරම්භ කළ දිනයේ පටන් සිදුකර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව මණ්ඩලයේ මුල්‍ය අධිකාරී සීමාවන්ට යටත්ව නිල ඇඳුම් ලබා දීමද 1993 වසරේ සිටම ක්‍රියාත්මක වේ. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදීද මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේද අනුමැතිය ඇතිව මෙම පහසුකම් ලබාදී ඇත.

(ඈ) මණ්ඩලයේ සේවකයින් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව මාසිකව ගෙවනු ලබන දිරි දීමනාව 1992 වර්ෂයේ සිට ගෙවා ඇති අතර, 2012 වර්ෂයේ දී ද ඒ ආකාරයෙන්ම ගෙවීම් සිදු කර ඇත. මෙම වරප්‍රසාදය සේවකයින් විසින් 1992 වසරේ සිට භුක්ති විඳින බැවින් එය නවතා දැමීම සිදුකල නොහැක.

(ඉ) 2012 වසර සඳහා සේවකයන්හට ප්‍රසාද දීමනා ගෙවා ඇත්තේ විගණන විමසුමෙහි සඳහන් පරිදි අංක 47 හා 2011 දෙසැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව නොව, අංක 49 හා 2012 දෙසැම්බර් 24 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුවය. එමෙන්ම, එම චක්‍රලේඛයෙන්ම 3.4 ට අනුව අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වනුයේ මෙම චක්‍රලේඛයේ විධිවිධාන වලට පරිබාහිරව කිසියම් ප්‍රසාද දීමනාවක් ගෙවන්නේ නම් පමණි. මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදි ප්‍රසාද දීමනා ගෙවා ඇත්තේ එකී චක්‍රලේඛයේ 1.1 වගන්තියට අනුව 2011 වසරේ ගෙවූ පදනමින් හා අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ඇතිවය. ඒ අනුව ඔබගේ විගණන විමසුම හා එකඟ විය නොහැක.

(ඊ) 2011 හා 2012 වර්ෂයන්ට අදාළ වාහන අනතුරු සම්බන්ධයෙන් වූ අලාභ හානි පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

2012 වසර සඳහා ස්ථාවර වත්කම් භෞතිකව සනාථ කෙරෙන භාණ්ඩ සමීක්ෂණ වාර්තාවක් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

### 2.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

(අ) මෙම මූල්‍ය කාර්ය පටිපාටි සංග්‍රහයේ ප්‍රසම්පාදන පරිපාටිය (Procurement Procedure) සම්බන්ධ කොටස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට ඇති අතර, ඉතිරි කොටසේ කෙටුම්පත් වාර්තාව පිළියෙල කොට අවසන්ව ඇති අතර, එය ඉදිරියේදී අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යොමුකොට මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

(ආ) මණ්ඩලයේ සේවක/සේවිකාවන් වෙනුවෙන් 1993 වසරේ සිට වසරක් පාසා නිල ඇඳුම් සැපයීමේ ක්‍රමයක් ක්‍රියාත්මක වේ. මෙම ක්‍රමය ක්‍රියාත්මක කොට ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙනි. එම ක්‍රමය අනුගමනය කරමින් 2012 වර්ෂය සඳහා ද සේවකයින්ට නිල ඇඳුම් සැපයීමට කටයුතු කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය මෙය හුදෙක්ම සේවක සුභසාධන කටයුත්තක් ලෙසට සලකා අනුමත කොට ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඵලදායි ආයෝජන උපක්‍රම මඟින් සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ පොළී හා ලාභාංශ ආදායම වැඩිකර ගත හැකිවූ අතර, නව ගිණුම්කරන ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව මණ්ඩලයේ ගිණුම් පිළියෙල කිරීමේදී වත්කම්වල ශුද්ධ වර්තමාන අගයේ වැඩිවීමක් ද සිදුවිය. ඒ අනුව මණ්ඩලයේ ආදායම 2011 වසරට සාපේක්ෂව 2012 වසරේදි රු. 840,727,502 කින් වැඩිවී ඇත.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) එකඟවේ.

(ආ) එකඟවේ

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

### 4.1.1 මෙහෙයුම් කාර්යසාධනය

(අ) සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත සේවක අර්ථසාධක අරමුදලේ ලියාපදිංචි සියලුම සේවායෝජකයින්, සියලුම පෞද්ගලික අර්ථසාධක අරමුදල් පවත්වාගෙන යන සේවායෝජකයින් මාසිකව දායක මුදල් තම සේවකයින් වෙනුවෙන් මෙම අරමුදලට බැර කරනු ලැබේ. විගණන විමසුමේ සඳහන් ආකාරයට සේවායෝජකයින් 227,612 ක් වුවද, ඔවුන් යම් සේවකයෙකු සේවයේ නියුක්ත කරන්නේ නම් පමණක් මෙම අරමුදලට එම සේවායෝජකයින් දායක විය යුතුය. ඒ අනුව, 2013 ජූලි මස අවසානය වනවිට සේවායෝජකයින් 71,444 ක ප්‍රමාණයක් මෙම අරමුදල වෙත මාසිකව දායක මුදල් බැර කරනු ලැබේ.

දිවයින පුරා විසිරී තිබෙන අපගේ ප්‍රාදේශීය කාර්යාල ජාලය උපයෝගි කරගෙන ස්වයංරැකියාවල යෙදෙන්නන් මෙම මණ්ඩලය වෙත බඳවාගැනීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වේ. විශේෂයෙන්ම ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියට සහ මිල්කෝ සමාගමට අනුයුක්තව සිටින සියලුම ස්වයංරැකියාවල යෙදෙන්නන් මෙම අරමුදලට දායක කර ගැනීමේ විශේෂ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වේ. ඒ අනුව, මෙම වර්ෂය අවසානය වනවිට ස්වයංරැකියා සාමාජිකත්වයේ විශේෂ වර්ධනයක් අපේක්ෂිතය. කෙසේ නමුදු, ස්වයංරැකියාවල යෙදෙන්නන් මෙම අරමුදලට බඳවාගැනිමේදී ඔවුන් සිය කැමැත්තෙන්ම දායක මුදල ගෙවිය යුතු වීමද වර්ධනයට බාධාවකි.

(ආ) මෙම අරමුදලේ සාමාජිකත්වය දැනට ලක්ෂ 22 ඉක්මවා ඇත. මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ගේ දූදරුවන්ගේ අධ්‍යාපන කටයුතු නංවාලීම සඳහා ප්‍රතිලාභ ක්‍රමයක් ආරම්භ කළහොත් එයට වැයවන මුදල් ප්‍රමාණය අති විශාල වේ. ඒ ආකාර විශාල වියදමක් දරා ගැනීමට මණ්ඩලයට හැකියාවක් නොමැත.

1980 අංක 46 දරන සේවානියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත අනුව වර්ෂය අවසානයේදී සෑම සාමාජික ගිණුමකටම ලාභාංශ හා පොළියක් බැර කිරීමට මණ්ඩලය බැඳී සිටී. මෙසේ ප්‍රමාණවත් මට්ටමකින් පොළියක් හා ලාභාංශ ලබාදීමට හැකිවනුයේ ආයෝජනය කිරීම සඳහා මුදල් ප්‍රමාණයක් ඉතිරි වුවහොත් පමණි. එමනිසා, විවිධ අවස්ථා හා කරුණු පදනම් කොට ගෙන සාමාජිකයින්ට ප්‍රතිලාභ ලබාදීම සඳහා දැනට මණ්ඩලය ක්‍රියාත්මක කරන වැඩපිළිවෙල දිගටම ක්‍රියාත්මක කිරීම යෝග්‍ය බව සඳහන් කළ හැක.

### 4.1.2 ආයෝජන හා ආයෝජන ආදායම්

(අ) කෙටි කාලීන රීපෝ ආයෝජන

එම රාජ්‍ය බැංකුව මගින් මණ්ඩලයට සපයන සුවිශේෂි කාර්යය සඳහා එක් කොන්දේසියක් ලෙස රුපියල් මිලියන 500 ක තැන්පතුවක් මාස 12 භාණ්ඩාගාර බිල්පත් පොලියට වඩා 0.25% ක ට අඩුවෙන් ආයෝජනය කිරීමට එකඟවී තිබුණි.

කෙසේ වෙතත්, 2013 සිට එම රුපියල් මිලියන 500 ආයෝජනය එක් අවුරුදු ස්ථාවර තැන්පත් වල අලුත් කර ඇති අතර, එම දිනයේ පවතින ස්ථාවර තැන්පත් පොළි අනුපාතය එම බැංකුව විසින් මණ්ඩලයට දීමට එකඟ විය.

ඒ අනුව දැනට පවතින එම ආයෝජනයේ විස්තර මෙසේය.

| ආයෝජනය අලුත් කළ දිනය | කල් පිරෙන දිනය | මුදල (රුපියල්) | වාර්ෂික පොළි අනුපාතය |
|---|---|---|---|
| 2013.03.19 | 2014.03.19 | 10,000,000 | 15.0 |
| 2013.08.19 | 2014.08.19 | 490,000,000 | 12.0 |
| **එකතුව** | | **500,000,000** | |

(ආ) කොටස් වෙළඳපොළ ආයෝජන

(i) 2013 ජූනි 30 දිනට කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සමාගම්වල ආයෝජනය කර ඇති මුදල (ඇවරකරණයට ලක්වී ඇති හා ලැයිස්තුගත ක්‍රමයෙන් ඉවත් කර ඇති සමාගම හැර) රු. 7,984,499,597.37 ක් වන අතර එහි වෙළඳපළ අගය රු.

6,767,995,192.40 කි. එමනිසා උපලබ්ධි නොවූ අලාභය රු. 1,216,504,404.97 ක් වේ. 2010 දී හා 2011 දී වෙළඳපොළේ පැවති හිතකර තත්ත්වය නිසා කොටස් වෙළඳපොළේ ඉතාම ක්‍රියාශීලිව මිළදී ගැනීම් හා විකිණීම් කරන ලදි. නමුත් 2010 හා 2011 වර්ෂවලට සාපේක්ෂව 2012 හා 2013 කොටස් වෙළඳපොළ පහත වැටීම නිසා කලින් මිලදී ගත් කොටස් වල පිරිවැය වෙළඳපොළ මිළට වඩා වැඩි අගයක් ගෙන ඇත. මෙය තාවකාලික තත්වයක් වන අතර, කොටස් වෙළඳපොළ මිළ ඉහළ යනවිට උපලබ්ධි නොවූ අලාභය අඩු වේ.

(ii) කොටස් වෙළඳපලේ ආයෝජන ප්‍රතිලාභ වැඩි, එමෙන්ම අවදානමද ඉතාම වැඩි අතර, ප්‍රතිලාභ සලකා බැලිය යුත්තේ දිගුකාලීනවය. කොටස් ආයෝජනයන්ගෙන් උපරිම ලාභ ලබා ගැනීම සඳහා දෙස් විදෙස් ආයෝජකයන්ගේ විශ්වාසය සහිත සංවර්ධිත වෙළඳපොළක් රටට අත්‍යාවශ්‍ය වන බැවින්, කොටස් වෙළඳපොලේ ක්‍රියාකාරීව සහභාගිවීම අත්‍යාවශ්‍ය වගකීමක් බව ප්‍රධාන පෙළේ ආයතනික ආයෝජකයෙක් වශයෙන් මණ්ඩලය හඳුනාගෙන ඇත. ඒ අනුව, මුළු ආයෝජනයෙන් 06%ක උපරිමයකට යටත්ව කොටස් වෙළඳපොළ ආයෝජනය කිරීමට තීරණය කර ඇති අතර, කොටස් වෙළඳපොළ ඉහළ ගිය අවස්ථාවලදී ඉතා ඉහළ ප්‍රතිලාභද ලබාගෙන ඇත.

(iii) කොටස් වල ආයෝජන ප්‍රතිලාභ වැඩි එමෙන්ම ඉතා ඉහළ අවදානම් සහිත ආයෝජනයක් නිසා අවදානම අඩුකිරීමට වැඩි සමාගම් ගණනක ආයෝජනය කර විවිධාංගිකරණය (diversification) කර ඇත. සියලු සමාගම් වලින් සෑම වර්ෂයකම ආදායම බලාපොරොත්තු විය නොහැක.

(iv) එකඟවේ.

(v) ඔබ විසින් මෙහි සඳහන් කර ඇති ආයතන වන්නේ ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස්, ෆිච්රේටින් සමාගම සහ ලංකා සෝල්ට් සමාගමය. ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් සමාගමේ කොටස් වෙනුවෙන් 2012/2013 සහ 2013/2014 වසර සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 8.7 ක් සහ රුපියල් මිලියන 16.2 ක් ලාභාංශ වශයෙන් ලැබී ඇති අතර, මේ වනවිට එම ආයෝජනයෙන් රුපියල් මිලියන 174.8 ක් වැනි විශාල මුදලක් ලාභාංශ ලෙස ලැබී ඇත. මීට අමතරව එම සමාගමේ කොටස් විකුණා 2010 වසරේදී රුපියල් මිලියන 30ක් ප්‍රාග්ධන ලාභද ලබා ඇත. ෆිච්රේටින් සමාගම විසින් අනිකුත් සමාගම් වලට සාපේක්ෂව 2011 සහ 2012 වසර සඳහා ආකර්ශනීය ලාභාංශ ප්‍රතිශතයක් ගෙවා ඇත. ලංකා සෝල්ට් සමාගමේ 2012 වසර අවසානය වන විට ශුද්ධ වත්කම් වල වටිනාකම රුපියල් මිලියන 686 ක් දක්වා වර්ධනයවී ඇති අතර, එය ආයෝජිත මුදල වන රුපියල් මිලියන 470 ට වඩා රුපියල් මිලියන 216 ක වැඩිවීමක් බැවින් එහි ආයෝජිත මුදල නැවත අයකර ගැනීමේ අවදානමක් නොමැති බව අපගේ හැඟීමයි. තවද ජාතික ආර්ථිකය තුළ මෙම ආයතනයෙහි ඇති වැදගත්කම සලකා මෙම ආයෝජනය සිදුකර ඇත.

(vi) මණ්ඩලයට 2002 දී ආයෝජන ප්‍රතිපත්තියක් හඳුන්වා දුන් අතර, 2006 දී හා 2012 දී එය වඩාත් සවිස්තරාත්මකව පිළියෙල කරන ලදි. මෙම ආයෝජන ප්‍රතිපත්තිය ආයෝජන හා මූල්‍ය ක්ෂේත්‍රයේ දීර්ඝකාලීන අත්දැකීම් හා පළපුරුදු සහිත වෘත්තීය සුදුසුකම් හා නිපුණත්වයක් ඇති ප්‍රවීණ අධ්‍යක්ෂවරුන් සහිත මණ්ඩලයකින් අනුමත කර ඇත. මෙම ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය විසින් ආයෝජන මිලදී ගැනීමේදී හා විකිණීමේදී අනුගමනය කල යුතු ක්‍රියාපටිපාටින් හඳුන්වා දී ඇති අතර, ඒවා

ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය මණ්ඩලයට බලතල පවරා ඇත. අවසානයේ මෙම සියලු ආයෝජන ගනුදෙනු ඉහළ කළමනාකරනයේ එනම් අතිරේක සාමාන්‍යාධිකාරී, සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව සිදුකල යුතුය.

(vii) ඈවරකරණයට ලක් වූ කොරියා සිලෝන් ෆුට්වෙයාර් සමාගමේ නඩුවේ නැවත කැඳවීමේ දිනය 2014.04.25 වන අතර මැග්පෙක් සමාගමේ උසාවි නියෝගයට එරෙහි ඇපැල මෙතෙක් කැඳවා නැත. වේයන්ගොඩ ටෙක්ස්ටයිල්ස් කොටස් වෙළඳපොළ සමාගම් ලැයිස්තුවෙන් ඉවත් කර ඇති අතර, ඒ පිළිබඳ තවදුරටත් තොරතුරු සොයමින් පවතී.

(viii) ඔබ සඳහන් කළ සමාගම් 6 වන්නේ සියරා කේබල්ස්, රයිගම් වයඹ, හොටෙල් සර්විසස්, ඩයලොග්, ලංකා IOC සහ රිචඩ් පීරිස් එක්ස්පෝර්ට්ස්. එයින් ලංකා IOC හි කොටස් සියල්ල 2013 දී විකුණා ප්‍රාග්ධන ලාභ ලබාගෙන ඇත. අනිකුත් සමාගම් කොටස්ද ඉදිරියේදී විකුණා ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට අපේක්ෂා කරමු.

(ix) 4.1.2 (ආ) (II) හි පිළිතුර මෙයටද අදාළ වේ.

(x) මෙහිදී ඔබ සඳහන් කර ඇති සියලුම සමාගම් කොටස් සඳහා ලාභාංශ ලැබී ඇති නමුත් සියලුම සමාගම් කොටස් සඳහා පැවති වෙළඳපළ මිළ ගණන් යටතේ ප්‍රාග්ධන ලාභ ලබා ගැනිමට නොහැකි වී ඇති බැවින්, ලබාගත හැකිවූ ආදායම් ප්‍රතිශතය අඩු වී ඇත. කොටස් වෙළඳපොළේ ස්වභාවය අනුව ලාභාඅලාභ දෙකම දරාගැනීමට සිදුවේ. කෙසේ වෙතත් කොටස් වෙළඳපොළ සාර්ථකවූ පසු මෙම සමාගම් වලින්ද ප්‍රාග්ධන ලාභ ලබාගැනීමට අපේක්ෂා කෙරේ.

(ඇ) එකඟවේ.

(ඈ) 1997 දී Namal Growth Fund හි ඒකක 2,500,000 න් රු. 10 බැගින් මිලදී ගෙන ඇත. ඉන් ඒකක 1,500,000 ක් 2006, 2007 හා 2009 වර්ෂ වල විකුණා රු. 33,183,600 ක ප්‍රාග්ධන ලාභ ලබාගෙන ඇති අතර, 1999 දී හා 2001 වර්ෂ වලදී ලාභාංශ ද ලැබී ඇත.

මෙම ඒකක වලින් ලබාගත හැකි ප්‍රධානතම ප්‍රතිලාභය වන්නේ එම ඒකක විකුණා ලබාගත හැකි ප්‍රාග්ධන ලාභයයි. රු. 10 ට මිලදී ගත් මෙම ඒකකයක දැන් වෙළඳපළ වටිනාකම රු. 96/93 ක් වන අතර ඒකකයක උපලබ්ධි නොවූ ලාභය රු. 86/93 ක් වේ.

මෙම ඒකක ඕනෑම අවස්ථාවක එදින පවතින මිලට අවශ්‍ය ප්‍රමාණයක් විකිණිය හැකිය.

සුදුසු අවස්ථාවක විකිණීම සඳහා ඉතිරි ඒකක රඳවා ගෙන ඇත.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) අලුතින් බඳවා ගැනීමට අපේක්ෂිත සේවකයන්ගේ අවශ්‍යතාවයන් ද සලකා බලා නිල ඇඳුම් ඇනවුම් කිරීමේ ක්‍රියාවලියක් මණ්ඩලය විසින් 2010 වසර දක්වා ක්‍රියාත්මක විය. විවිධ හේතුන් නිසා මෙම නව බඳවා ගැනීම් අපේක්ෂිත ආකාරයෙන්ම සිදුවී නොමැති බැවින්, මෙසේ අතිරික්ත තොග ඉතිරිවී ඇත. මෙය 1993 වසරේ සිට 2010 වසර දක්වා ඉතිරිව ඇති මුළු තොගයේම වටිනාකමයි.

මෙම ඉතිරි ඇඳුම් තොග අපහරනය සඳහා අභ්‍යන්තර සේවකයින්ගෙන් මිළ ගණන් කැඳවූ අතර, ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් නොලැබුණි. එමනිසා නැවතත් ප්‍රසිද්ධ මිළ කැඳවීමක් කර ඉක්මනින් මෙම ඉතිරි නිල ඇඳුම් තොග අපහරනය කිරීමට සැලසුම් කර ඇත. තවද, 2011

වසරෙන් පසු අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගැනීමෙන් පසු පමණක් නිල ඇඳුම් ඇනවුම් කරන බැවින් මෙවැනි අතිරික්ත තොග ඉතිරි නොවේ.

(ආ) පර්ජෝ වාහන අංක 300-8679

පර්ජෝ වර්ගයේ අංක 300-8679 දරන වසර 14 ක් පමණ (1998 සිට) භාවිතා කළ කාර් රථය විකිණීමට මණ්ඩලයේ සේවකයන්ගෙන් මිළ ගණන් කැඳවූ අතර, එම අවස්ථාවේදී වාහනය ධාවනය වන මට්ටමේ පැවතිනි. මිළ ගණන් පරීක්ෂා කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යන අතරතුරදී වාහනය ධාවනය කිරීමට නොහැකි මට්ටමට පත් වූ අතර, එය ගාල්කර තැබීමට සිදුවිය. මේ හේතුවෙන් අයදුම්කරුවන් 08 දෙනෙකු තමන් විසින් ඉදිරිපත් කර තිබූ මිළ ගණන් ලිඛිතව ඉල්ලා අස්කර ගන්නා ලදි. 09 වන ස්ථානයේ පැවති මුදල තක්සේරු වටිනාකමට වඩා ඉතා පහළ අගයක් ගත් බැවින්, අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉල්ලීම පරිදි මෙම කාර් රථය අපහරණය සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළ කෙරිණි. එහිදී ඉදිරිපත් වූ ඉහළම මිළට වාහනය අපහරණය කිරීමට තීරණය විය. ඒ වනවිට මාස 03 ක් පමණ වාහනය ධාවනය කර නොතිබුණ අතර, දිරායන තත්ත්වයට පත්වී තිබිණි. වාහනයේ ක්ෂය කිරීම් අඩුකළ ශුද්ධ පිරිවැය ඉතා අඩු මට්ටමක පැවති බැවිනුත්, ධාවනයට නුසුදුසු වාහනය තවදුරටත් තබා ගැනීමෙන් සිදුවන අලාභය අවම කර ගැනීම සඳහාත් විකුණුම් මිළ රු. 832,000 ක මුදලකට මෙම කාර් රථය අපහරණය කරන ලදි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

මතුරට වැවිලි සමාගමේ කොටස් 10,200,000 ක් රු. මිලියන 478 කට 1997.06.19 දින මිළදී ගෙන, 1998.04.17 දින විකිණීමෙන් වර්ෂයකටත් වඩා අඩු කාලයකදී රු. මිලියන 256.4 ක විශාල ප්‍රාග්ධන ලාභයක් (64.36% p.a) ලබාගැනීමට හැකිවූ බැවින් මෙම ගනුදෙනුව මෙහෙයුම් අකාර්යක්ෂමතාවයක් නොවන බව අපගේ අදහසයි.

කෙසේ වෙතත් 56/98 (1) දරන සමර්විල් සමාගම සමඟ ඇති නඩුව සම්බන්ධයෙන් අධිකරණ නියෝගයට එරෙහිව මණ්ඩලය විසින් අභියාචනයක් ලැයිස්තුගත කර ඇති අතර අභියාචනාධිකරණ නියෝග අනුව ඉහත කී සමාගම විසින් රුපියල් මිලියන 21.9 ක බැංකු ඇපකරයක් අධිකරණයේ තැන්පත් කර ඇත.

මණ්ඩලය විසින් ගොනුකරන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු අංක SC/CHC/20/2003 දරන නඩුව 2014.09.22 දින නැවත විභාගයට ගැනීමට නියමිතය.

## 4.4 හඳුනාගත් පාඩු

විගණන විමසුමට අදාළ මෙම වාහන 03 නිතර නිතර කාර්මික දෝෂයන්ට ලක්වීම සහ අධික ඉන්ධන දහනය වැනි හේතු නිසා සිදුවූ අධික නඩත්තු වියදම් හේතුවෙන් විකුණා දැමීමට තීරණය විය. ඒ අනුව, වාහන පරීක්ෂාව සහ තක්සේරු වාර්තා ලබාගැනීමේ පිළිගත් ආයතනයක් වන ලංකා ඔටෝමොබයිල් සංගමය මගින් තක්සේරු වාර්තාවක් ලබාගෙන මෙම වාහන ටෙන්ඩර් මඟින් රු. 1,901,000 කට අලෙවි කරන ලදි. එය තක්සේරු වාර්තාවේ මිළ වන රු. 1,900,000 ට වඩා මඳක් වැඩි මිලකි.

## 4.5 අරමුණුවලට පටහැනි වියදම්

මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන් විසින් පිහිටුවා ගෙන තිබෙන ක්‍රීඩා සමාජය මඟින් එම සාමාජිකයන්ගේ සුභසාධනය සඳහා පලටුපාන ප්‍රදේශයේ නිවාඩු නිකේතනයක් ගොඩනැගූ අතර, එහිදී ඇතිවූ අරමුදල් අවශ්‍යතාවයක් සඳහා රු. 2,000,000 ක ණය මුදලක් අධ්‍යක්ෂ මණ්ඩලයේ

අනුමැතිය ඇතිව ලබා දී ඇති අතර, එම ණය මුදල සඳහා එවකට පැවති වෙළඳපොළ පොළී අනුපාතය යටතේ 10% ක වාර්ෂික පොළියක් ද සමග මෙම මුළු ණය මුදල වාරික වශයෙන් අයකරගෙනු යනු ලබයි.

### 4.6 අනුමැතිය නොලත් ගනුදෙනු

මණ්ඩලයේ සේවකයින් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී පදනම් කරගනු ලබන්නේ සාප්පු හා කාර්යාල සේවක පනතයි. එම නිසා මෙම නිරීක්ෂණයෙන් ඉදිරිපත් වූ අතිකාල දීමනා ගෙවීම සහ නිවාඩු දිනවල අතිකාල සඳහා ගෙවීම පිළිබඳ අනුපාත එම පනතේ විධිවිධානවලට අනුව සිදුකර ඇත.

### 4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

අංක PB-1089 දරන කැබ් රථය ජනාධිපති ලේකම් කාර්යාලය විසින් 2012 සැප්තැම්බර් මස නැවතත් මණ්ඩලයට භාර දෙන ලදි. 2012 ජනවාරි සහ සැප්තැම්බර් යන මාස තුළ එම වාහනයේ අලුත්වැඩියා හා සේවා කටයුතු වෙනුවෙන් මෙම මුදල් වැය කළ අතර, වාහන අලුත්වැඩියා සඳහා අදාළ මුදල් සියල්ල ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලබාගන්නා ලදි.

### 4.8 සේවක පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

නව ගිණුම්කරන ප්‍රමිත වලට අනුකූලව (LKAS and SLFRS) සේවක පාරිතෝෂිත සඳහා මණ්ඩලයේ වගකීම සහතිකලත් ජීව ගණකාධිකාරියෙකු (Certified Acturial Valuer) විසින් ඇස්තමේන්තු කල අතර, එම වගකීමට සරිලන ප්‍රමාණයේ භාණ්ඩාගාර බැඳුම්කරයක් වත්කමක් වශයෙන් වෙන් කරන ලදි.

### 4.9 වාහන උපයෝජනය

සමාලෝචිත වර්ෂයේදී සිදුවී ඇති සියලුම වාහන අනතුරු සඳහා අයවිය යුතු මුදල් අදාළ රක්ෂණ සමාගම් මගින් අයකරගෙන ඇත. විගණන විමසුමේ සඳහන් කරුණට හේතු වනුයේ කාලච්ඡේද වල වෙනසය. (Timing Differnce)

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ප්‍රසම්පාදන සැලැස්ම

මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ හා සියලුම ප්‍රාදේශිය කාර්යාල සවිස්තරාත්මක අධ්‍යයනයකින් පසු ඉදිරි වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරනු ලැබේ. එසේ වුවද මණ්ඩලයේ මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමේදි සාමාජික සේවා කටයුතු හා ආයෝජන වලට ප්‍රමුඛතාවය ලබාදෙන බැවින් වර්ෂයේ ඇස්තමේන්තුගත සියලුම ප්‍රසම්පාදන සඳහා අරමුදල් වියදම් කිරීමක් සිදු නොවේ. මණ්ඩලය විසින් අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙමින් ප්‍රසම්පාදන කටයුතු සිදුකරන බැවින්, සමහර ප්‍රසම්පාදන ඉදිරි වර්ෂය සඳහා විතැන්වීමක් සිදුවේ. ඒ අනුව, මෙවැනි යහපත් විචලනයකින් ගම්‍ය වනුයේ මණ්ඩලයේ යහපත් පිරිවැය පාලනයකි.

### 5.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය විසින් පහත දැක්වෙන පූර්ව විගණනයන් සිදු කරයි.

- සාමාන්‍ය ප්‍රතිලාභ මුදල් ආපසු ගෙවීම් අයදුම්පත් පරික්ෂාව.
- විශේෂ ප්‍රතිලාභ අයදුම්පත් පරික්ෂාව.

- පහවසර ශිෂ්‍යත්ව සහ උසස් පෙළ ශිෂ්‍යත්ව අයදුම්පත් පරීක්ෂාව.
- වියන නිවාස ණය සහ කාර්ය මණ්ඩල නිවාස ණය සඳහා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව වෙත අරමුදල් නිදහස් කිරීම.
- කාර්ය මණ්ඩල වෛද්‍ය බිල්පත් පරීක්ෂාව.
- වාර්ෂික ප්‍රසාද දීමනා සඳහා කාර්ය මණ්ඩල නිවාඩු පිළිබඳ පරීක්ෂාව.
- ඉතිරි වාර්ෂික නිවාඩු පිළිබඳ පරීක්ෂාව.
- සේවය අවසන් කිරීමේදී ගෙවිය යුතු මුදල් පිළිබඳ පරීක්ෂාව.

මීට අමතරව ප්‍රාදේශීය කාර්යාල විගණනය, මණ්ඩලයේ දායකත්ව සහ අධිභාර ලැබීම් පිළිබඳ පරීක්ෂාව, මුදල් පොත පිළිබඳ පරීක්ෂාව, සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීම, ආයෝජන වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය, මුදල් භෞතික පරීක්ෂාව, අවසාන ගිණුම් පිළිබඳ පරීක්ෂාව, දායක ප්‍රතිලාභ මුදල් තීරණය කිරීම, ලාභාංශ හා පොළී ගණනය, සාමාජික ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීම යනාදි විගණනයන් 2012 වර්ෂයේ සිදුකර තිබෙන අතර, සියලුම විගණන වාර්තා පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබේ.


### 5.3 අයවැය ලේඛණමය පාලනය

2012 වර්ෂයේ ප්‍රශස්ථ ආදායම් ඉපයීමේ උපක්‍රම මඟින් මණ්ඩලයේ ආදායම අයවැයගත ආදායමට වඩා 7.6% කින් වැඩිකර ගැනීමට හැකිවූ අතර, මෙහෙයුම් පිරිවැයේ විචලනය 0.6% මට්ටමක පවත්වා ගැනීමට හැකිවිය. එමෙන්ම, මණ්ඩලයේ ශුද්ධ ලාභයේ අයවැයගත විචලනය 3.9% ක වාසියක මට්ටමකින් පවත්වා ගැනිමට හැකිවිය. ඒ අනුව, මණ්ඩලය විසින් යහපත් අයවැය ලේඛණමය පාලනයක් පවත්වාගෙන ඇති බව අපගේ නිගමනයයි.

## 6. පද්ධති හා පාලන

2012 වසරේ සිට මණ්ඩලයේ ගිණුම් ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරන වාර්තාකරණ ප්‍රමිති (SLFRS) වලට අනුකූල වන පරිදි පිළියෙල කිරීමට හැකි විය.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනතට යෝජිත සංශෝධන සඳහා ජාතික කම්කරු උපදේශක සභාවේ එකඟත්වය ලැබී ඇත. ඉදිරි කටයුතු සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.




**කේ. එම්. ඒ. ගොඩවත්ත**
*සභාපති / ප්‍රධාන විධායක නිලධාරී*
*සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය*

# සංඛ්‍යාණමය ඇමුණුම්
# புள்ளிவிபர இணைப்பு
# Statistical Annexe



ප්‍රස්තාර / வரைபு / Graph - 01

## පොලී සහ ප්‍රකාශිත ලාභාංශ අනුපාත
## அறிவிக்கப்பட்ட வட்டியும் பங்கு இலாபங்களும்
## INTEREST & DIVIDENDS
## 2003 - 2012




ප්‍රස්ථාර / வரைபு / Graph - 02

**පොලී සහ ප්‍රකාශිත ලාභාංශ**

**அறிவிக்கப்பட்ட வட்டியும் பங்கு இலாபங்களும்**


**INTEREST & DIVIDENDS DECLARED**

**2003 - 2012**




Graph - 03 ප්‍රස්ථාර வரைபு

## ආදායම් හා මෙහෙයුම් වියදම් අතර සම්බන්ධතාවය
## வருமானம், நிறுவன செயற்பாட்டுச் செலவுகள்
## INCOME Vs. OPERATING EXPENSES
## 2003 - 2012




ප්‍රස්ථාර / வரைபு / Graph - 04


**දායක මුදල් උපනතිය**
**சேகரிப்புக்களின் போக்கு**
**TREND IN CONTRIBUTION COLLECTIONS**
**2003 - 2012**



ප්‍රස්ථාර / வரைபு / Graph - 05




ප්‍රස්ථාර / வரைபு / Graph - 06




ප්‍රස්ථාර / வரைபு / Graph - 07

## සාමාජික ප්‍රතිලාභ යෝජනා ක්‍රම
## நலன் தரும் திட்டங்கள் தீர்க்கப்படாத கோரல்கள்
## MEMBER BENEFIT SCHEMES
## 2008 - 2012




ප්‍රස්ථාර / வரைபு / Graph - 08



ප්‍රස්ථාර / வரைபு / Graph - 09

## රැස්කිරීම් හා සේවා යෝජක සබඳතා කොට්ඨාශයේ කාර්ය සාධනය
## சேகரிப்பு, தொழில் தருநர் உறவுகள் பகுதிகளின் செயற்பாட்டுத்திறன்
## PERFORMANCE OF COLLECTION & EMPLOYER RELATIONS DIVISION
## 2008 - 2012



ප්‍රස්ථාර / வரைபு / Graph - 10

**අධිභාර ආදායම්**
**மிகை அறவீடு வருமானம்**
**SURCHARGE INCOME**
**2003 - 2012**

